01

දෙවිනුවර භෞතික පිහිටීම සහ සමාජ ආර්ථික පසුබිම

දෙවිනුවර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය වර්ග කිලෝමීටර් 39.2 කින් (හෙක්ටයාර 3920) යුත් ප්‍රධාන වශයෙන් ම කෘෂිකාර්මික හා ධීවර පදනමකින් යුත් පැරණි නගරයකි. එය නැගෙනහිරින් **දික්වැල්ල** ප්‍රාදේශිය මහ ලේකම් බල ප්‍රදේශයෙන්ද, බටහිරින් **මාතර** හා **තිහගොඩ** ප්‍රාදේශීය මහ ලේකම් බල ප්‍රදේශයෙන්ද, දකුණු කොටස මුළුමනින්ම වෙරළ තීරයෙන්ද වෙන් වී ඇත.

අතීතයේදී **දෙවිනුවර** අයත්ව තිබුනේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ලෙස හැඳින්වූ මාතර ප්‍රාදේශිය ආදායම් නිලධාරී කොට්ඨාසයටය.

1980 දශකයේ මුල් භාගයේදී ටික කලක් මෙය **මාතර** උප දිසාපති කාර්යාලයේ උප කාර්යාලයක් වශයෙන් තිබී පසුව 1981 වසරේ **මාතර** හා **දික්වැල්ල** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල කොටස් ඒකාබද්ධ කිරීමෙන් **දෙවිනුවර** ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය නිර්මාණය කරන ලදි. 1992 වසරේ මෙය ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය බවට පත් කරමින් පරිපාලනය ගමට වඩාත් සමීප කර ඇත.

වැල්ලබඩ පත්තුව වශයෙන්ද හැඳින්වෙන දෙවිනුවර ප්‍රාදේශිය මහ ලේකම් කොට්ඨාසයට ග්‍රාම නිලධාරී වසම් 41 ක් සහ ගම්මාන 77 ක් අයත්ය.

මාතර - කතරගම ප්‍රධාන මාර්ගය **දෙවිනුවර** නගරය හරහා වැටී ඇති අතර ආසියාතික මුහුදු මාර්ගය ද දෙවුන්දර තුඩුවේ සිමාව හරහා වැටී ඇත. ඒ නිසාම ලෝකයේ විවිධ රටවල දේශ සංචාරකයන්, තාරකා ශාස්ත්‍රඥයින්, නාවිකයන්, පාලකයන් **දෙවිනුවරට** පැමිණ ඇති බව ඉතිහාසය සාක්ෂි දරයි.

දර්ශනීත්වයෙන් සලකා බලන විට ලෝකයේ හිරු උදාව හා බැසීම ඉතාමත් සුන්දර ලෙස නැරඹිය හැකි ස්ථාන දෙකෙන් එකක් වනුයේ **දෙවිනුවර** තුඩුව ආසන්න මුහුදු තීරයයි. එය ලංකාවේ අවසාන කෙළවර පමණක් නොව ලෝකයේම දකුණු කෙලවර යැයි ඇතැමුන් හඳුන්වන්නේ දක්ෂිණ ධ්‍රැවයට යන තෙක් සාගරය මිස ගොඩබිමක් හමු නොවන හෙයිනි.

බොකු, කලපු සහ තුඩු වැනි වෙරළ භූ ලක්ෂණ වලින් වර්ණවත් මුහුදු වෙරළ තීරය **වැල්ලමඩම** සිට ගන්දර තලල්ල දක්වා සැතපුම් 30 ක් පමණ දුරට විහිදෙයි. **ගන්දර** කලපුව, **තලල්ල** කලපුව, **ගන්දරාවත්ත** කලපුවද එයට අයත් වේ. බල ප්‍රදේශයට අයත් එකම වැව **නාඹටුන්න** (නා උරුවින) වැව වේ. වෙරළ තීරය මත්ස්‍ය සම්පත බහුල නොගැඹුරු මුහුදු තීරයක් වන අතර ඒ නිසා ධීවර කර්මාන්තය බහුලව සිදු කෙරේ.

පුරාණවැල්ල, දෙවිනුවර ප්‍රදේශයේ ඇති එකම ධීවර වරායයි. මෙයට අමතරව නැංගුරම් පොලවල්, ධීවර තොටුපලවල් පහක් (05) දක්නට ලැබේ. **කිරළ වැල්ල ,කයිසවැල්ල, වාව්ව, ගන්දර, නූන්න වැල්ල** හා **නාඹරුවින් වැල්ල** ඒ අතර වේ. වෙලේගොඩ, සිංහාසන පෙදෙස, දෙවිනුවර දකුණ, ප්‍රදීපාගාර පෙදෙස, වාව්ව, කපුගම නැගෙනහිර,ගන්දර බටහිර, ගන්දර මධ්‍යම, තලල්ල, ගන්දර දකුණ, ගන්දර නැගෙනහිර, තලල්ල දකුණ, නාඹටුන්න දකුණ, නාඹටුන්න මධ්‍යම, නාඹටුන්න, නාඹටුන්න උතුර, පාතෙගම උතුර යන වසම් බහුලව ධීවර කාර්මිකයින් වෙසෙන ප්‍රදේශ වේ.

භූ විෂමතා ලක්ෂණ අනුව බලන විට වෙරළ බඩ තැන්නේ සිට ක්‍රමික නැගීම කොට්ඨාසයේ උතුරු සීමාවේදී අඩි 400 ක් දක්වා උසට විහිදේ. කොට්ඨාසයේ උතුරු කොටසේ ඇති රක්ෂිත වනයෙන් ගලා බස්නා කුඩා ජලධාරා කීපයක් හැරුණු විට ප්‍රධාන වෙනත් ජල මූලාශ්‍ර මෙම කොට්ඨාශයේ දක්නට නැත.

ඇල්ලකන්ද රක්ෂිතය, කඩවැද්දූව වන රක්ෂිතය, උඩ අපරක්ක මා දොළ, ආගරවල රක්ෂිතය උතුරු ප්‍රදේශයේ දක්නට ලැබෙන අතර උඩ අපරක්ක යාය විශාල කුඹුරු ගොවිතැනින් යුත්

ප්‍රදේශයකි. මෙම ප්‍රදේශ වල විශේෂ ලක්ෂණයක් වන්නේ කුඹුරු ඉඩම් බහුල වීම සහ මදක් උස්වූ කඳු සහිත වීමය.

බැද්දේගම්මැද්ද, උඩ අපරැක්ක නැගෙනහිර, ආගරවල,උඩ අපරැක්ක, පල්ලේ අපරැක්ක, අපරැක්ක උතුර, කඩවැද්දූව නැගෙනහිර, කඩවැද්දූව බටහිර සහ වල්බුළුගහහේන උතුරු ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතර වේ.මෙම ප්‍රදේශවල 'හේන' යනුවෙන් ව්‍යවහර වන, ප්‍රදේශ දක්නට ලැබීමෙන් ඇත අතීතයේ 'හේන්' වගාවට හෝ වෙනත් කටුසර භෝග කටයුතු වලට යොදන ලද ඉඩම් තිබූ බව ගම්‍ය වේ.

දෙවිනුවර ප්‍රදේශයේ වන රක්ෂිත හෙක්ටයාර 381 ක් පමණද තෙත් බිම් හා ජලාශ හෙක්ටයාර 56 ක්ද දක්නට ලැබෙන අතර වෙරළ ප්‍රදේශය හෙක්ටයාර 21 කි.පාරිසරික සංවේදී ප්‍රදේශ හෙක්ටයාර 03 ක් පමණ වේ.

දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් දැකිය හැක්කේ මෘදු සහ තද ලැටරයිට් සහිත රතු සහ පොට්සොලික් පස්ය. රැලි සහ භූ විෂමතාවයන් සහිත ප්‍රදේශ වල මෙම පස දක්නට ඇත. මේවායේ ප්‍රධාන භෝගය ලෙස රබර්, පොල් ,කුරුඳු, කරාබු දැක්විය හැක. පොල් වගාව බහුලව ඇත්තේ මුහුදු බඩ කලාපයේය. මෙයට අමතරව කෙසෙල්, අඹ, කජු ආදී පලතුරු වගාවද පවතී. ඒවා බහුලව දක්නට ලැබෙන්නේ **දෙවිනුවර** බල ප්‍රදේශයේ උතුරු කොටසේය.

දේශගුණික ලක්ෂණ අනුව මෙම ප්‍රදේශය පහත රට තෙත් කලාපයට අයත් වේ. වාර්ෂික වර්ෂාපතනය සාමාන්‍යයෙන් අඟල් 50 -75 ක් අතර වේ. නිරිතදිග මෝසම් සුළං බලපෑම මෙම කොට්ඨාසයට අදාළ වේ. දෙවිනුවර ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය හා ධීවර කර්මාන්තයයි. කෘෂිකර්මය කරනු ලබන්නේ අහස් දියෙනි.

දෙවිනුවර ප්‍රාදේශීය මහ ලේකම් බල ප්‍රදේශයේ සමස්ත ජනගහනය 53534 ක් වන අතර පවුල් සංඛ්‍යාව 14090 කි.

වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය අක්කර 1526 කි. **දෙවිනුවර** බල ප්‍රදේශයේ ධීවර ජනගහනය 12173 කි.

සම්ප්‍රදායික කර්මාන්තයක් වශයෙන් මුහුදු වෙරළ ආශ්‍රිතව බීරළු සහ රෙන්ද ආශ්‍රිත නිෂ්පාදන දක්නට ලැබෙන අතර එහි යෙදෙන පවුල් සංඛ්‍යාව 171 කි.[1]

සංචාරක කර්මාන්තය වැඩි දියුණු කළ හැකි සිත් ගන්නා ස්ථාන සහ ඓතිහාසික ස්ථාන රාශියක් දෙවිනුවර දක්නට ඇත. ඒ අතර දෙවිනුවර ශ්‍රී උපුල්වන් විශ්ණු දේවාලය, දෙවිනුවර රජ මහ විහාරස්ථානය, ගල්ගණේ පුරාණ මහා විහාරය,ගල්ගෙය, පිංවත්ත සේපාලිකාරාමය, සිරි නිකේතාරාමය විහාරස්ථානය, ලංකා රජ මහා විහාරස්ථානය, ගන්දර පුරාණ මහා විහාරය, පවරසිරි නිවේසාරාමය, වන වාසල මහා විහාරය, තුන්බෝධි විහාරය, ප්‍රදීපාගාරය, ගල් ළිඳ, සිංහාසන කෝවිල, කහ පොකුණ, මහ වලව්ව, 103 සැතපුම් කණුව,පුරාණ වැල්ල ධීවර වරාය, කිරල වැල්ල ධීවර වරාය, හුම්මාන වෙරළ තීරයේ ඇති කොරල් පරය, තඹගල දොළ,තලල්ල වෙරළ තීරය, නාඔටුන්න දකුණ වෙරළ තීරය, සීත ගල්ල කඳු මුදුන,තලල්ල දකුණ වෙරළ තීරය, ඉදුරවත්ත රක්ෂිතය හා පීල්ල ආර, බිබුල ජල උල්පත, වෙරළ තීරයද වෙයි.

[1] සම්පත් පැතිකඩ - දෙවිනුවර ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය,2015

02

දෙවිනුවර ඉතිහාසය

දෙවිනුවර, දකුණේ පිහිටි පැරණි චිර ප්‍රසිද්ධ නගරයකි. ශ්‍රී ලංකාව ගැන සඳහන් කරන සෑම අවස්ථාවකදීම අනිවාර්යයෙන්ම දෙවිනුවර ගැනද සඳහන් වේ. එසේ වන්නේ අප රට ගැන සටහනක් කරන සෑම අවස්ථාවකදීම පාහේ දකුණේ දෙවිනුවර තුඩුවේ සිට උතුරේ පේදුරු තුඩුව දක්වා යන කියමන නිතර නිතර යෙදෙන හෙයිනි. ඒ අනුව **දෙවිනුවර** ලංකාවේ දකුණු කෙළවර වූ දකුණු තුඩුවේ පිහිටා ඇත.

ජාතික, ආගමික, සාමාජික, සංස්කෘතික හා පුරා විද්‍යාත්මක යන සෑම අංශයකින්ම දීර්ඝ මෙන්ම පෞඪ ඉතිහාසයක් ඇති **දෙවිනුවර** මෙම දිවයිනේ පමනක් නොව ලෝකයේම ප්‍රකට ඓතිහාසික නගරයකි. ඈත අතීතයේදී පවා මෙම නගරය දේශ දේශාන්තරයන්හි පතළ නගරයක් වූ බව ඓතිහාසික ලිපි ලේඛන සාක්ෂි දරයි.

කෙසේ වෙතත් **දෙවිනුවර** දේශ දේශාන්තරවල ප්‍රකට වූයේ **දෙවිනුවර ශ්‍රී උපුල්වන් විෂ්ණු** දේවාලය පිහිටුවීමෙන් පසුව බව ඓතිහාසික සංසිද්ධියකි.

මාතර නගරයේ සිට කිලෝමීටර් 4 1/2 ක් පමණ නැගෙනහිරින් පිහිටි **දෙවිනුවර** රාජධානියක් වශයෙන් සකස් වූයේ කිස්තු වර්ෂ 659 දී රජ බවට පත් **පළමුවෙනි දප්පුල (දාපුළුසෙන්)** (ක්‍රි.ව.661 - 664) රජ සමයෙහි ය. එතුමා විසින් මේ නගරය නිර්මාණය කොට ප්‍රථමවරට ලංකාරක්ෂක **උත්පලවර්ණ** දෙවියන්ගේ ප්‍රතිමාවක් කරවා මේ නගරයට **දේව නගරය** යැයි නම් කරණ ලදි.

දෙවිනුවර යන නාමය සඳහන් පැරණිම සෙල්ලිපිය **කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල** (ක්‍රි.ව.1198 - 1207) සෙල්ලිපියයි. දොළොස්වන සියවසෙහි පොළොන්නරුවේ රජ කරවූ එතුමා **කතරගම** හා **දෙවිනුවර** වන්දනා පිණිස පැමිණි බව **ගල්පොත** සෙල්ලිපියේ සඳහන් වන්නේ මෙසේය.

"මියුගුණු මහ වෙහෙර මහගම, දෙවිනුවර කැළණිය ආදී වූ ....."[2] එසේම එම රජුගේ **ගල්පොත** ගල් සන්නසෙහි "මේ නියම්ගම් පටුන්ගම් රාජධානිද **දෙවිනුවර**, කැළණි, දඹුලු , අනුරාධපුර නුවර ඇතුළු වූ"[3] යනුවෙන් සඳහන් වෙයි. එයින් පෙනීයන්නේ **දෙවිනුවර** යන නාමය **පොළොන්නරු** යුගයටත් පෙර පැවති බවය.

දෙවිනුවර ඉතිහාසය **දේවානම්පියතිස්ස** (ක්‍රි.පූ. 307-267) රාජ්‍ය යුගය දක්වා විහිදී ඇති බවද ප්‍රකටය. **සඟමිත්** මහරහත් මෙහෙණින් වහන්සේ ලක්දිව ශ්‍රී මහා බෝධි ශාඛාවක් ලක්දිවට වැඩමවා **අනුරපුර මහමෙව්නා** රාජකීය උයනේ රෝපණය කළ බව අපේ වංශ කථාව පවසයි[4] මෙයින් හටගත් අෂ්ඨඵල රුහ බෝධි වලට (08) අනතුරුව දෙවන වර හටගත් දෙසිත්ඵල රුහ (32) බෝ අංකුර බුදු සමය පැතිර ගිය ප්‍රදේශයන්හි රෝපණය කළ බව **බෝධිවංශය** වැනි සාහිත්‍ය කෘතීන්ගෙන් හෙළිවෙයි.[5]

දකුණු ලක **කතරගම, සඳුන්ගම, වන වාසය** හා **අග්බෝ වෙහෙර** යන ස්ථානයන්හි දෙවන පැතිස් රජතුමාගේ නියමයෙන් මෙම බෝ අංකුර රෝපණය කර ඇත. මෙයින් **දෙවිනුවර** නැගෙනහිර දිසාවේ වන වාසයෙහි රෝපණය කරන ලද සිරිමා බෝ රදුන්ගේ ශාඛාව අදත් දක්නට ලැබෙන බව පැවසේ. **වාච්ච** ප්‍රදේශයේ පිහිටි වන වාසල පුරාණ විහාරස්ථානය අද **වන වාසල** රජ මහා විහාරස්ථානය නමින් හැඳින්වෙන අතර දෙසිත්ඵල රුහ බෝධිය එය බව පැවසේ.

---

[2] Epigraphia Zeylanica - ගල්පොත සෙල්ලිපිය

[3] Epigraphia Zeylanica - ගල්පොත ගල් සන්නස

[4] මහා වංශය

[5] බෝධිවංශය

ක්‍රි.ව. 146 දී පමණ **ඊජිප්තුවේ පැලිසියුම්හි** විසූ තාරකා විද්‍යාඥයෙකු වූ **ක්ලැයුසියස් ටොලමි** පඩිවරයා මේ නගරය **දගන** (**Danagana**) යන නාමයෙන් හඳුන්වා ඇත[6].

නාම ප්‍රභවය -

ක්‍රි.ව. 8 - 9 සියවස් වල මේ නගරයට **ගිරියල** යනුවෙන් ව්‍යවහාරය කළ බව **මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය** ග්‍රන්ථයේ ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** හිමියෝ සඳහන් කරයි[7]. **දෙවිනුවර පරම විචිත්‍රාරාමයෙහි** පැරණි බෝධිය අසල බෝහෝදුරට ගෙවීගිය සෙල් ලිපියක් ඇත. මෙහි රුහුණ පාලනය කළ **කිතග්ග බෝධි ඇපාණන්** විසින් ගිරියළ **කිහිරැළි** පිරිවෙනට පුද කළ ගම්වර කිහිපයක නම් දක්නට ලැබේ. මේ **දෙවෙනි දප්පුල** රජ දවස (ක්‍රි.ව.807-823) විසූ **කිතග්ග බෝධි ඇපාණන්ය.**

එකළ **දෙවිනුවර, ගිරියල** නමින්ද ව්‍යවහාර වන්නට ඇත. එහෙත් එය **ගිරිහෙළ** යන්නෙහි විකෘතියක්ද **ගිරිකල** යන්නෙහි විකෘතියක්දැයි ඉඳුරා කිව නොහැක. **දෙවිනුවරට ගිරිහෙළපුර** යැයි ව්‍යවහරවූ බව පසුකලෙක ලියවුණු සන්දේශ කෘතීන්ගෙන් පෙනීයයි.

"කිහිරැළි උපුල්වන් දෙව් රජු නි ගිරිහෙළ පුර
මුණිඳුන් වදන් මුදුනින් ගත් සුරිඳු සඳ
නිරිඳුන් ලක රකිනුව බුදු සසුන් සොඳ
වරදුන් බැවි නොබට - කියනුව සුදුසු තෙපුලක"[8]

".....ගිරිහෙළ වෙහෙර කරවා **උපුල්වන්** දෙවි රජාන පිහිටවූ දාපුළුසෙන් රජය.....[9] " මේ නිදර්ශනයන්ගෙන් එය ඔප්පු වේ.

දෙවුන්දර නගරයට අයත් සුදුගල නමින් ප්‍රදේශයක් අදත් ඇත. ඒ **මාතර - කතරගම** මාර්ගයේ 104 වැනි සැතපුම් කණුව අසලය. අතීතයෙහි මෙම ස්ථානයෙහි තිබූ සුදුගල තමා කුඩා කාලයේ දුටු බව **දෙවුන්දර ඉතිහාස** ග්‍රන්ථයේ ගන්දර පී.ඩී.එස්. වීරසූරිය මහතා සඳහන් කරයි[10] .

සුදු යනු **හෙළ** යන තේරුමය. **ගල** යනු **ගිරි** යන අර්ථයයි.ඒ අනුව **සුදු ගල** යනු **හෙළ ගිරි** යන තේරුම බව අපි දනිමු. **හෙළ ගිරි** යනු පද පෙරැළි විසින් **ගිරිහෙළ** වී, හෙළ ගිරින් ගැවසි පුරවරය **ගිරිහෙළ පුර** නමින් ප්‍රකට විය.

ලංකාවේ බොහෝ ප්‍රතිමා නිර්මාණය කොට ඇත්තේ මෙම සුදුගලෙනි. **දෙවිනුවර** විහාර භූමියේ මේ සුදුගලෙන් නෙලූ නටඩුන් වූ පිළිමයක් දක්නට ලැබේ. මාතර රාහුල පාරේ ඇලවේල්ල හන්දියේ පස් යට තිබී අත් සිදී ගිය සුදුගල් බුදු පිළිමයක් කළකට පෙර පුරා විද්‍යාඥයන්හට ලැබුණි. එය දැනට මාතර තාරකා කොටුවේ පුරා විද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. සුප්‍රකට **දෙවිනුවර** ප්‍රදීපාගාරය (Light House) තනා ඇත්තේ ද මෙම සුදුගලෙනි.

මේ පිළිබඳව තවත් මතයක් වෙයි. **ගිරි** යනු ගලය. **හෙළ** යනු කන්දකට උස් භූමියකට කියන නමකි. මේනයින් සලකන විට ගල් සහිත උස්බිම් ප්‍රදේශයක් වූ හෙයින් **ගිරිහෙළ පුර** වී යැයි ද සිතිය හැකිය.

දෙවිනුවර භූමිය - දේශය කෙළවර සමුද්‍රාසන්නයෙහි ගලක් හෙවත් ගල් සහිත උස් භූමියක් වූ මෙය දේශ තුඩුවකි. මේ භූමිය - හෙළ, ගිරිය - ගල මූදට සේදීමෙන් හෝ භූමි කම්පනයකින් හෝ මූදු බත් වීමෙන් හෝ ගිලෙන්නට ඇත. ශේෂය - කෙළවර - කොණ - තුඩුව නමිනි බැවහර වන්නේ.

---

[6] Plolomy descrided it as Dagana to the moon (Tennent History VQL ii Part VII P' 113)

[7] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි- (95 පිටුව) -1994

[8] පරෙවි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි - 201 කවිය, දස පද හෑල්ල - ගුනවර්දන සංස්කරණය -2012

[9] කඩයිම් පොත - දිගනේ බුද්ධරක්ඛිත හිමි

[10] දෙවුන්දර ඉතිහාසය - ගන්දර පී.ඩී.එස්. වීරසූරිය, 33 පිටුව - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ - 1949

දෙවුන්දර තුඩුව දේශ දේශාන්තරවල පවා ප්‍රකටය. යුරෝපීය ජාතීන්ගේ සිතියම් වල **දෙවුන්දර** හඳුන්වා ඇත්තේ **දෙවුන්දර තුඩුව** (Dondra Head) යන නමිනි.

ගිරිකල යන්නෙන් **ගිරියල** යන නාමය ප්‍රභවය වීම වඩාත් පහසු බව සඳහන් කරන ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමියෝ ගිරිකල යන්නෙහි තේරුම සුදුකාන්තාව බවද සඳහන් කරයි[11]. ආචාර්ය **සෙනරත් පරණවිතාන** මහතා දක්වන පරිදි **උත්පලවර්ණ** යනු වේද දෙවියකු වූ **වරුණ** යැයි එතුමා විසින් ලියන ලද **උපුල්වන්** නම් කෘතියෙහි විස්තර කර තිබේ.[12] වරුණගේ භාර්යාව **මහාභාරතයේ** එන පරිදි ගෞරිය. එහි තේරුමද සුදු කත යන්නය. පසු කලෙක ලියූ සන්දේශ කෘතිවල **දෙවිනුවර** දෙවියාගේ බිරිඳ **සඳවන්** බිසෝ යැයි කියා තිබේ. සඳවන් යනු **චන්ද්‍රවතී** යන්නෙහි පරිවර්තනයකි. සඳ, ධවල (සුදු) වර්ණය. **කිතග්ග බෝධි** ලිපියෙහි එහි විහාරය නම් කර ඇත්තේ **කිහිරැළි** පිරිවෙන කියාය. මෙහි කිහිරැළි යන්නද උත්පලවර්ණට විශේෂ වූ පදයකි. එබැවින් ගිරිකතගේ නගරය නම් කළ අතර පිරිවෙණ දෙවියන්ගේ නාමය වන කිහිරැළි නාමයෙන් ව්‍යවහාර කළ බව කිව හැකිය.

උපුල්වන් දෙවියන් කිහිරිකඳට ආරැඬ වී පාවී එන්නේ යැයි ඇසූ **දප්පුල** රජතුමා සහ පිරිවරින් ගොස් ගෞරවාන්විතව මහ පෙරහැරින් වඩමවා ගෙනවිත් **උපුල්වන්** දෙවියෝද, **සඳවතී** නම් භාර්යාවගේද පුත්‍ර **ධනුද්ධර** ගේද පිළිම කරවා **දෙවිනුවර** තැන්පත් කළ බවද ජනප්‍රවාදයෙහි සඳහන් වෙයි.

උපුල්වන් දෙවිරජාණන් ගොඩ බැසීමෙන් පසු **ගිරිහෙළ පුර,** දෙව් රජුගේ නිත්‍ය වාසස්ථානය වූ බැවින් එතැන් සිට දේවේන්ද්‍ර > දේවේන්දර > දෙවෙන්දර > දෙවුන්දර නමින් මෙම නගරය ප්‍රකට විය.

ඈත අතීතයේ සිට ලංකාවට ද්‍රවිඩ ආක්‍රමණ සිදුවූ අතර දීර්ඝ කාළයක් වරින් වර ද්‍රවිඩ බලයද මේ රටේ පැතිර පැවතුන බවද රහසක් නොවේ. එම කාලවල මේ රටේ හින්දු භක්තිය සහ පල්ලව ගෘහ නිර්මාණ කලාවද ජනප්‍රිය විය. ඒ අනුව ඔවුන් විසින් මේ නගරය **තෙයිවන් තුරෙයි** යනුවෙන් භාවිතා කර ඇත. එහි අර්ථය දෙවියන් ගොඩබට තොට යන්නය. **තෙයිවාන් තුරයි** > **තෙවුන්තර** > **දෙවුන්දර** වන්නට ඇත. දෙවියන්ගේ වාස භවනය වන **තෙයිවාන් උරෙ** යන තේරුමෙන් යුත් දමිළ ව්‍යවහාරයෙන් **දෙවුන්දර** වන්නට ඇතැයි ද සිතිය හැක.

තවත් සමහරු පවසන්නේ දවිහිත්ත තීථී > දෙබුන්දර > දෙවුන්දර වූ බවය. දෙවුන්දොර > දෙවුන්දර වී යැයි ඇතැමෙකු පවසති. ධෝවන දොර > දෙවුන්දර > දෙවුන්දර වී යැයි ද තවත් මතයකි.

මහානාම හිමියන් **මහාවංශය** ලියුවේ **මහසෙන්** රජ දවසය. (ක්‍රි.ව. 276 - 302) උන්වහන්සේ **දෙවුන්දර,** දෙවියන්ගේ නගරය බැවින් **දේව නගර** යනුවෙන් පාලියට නැගූහ. ඉන්පසු සිදුවූයේ පසු කලෙක මෙහි මුල් නාමය නොසලකා පාලි ව්‍යවහාරයවූ **දේව නගර** යන්න **දෙවිනුවර** යැයි සිංහලයට භාවිතා කිරීමය.මෙය රටේ ප්‍රචලිත වූ සියළු ලිපි ලේඛන වල සහ ගද්‍ය පද්‍ය ග්‍රන්ථවලද භාවිතා විය. ඒ අනුව **දෙවුන්දර** යන මුල් ව්‍යවහාරය භාවිතයෙන් ඈත් විය.

ශිලා ලේඛන, ගද්‍ය ග්‍රන්ථ සහ පද්‍ය ග්‍රන්ථ වල **දෙවිනුවර** යනුවෙන් සඳහන් වී ඇත. විශේෂයෙන්ම **Epigraphia Zeylanica එපිග්‍රැෆියා සෙලියනිකා** යන ලංකා ශිලා ලේඛන සංග්‍රහයේ එන **නිශ්ශංකමල්ල** රජුගේ **ගල්පොත** සන්නසෙහි,

" ..... මියුගුණ මහ වෙහෙර, මහගම දෙවිනුවර කැළණිය ආදී වූ...."

එහිම එම රජුගේ නූන ගල්පොත්ත ගල් සන්නසෙහි,

".... ගම් නියම්ගම් පටුන් ගම් රාජධානියද දෙවිනුවර කැළණි දඹුලු අනුරාධපුර..."

දෙවිනුවර අංක 2 ශිලා ලේඛනයේ 12 වැනි පෙළ,

---

[11] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි - 1994

[12] Upulvan – Dr.Senerath Paranavithana

"....දෙවිනුවර නගරිස...."

රුහුණු කතරගම මහා දේවාලයේ සන්නස,

"....දෙවිනුවර ..... ඔහුගේ ....."

මහාවංශයෙහි, "....ඉක්බිති මේතෙමේ **දෙවිනුවරට** ගොස් උත්පලවර්ණ දිව්‍ය රාජයා"[13] යනුවෙන්ද **රාජාවලියෙහි** "..... **දෙවිනුවර** කරවා දෙවි රජුගේ...."[14] **නිකාය සංග්‍රහයෙහි** "..... **දෙවිනුවර** තුන්මහල් සිටි පිළිම"[15] **කඩයිම් පොතෙහි** "..... කඩරටය ඇඩලවය නම් රටය...මාතොට **දෙවුනුවරය** යන මේ රුහුණු රට බද මෙකී රටවල් තුදුස හා....."[16] නම් පොතෙහි " .... තඹ ගමුව,මුල්ගිරිය,ඩවාගිරි විහාරය, **දෙවිනුවර** දිව්‍ය රාජ භවනය,ඔත් පිළිම ගෙය, සිටි පිළිම ගෙය"[17] **දෙවිනුවරෙහි** දිව්‍ය රාජභවනය[18] යනුවෙන්ද,

රාජ රත්නාකරයෙහි "....පැසුළු සිරිසඟබෝ රජ පියගල් වෙහෙර ආදී විහාර කරවා **දෙවිනුවර** දෙවි රජුන්....."[19] යනුවෙන්ද

අලුත් නුවර දේවාලය පිහිටුවීම පිළිබඳ පැරණි ලිපියෙහි "....පවත්නා ලබයි **දෙවුනුවර** ගමන් කැරවු තැන..... **දෙවුනුවරින්** ගෙනා රන් ආයුධත්....."[20] යනුවෙන්ද

පූජාවලියෙහි "....ඔහු බෑ සිරිසඟබෝ රජ ..... **දෙවුනුවර** කරවා"[21] යනුවෙනුත් එහිම " .....මහලෑපාණෝ පාර දෙසට ගොස් කාවට්ටි රටින් බලසෙන් ගෙනවුත්....**දෙවිනුවර** කරවා.... රාජ්‍යය කළේය...."[22] යනුවෙන්ද **දෙවිනුවර** ගැන සඳහන් වේ.

මයුරපාද පරිවේනාධිපති හිමියන් රචිත **මයුර** සන්දේශයෙහි **දෙවිනුවර** ගැන සඳහන් වන්නේ මේ ආකාරයෙනි.

සව් දිග බිත කිරණෙව් යස	උදුල් වන
සැව් බල පෑ එදිනහි බුදු	මඟුල් වන
දෙව් නුවරෙහි දෙවි රජ හට	උපුල් වන
දෙව් මෙහසුන් මතු සව්සිරි	විපුල් වන[23]

දෙවිනුවර ගලතුරු මුල පාය පිරිවෙනහි හිමියන් විසින් රචිත සන්දේශ කෘතිය **තිසර** සන්දේශයයි. **තිසරයෙහි දෙවිනුවර** ගැන සඳහන් වන්නේ මෙසේය.

බැඳි මිණි කිකිණි දැල් මුතුලැල් පා	රැසිනි
රැඳි රන් රුවන් සල්පිල් කෙළි තුරු	ගොසිනි
ඉදි ගුණ නුවණ කුලඟන සුදනන්	විසිනි
සැදි දෙවිනුවර සිරිසර බල	සහතොසින[24]

---

[13] මහාවංශය - 83 පරිච්ඡේදය

[14] රාජාවලිය - 55 පිටුව

[15] නිකාය සංග්‍රහය - 22 පිටුව

[16] කඩයිම් පොත

[17] නම්පොත

[18] Dewnuwarehi Diwyaraja Bhawanaya ^Dondra Temple& Glossary 11.6 1869 P.12

[19] රාජ රත්නාකරය

[20] අලුත් නුවර දේවාලය පිහිටුවීම පිළිබඳ පැරණි ලිපිය

[21] පූජාවලිය 686 පිටුව

[22] පූජාවලිය 687 පිටුව

[23] මයුර සන්දේශය - වී.වී.එස්.ගුණවර්ධන සංස්කරණය - 4 කවිය. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,2012

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් රචිත **පරෙවි** සන්දේශයේ ඒ හිමියන් **දෙවිනුවර** දකින්නේ දෙව්පුරයක් ලෙසිනි.

නුදුරුව නුබට සිටි වහසල් බිහිදොරිනි
අඳුරුව නොදිසි සුර රද පහමිණි රැසිනි
සොඳුරුව සැදුණු එනුවර **දෙව්පුර** නමිනි
අඳුරුව වනත අනතය දහසක් වතින[25]

දෙවිනුවර තිලක පරිවේණාධිපති හිමියන් රචිත **කෝකිළ** සන්දේශයේ දෙවිනුවර මෙසේ දක්වයි.

ගිරි රද අයුරු පානත් පෑය වීදිය
පිරි මිණි පබල තුල් සල් දෙපස වීදිය
සිරි කර සතත ගෙවුයන් කුසුම වීදිය
සිරි **දෙවිනුවර** බලතුරු නිනද වීදිය[26]

පැරකුම්බා සිරිත කෘතියෙහි දෙවිනුවර ගැන මෙසේ පවසයි.

ඉමල් හල මුනි ලෙසින් වදහළ මෙලක රකිනුව
මෙත් සිතින්
උපුල්වන් දෙව් රජුන් පිළිරුව වඩිනු දැක
මහ සයුරකින්
විමල් ගුණ යුත් නමින් දාපුළුසෙන් රජෙක්
ආ එ මොහොතින්
විපුල් සිරි **දෙවිනුවර** කරවා පිහිට කරවිය
යහපතින්[27]

සමරජීව පත්තායමේ ලේකම් විසින් රචිත **කවිමිණ කොඩෝලෙහි දෙවිනුවර** ගැන මෙසේ සඳහන් කරයි

දෙවිනුවරෙහි පොරණ
දෙවොල කරවූ නාරණ
දාපුළුසෙන් නරණ
සරණ සෙවණෙහි වැඩුණු පූරණ[28]

---

[24] තිසර සන්දේශය - මහාචාර්ය ඒ.වී.සුරවීර සංස්කරණය -10 කවිය එස්.ගොඩගේ සහ සහෝදරයෝ ,1991

[25] පරෙවි සන්දේශය - වී.ඩී. ද එස් ගුණවර්ධන සංස්කරණය - 165 කවිය එස්.ගොඩගේ සහ සහෝදරයෝ ,2012

[26] කෝකිල සන්දේශය - වී.ඩී. ද එස් ගුණවර්ධන සංස්කරණය - 11 කවිය එස්.ගොඩගේ සහ සහෝදරයෝ ,2009

[27] පැරකුම්බා සිරිත

[28] කවිමිණි කොඩොල - සමරජීව පත්තායගේ ලේකම්

තෙනවර, තෙනවරෙ" තෙනුවර,තෙනවරම්,තෙනවාර යන නම් වලින්ද මෙම නගරය හැඳින් වූ බව විවිධ සන්නස්, ශිලා ලේඛන සහ ග්‍රන්ථ වල දැක්වේ. ඒ අතර හිත්තටිය ගම දෙවිනුවර දේවාලයට පූජා කළ දෙවිනුවර තඹ සන්නස[29], මාකාවිට සන්නස[30], කුඩු මිරිස විහාරයේ ශිලා ලේඛනය[31], ලංකාවේ වාසනාවන්ත දෑ අවුරුද්දක්[32], ටැනට් ඉතිහාසය[33], රුබෙරු ඉතිහාසය[34] හා ගාල්ලේ ත්‍රී භාෂාමය ලිපියද[35] දැක්විය හැකිය.

තෙනවර යන නම අදත් මෙම ප්‍රදේශයේ භාවිතයේ පවති. තෙනවරෙ යන්න මදක් වෙනස් වී තේනුවර යන වාසගම යොදා ගන්නා විශාල පිරිසක් දෙවිනුවරින් බිහිව ඇත.

සිංහල වචන කටට නුහුරු පෘතුගීසීහු දෙවුන්දර යන්න **"ඩොන්ඩර"** යනුවෙන් උච්චාරණය කරණ ලද අතර **Dondura** යනුවෙන් ලිපි ලේඛනවල භාවිතා කළහ. ඉන්පසු මුහුදුබඩ පළාත් අල්ලාගත් ලන්දේසීන් මෙන්ම ඉංග්‍රීසීන්ද **ඩොන්ඩර - ඩොන්ඩ්‍රා** යනුවෙන් උසුරුවන්නටත් Dondra යනුවෙන් ලියන්නටත් පටන් ගෙන ඇත.

දෙවුන්දර යන්න පෘතුගීසීන්,ලන්දේසීන් මෙන්ම ඉංග්‍රීසීන්ද ඩොන්ඩ්‍රා - **Dondra** යනුවෙන් වැරදියට උච්චාරණය කරන්නටත් ලිපි ලේඛන වල සටහන් කරන්නටත් ඇත. එහෙත් එයින් ප්‍රභවය වූ **ඩොන්ඩ්‍රා - දේවේන්ද්‍ර** යනුවෙන් වාසගමක් සහිත පරපුරක් දෙවිනුවර සහ ඒ අවටින් බිහිව ඇත. මහනුවර දළදා මාළිගාවේ **පත්තිරිප්පුව** නිර්මාණය කළ **දේවේන්ද්‍ර** මූලාචාරියා මේ පරපුරේ විශිෂ්ඨයෙකි.

---

29 " .....වෙද එයාසකරුන් මෙකු පුත් තේනුවරජපෙරුමාල්...."

30 මාතර මාකාවට මාලිගාතැන්නේ තිබී සොයා ගත් ගල් සන්නසෙහි "....තෙනවර නයනර්....."

31 ".....තෙනුවර පෙරුනමින්....."

32 "Two Thousand Year ago this Southern most Point of the Island was a place of exceeding sancity known as Devinuwara - the city of Gold also called Tanawaram" (Two happy years in Ceylon - by C.E. Gorden –coming)

33 "…… And utterly destroyed the great temple of Tanawaram or Dondra" (Tennent History VOL II part VI p 20)

34 "Alention the pagoda of tanawar as in the kingdom…"(Pieris Ribeiro ceilao p 4)

35 තෙනවර 3,9,11,23 පේළි (දෙමළ)

03.

සෙල්ලිපි වලින් මතු කෙරෙන දෙවිනුවර අතීත තොරතුරු

දෙවිනුවර පිළිබඳ ලියවුනු සෙල්ලිපි, සන්නස්, තුඩපත් බොහොමයකින් කියැවෙන්නේ **දෙවුන්දර** දේවාලයට හා රජමහා විහාරස්ථානයට රාජ රාජ මහාමත්‍යාදීන් සිදු කරන ලද පුද පූජා, සත්කාර, සම්මාන පිළිබඳ තොරතුරුය.

දෙවිනුවර හා අවටින් **නායිම්මින්** (නාවිමනෙන්) හා **ගාල්ලෙන් ද දෙවිනුවර** පිළිබඳ සෙල්ලිපි කීපයක් හා තඹ සන්නස්ද සොයා ගෙන ඇත. මෙම සෙල් ලිපි හා සන්නස් අතර **කිතත්ගබෝධි** සන්නස, නායිමන ද්විභාෂා ලිපිය,පැරණි රාජ නීති සංග්‍රහය, **ගාල්ලේ** ත්‍රිභාෂා ලිපිය,VI වැනි **පරාක්‍රමබාහු** ලිපිය හා **VII විජයබාහු** සන්නසද වේ.

මෙයට අමතරව **දෙවිනුවර** පිළිබඳව **පොළොන්නරුවේ** ගල්පොත සෙල්ලිපිය[36] එහිම ගල් ලිඳක වූ සෙල්ලිපිය[37], පොළොන්නරුවේ රන් කොත් දාගැබ අසල සෙල් ටැම් ලිපිය[38], දඹුලුගල සෙල්ලිපිය[39] ආදියෙහි **දෙවිනුවර** ගැන සඳහන් වන අතර කුඩු මිරිස විහාර ශිලා ලේඛනයේ තෙවරප්පෙරුමාලුන් ගැන සඳහන් වේ.

දෙවිනුවර සහ ඒ අවට පිලිබඳව විශේෂයෙන්ම දේවාලය හා රජමහ විහාරය පිළිබඳ තොරතුරු ඇතුලත් සෙල්ලිපි රාශියක් තිබෙන්නට ඇත. එහෙත් පෘතුගීසීන්ගේ හා ලන්දේසීන්ගේ සංහාර වලින් පසුව බොහෝ සෙල්ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි රාශියක් විනාශ වන්නට ඇත. දැනට මහ දේවාල භූමියෙහි ඇති සෙල් පුවරු ලිපිය කෙසේවත් කියවන්නට නොහැකි තත්වයක පවතී. ඇතැම් විට මෙය කියවීමට හැකි වූවා නම් දෙවිනුවර ඉතිහාසය දැනට වඩා වෙනත් මානයක් කරා ගමන් කරනු ඇත.

කිතග්ග බෝධි සන්නස

දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහා විහාරස්ථානයේ බෝධිය අසලින් 1947 දී ආචාර්ය **චාල්ස් ගොඩකුඹුරේ** මහතා විසින් සොයා ගත් මෙම ශිලා ලිපියේ භාගයක් පොලවට වැළලී තිබී ඇත. **දෙවිනුවරින්** ලැබී ඇති පැරණිම සෙල්ලිපිය මෙයයි. පොළවෙන් අඩි 03 අඟල් 08 ක් උසට ඇති මෙම ලිපිය ලියා ඇති කොටස අගල් 15 ක් උසට අඟල් 07 ක් පළලට සීමා වී ඇත.

මෙම සන්නස පිහිටුවා ඇත්තේ **දෙවෙනි දප්පුල** රජ දවස (ක්‍රි.ව. 807-823) විසූ **කිතග්ගබෝධි** ඈපාණන් විය යුතු බව ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** හිමියෝ පවසති[40].

පළමුවෙනි හා දෙවෙනි පැති වල සන්නස ලියා ඇති අතර තුන්වෙනි පැත්තෙහි කපුටෙක්,බල්ලෙක් යන සතුන්ගේ රූප කොටා ඇත. එසේම වටාපතක් යැයි සැලකිය හැකි සංකේතයක්ද වෙයි. සිව්වෙනි පැත්තෙහි කැදැත්තෙකුගේ වැනි ලක්ෂණ ඇත. **කිතග්ගබෝධි ඈපාණන්** විසින් **ගිරියල කිහිරළි** පිරිවෙනට කරණ ලද පූජාවක් ගැන සඳහන් වේ.

මෙම සෙල් ලිපියේ **දෙවිනුවර** සඳහන් කර ඇත්තේ **ගිරියල** යන නමිනි. **කිතග්ග බෝධි** සන්නස සම්පූර්ණයෙන්ම මෙසේය.

---

[36] Epigraphia Zeylanica Vol II - part 3

[37] Epigraphia Zeylanica Vol II - part 3

[38] Epigraphia Zeylanica Vol II - part 3

[39] Epigraphia Zeylanica Vol I - part 4

[40] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි - 95 පිටුව,1994

"ඒ පැත්ත"	**"බී පැත්ත"**
1.ශ්‍රී	1.මෙගම කු
2.ආපා කිතක් බො	2.ඩින් කළ ප
3. යා නු වජනින්	3. ස් මහදා
4. ගිරිය (ළකි) කිහිරැළි	4. සින් ඒ
5. පි (රි) වනට (බහා) ලු	5. ක් වරදක්
6. සල් කෙයල් මා	6. හැර
7. ගුල උඩමහරොජ	7. සඟුන්
8. (මහවෙ) ළ පණ (ව) ර ආ	8. සදහයන්
9. වු තැනැරද් (කො) ල්	9.හින්ද (සා)
10.(සම්) දරුවන් නොවද	10.හා සතු
11.නා (කො) ට (අත්තානි)	11.දඩක් ගනු
12.කණු පැරැහැර්	12.ඉසා
13. හින්ද (වනලදි)[41]	

මාගල උඩමහ ගමුවට අයත් වෙළක් පූජා කළ බව මෙහි සඳහන් වේ.[42]

ගාල්ලේ ත්‍රී භාෂා ලිපිය[43]

මෙම ලිපිය **ගාල්ලේ** තිබී සොයා ගන්නා ලද නමුත් එය **දෙවිනුවරට** සම්බන්ධ වූවකි. මෙම ලිපිය ගාල්ලේ පිහිටුවන ලද්දේ **දෙවිනුවර** දේවාලයට පැමිණි චීන රජුගේ දූත පිරිස **ගාල්ල** වරායෙන් පැමිණි බැවිනි. **දෙවිනුවර** දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම සඳහා එවකට **චීනයේ** රජ කළ **යුංලෝ** රජතුමා තම රාජ්‍ය පද ප්‍රාප්තියෙන් වසර හතරකට පසු එනම් ක්‍රි.ව. 1410 දී මෙම පුද පඬුරු එවා ඇත. මෙම පුද පඬුරු එවා ඇත්තේ චිං වෝ උචිං චූ චිං රාජ දූතයා අතය.

මෙම ලිපියෙන් ඉතා වැදගත් කරුණු රාශියක් අනාවරණය වෙයි. එනම් **දෙවිනුවර උපුල්වන් දේවාලය** විදේශිකයින් අතරද ඉමහත් භක්තියට හා ගෞරව බහුමානයට පත්වූ දේවාලයක් වන අතර එය විෂ්ණු දෙවියන්ගේ නොව උපුල්වන් දෙවියන්ගේ දේවාලයක් බවට කදිම ජීවමාන සාක්ෂියකි.

මෙම ලිපියෙහි **ඉලංගයේ තෙනවරෙ නායනාර්** දෙවියන්ගේ තෙදබල අසා පැමිණි බව සඳහන් වේ. **ඉලංගයේ තෙනවරෙ** යනු ලංකාවේ **දෙවිනුවර** දෙවියන්ගේ යන තේරුම දෙයි.

චීන, ද්‍රවිඩ, පාර්සි යන භාෂාත්‍රයෙන්ම ලියන ලද සෙල්ලිපිය දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත. මෙය **ගාල්ලේ** පිහිටු වීමට හේතුව වී ඇත්තේ චීන රාජ දූතයා **ගාල්ල** වරායෙන් ගොඩ බැසීම විය යුතුය.

---

[41] The Shrine of Upolvan at Devundara By Dr. S. Parnavitana (1953)

[42] මෙම ගම කුමක්දැයි විමසිය යුතුය.

[43] Epigraphica Zeylanica vol III No.36 S.Paranavithana

දෙවිනුවර දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම පිණිස චීන රජතුමා විසින් එවන ලද පුද පඬුරු ලේඛනයක්ද මෙහි ඇතුලත්ය. චීනයේ ජනප්‍රියව ඇත්තේ **නාථ** දෙවියන් බවත් **දෙවිනුවර** දෙවියන්ද **නාථ** දෙවියන් යන හැඟීමෙන් මෙසේ පැමිණි ඇති බව **ආචාර්ය කඹුරුපිටියේ වනරතන** හිමියෝ පවසති.[44] මෙයින් ප්‍රකාශ වන්නේ **දෙවිනුවර** දෙවියන්ගේ තෙදබල හා හාස්කම් චීනයේද පැතිර ඇති බවය. පේළි 24 කින් යුත් සෙල්ලිපියේ සිංහල අනුවාදය මෙසේය.

"ස්වසති ..... රාජ පරමේශ්වර පූර්ණ චන්ද්‍රයාමාන චීනයේ මහ රජ්ජුරුවෝ ලංකා රාජ්‍යයෙහි දෙවුන්දර දෙවියන්ට එකී දෙවියන්ගේ කීර්තිය අසා චිං වෝ චුයිං නම් දූතයන් අත දෙවුන්දර දෙවියන්ගේ සම්මුතියට මේ පඬුරු එවූහ. මේ ලෝකයේ වූ සියලු ජාතීහු දෙවුන්දර දෙවි රජාණන්ගේ අනුග්‍රහය කරණ කොට ගෙන සුවසේ පරිපාලනය වී සිටිති. ඔබ්බටද එසේම ශාන්ත පරිපාලනයෙහි සිටිති. තෙනවර නායනාර් නමින් සඳහන් කළ දෙවුන්දරට අයිති වූ දෙවියනට පඬුරු විසින් බඳින ලද්ද මුළුමනින්ම මෙසේයි.

රන් රිදී වැඩ කළ තුර්කි පටපිළි, සඳුන් තෙල් කෙණ්ඩි, රන් කලන් 1000 යි, නානා වර්ණ තුර්කි පට පිළි 50 යි, අනේක වර්ණ පට්ට වස්ත්‍ර 50 යි, ස්වර්ණ චිත්‍ර මණි ධවජ ජෝඩු 04 යි, රක්ත වර්ණ ධවජ ජෝඩු 02 යි,පලස් ජෝඩු 02 යි, දුම් දෙන තඹ පාත්‍ර 05 යි, කලු කනප්පු 02 යි, ස්වර්ණා ලේප කළ දාරුමය නෙළුම් මල් ජෝඩු 06 යි, අඟිල් දුම් දෙන ස්වර්ණාලේප කළ තඹ පාත්‍ර 05 යි, ඉටිපන්දම් ජෝඩු 10යි, තෙල් සේරු 2500 යි, සඳුන් අරටු කැබලි 10 යි, මේ සියල්ලම දෙවුන්දර දෙවියනට පුද පඬුරු පිනිසය.

පැරණි රාජනීති සංග්‍රහයක් - දේව ප්‍රතිරාජ ලිපිය

ක්‍රි.ව. 1236 දී දඹදෙණියෙහි රජ බවට පත් II වැනි පැරකුම්බා (ක්‍රි.ව. 1236-1285) රජුගේ නියමයෙන් දේව ප්‍රතිරාජ ඇමතිවරයා විසින් දිවයිනේ බොහොමයක් ස්ථානවල විශේෂයෙන්ම රුහුණේ කරවන ලද සංවර්ධන වැඩ ගැන රජුගේ නියමයෙන් මෙවන් සෙල්ලිපි පිහිටුවා ඇත.

වර්තමාන මහ දේවාලය ඉදිරිපිට සවි කර ඇති මෙම ලිපිය ඓතිහාසික අතින් ඉතා වැදගත් ලිපියකි. ක්‍රි.ව.1914 දී **අයර්ටන්** මහතා විසින් පොළවෙහි වැළලී තිබී සොයා ගත් මෙම ශිලා ලිපිය අඩි 05ක් දිග අඩි 01 අඟල් 11 ක් පළල වේ. මේ ලිපිය කොටා ඇත්තේ අඟල් 07 ක් පමණ පළල ගල් පුවරුවකය. මෙහි මුදුන ස්ථූපිකාවක අයුරින් කපා තිබේ. ලිපියේ මුදුනේ ඉරහඳ කොටා ඇත.

ඉතා දිගු ලිපියක් වන මෙම ලිපියෙන් **දෙවිනුවරට** ආසන්නයෙහි පිහිටි **තෙඩිරතොට** නම් ජාත්‍යන්තර තත්වයෙන් පැවති වරායක් (තොටමුණක්) තිබූ බව කියයි. එය සංස්ථාවක් මඟින් පාලනය වූ බවත් ප්‍රධාන නිලධාරියා **මහ පඬිතෙ** නමින් ව්‍යවහාර කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ වේ. මෙම තොටමුණේ ආදායමෙන් පෙර **කුසලාන්** (පිං පිණිස රජුන් විසින් පිදුණු ඉඩකඩම් වෙහෙර විහාරාදිය) පැවැත්වීම සඳහා මෙහි මුඛ්‍ය පරමාර්ථය වී ඇත. ඒ අනුව මෙම වරායෙන් ලද ආදායමෙන් කොටසක් දෙවිනුවර රජමහ විහාරස්ථානයට, දේවාලයට පූජා කර ඇත.

මෙම සෙල්ලිපියෙහි තොටමුණ පවත්වාගෙන ගිය ව්‍යවස්ථා මාලාවද සඳහන් කර තිබේ. ඒ අනුව මෙම තොටමුණ ඉතාමත් ක්‍රමාණුකූල පාලනයක් මත විනිවිද භාවයකින් යුතුව පවත්වාගෙන ගිය බවට පැහැදිලි වෙයි. ව්‍යවස්ථා මාලාව මෙසේය.

1. තොටමුණේ ප්‍රධාන නිලධාරියා මිස වෙනත් නිළධාරියෙකු විසින් අතුරු නියෝග නොකළ යුතුය.

2. එසේම මහ පඬිතෙ විසින් නියම කරණ ලද අයබඳු මිස එයින් පිටත් බද්දක් අය නොකළ යුතුය.

---

[44] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමි -122 පිටුව,1949

3. හොර බඩු ගෙනෙන විදේශික වෙළඳුන් විසින් රාජ්‍ය සේවකයනට අල්ලස් දී ඒ බඩු වලින් කොටසක් යහළුවන් වෙත තබා කොටසක් පමණක් පෙන්වා රජයට ලැබිය යුතු අයබදු නොලැබී යන සේ වංචා නොකළ යුතුය. (රාජ්‍ය සේවකයන් අල්ලස් ගෙන බඩුවලින් කොටසක් සගවා රජයට ලැබිය යුතු අය බද්දට පාඩු කළ බවත් පෙනී යයි)

4. කිසිම නිළධාරියෙකු විසින් තොටින් පැමිණෙන කිසිවෙකුගෙන් බඩුවක් නොමිලයේ නොගත යුතුය.

5. භාණ්ඩයෙහි නියමිත මිළ නොගෙන සංඝයාගෙන් නොවිමසා සඟසතු භාණ්ඩ විදේශිකයන්ට අඩු මිලට ලබා නොදිය යුතුය.

6. පෙර දවස තොටමුණට ඇවිත් පලපුරුදු යහළුවකු නැවත පැමිණිවිට එය වරදක් කොට සලකා අර්ථ හානි (දඩ) අංගහානි (ශාරීරික දඬුවම්) ජීවිත හානි (මරණ දඬුවම්) නොකළ යුතුය. නොකරවිය යුතුය.

7. විනිශ්චයකදී සාක්ෂි අනුවම විත්තිකරුට දඬුවම් කරණු මිස සිය මතය පරිදි දඬුවම් නොකළ යුතුය.

8. විහාර, දේවාල, කෝවිල්, අග්‍රහාර යන ධර්ම ක්ෂේත්‍රයන්ට නීති විරෝධී වන ලෙස කිසිම වරදක් නොකළ යුතුය. (මෙහි දේවාල යනු සිංහලයන් විසින් පවත්වාගෙන යනු ලබන දේවාල වේ. කෝවිල් යනු ද්‍රවිඩයන් විසින් පවත්වාගෙන යනු ලබන දේවාල වේ. අග්‍රහාර යනු බමුණන්ට දෙන ලද ගම්ය.මේ සතර වර්ගය ධර්ම ක්ෂේත්‍ර වශයෙන් සලකා තිබේ. එයින් එදා පැවති ආගමික නිදහස මැනවින් ප්‍රකාශ වේ.)

9. විශේෂයෙන් තුණුරුවන් සඳහා පවත්වනු ලබන පුද පූජා ආදිය පවත්වමින් එහි ජරාවාස හරවා නව කර්මාන්තාදිය කරවිය යුතුය. (මෙයින් සියලු ආගම් වලට නිදහස හා ආරක්ෂාව සලසා දුන් අතර තෙරුවන් උදෙසා විශේෂ සංග්‍රහ හා ආරක්ෂාව සලසා තිබූ බව ප්‍රකාශ වේ.)

10. මේ සියලුම ව්‍යවස්ථා සඟුන් මහ පඬිතෙ දස මේ තැන් රජ කුලයන් හා පරම්පරාවේ රජවරුන් විසින් ඉරහඳ පවත්නාතාක් නොකඩවා රැකිය යුතුය.

දේවපතිරාජ ඇමති රජතුමාගේ ආගමික කටයුතු භාරව ක්‍රියා කළ රජුගේ බලතල ඇති උසස් ඇමතිවරයෙකි. රජතුමා අසාධ්‍ය රෝගයකින් පෙළුණු විටද ඒ සඳහා දේව පූජා පැවැත්වීමටත් ඊට පෙර කීපවාරයකත් **දෙවිනුවරට** පැමිණ ක්‍රියාකළ **දෙවිනුවර** භාර නිලධාරියා වශයෙන් කටයුතු කළ බවද පෙනේ. මේ ශිලා ලිපියෙන් එදා සිංහල බෞද්ධ රජුන්ගේ නීත්‍යානුකූල පාලන ක්‍රමය පිළිඹිඹු කෙරේ.

VII වන විජයබාසන්නස

1870 දී **රයිස් ඩේවිස්** මහතා විසින් **දෙවුන්දර** මුහුදු වැල්ලෙහි පැරණි දේවාලයක නටඹුන් අතර තිබී සොයා ගන්නා ලද මේ ලිපිය දැනට කොළඹ කෞතුකාගාරයෙහි තැන්පත් කොට ඇත. අඩි 04 අඟල් 06ක් උසැති අඩි 02 ක් පළල අඟල් 07 ක් ඝනකම ඇති මේ ලිපිය පේළි 27 ක් වන සේ කොටා තිබේ. මුදුනෙහි ඉර හඳ කොටා ඇත.

මෙයින් ප්‍රකාශ වන්නේ ක්‍රි.ව.1510 දී රජ බවට පැමිණි ශ්‍රීමත් **සිරිසඟබෝ විජයබාහු** රජුගේ සතර වෙනි අවුරුද්දෙහි පොසොන් මස අව විසේගිය ලත් දවසේ **දෙවුන්දර නගරීස කෝවිල** විසි අමුණක වපසරිය ඇති **පරවාසැර** (පරවාහැර) කුඹ රුද නාවඩුන්නේ (නාඹටුන්නේ) සහ පාතේගම පස් අමුණක ඇති කුඹුරුද අතපත්තු ආරච්චි වේල්ලකින් වෙන් කරවූ බත්ගමින් (බජ්ජම) ලැබෙන ආදායම දෙවියනට පුද පූජාවට සලසා දුන් බවය. මෙම ලිපියෙහි **දෙවිනුවර උපුල්වන්** දේවාලය හඳුන්වා ඇත්තේ **නගරිස නීල කෝවිල** නමිනි. ක්‍රි.ව. 1514-1515 සන්නස් වර්ෂය වේ.

විජයබා සන්නස මෙසේය.

	ඒ පැත්ත	බී පැත්ත
1.	ස්වස්ථී ශ්‍රී ශුඩ ශක වරුෂ	1. වන ලෙසට සලස්වා රාජ රාජ
2.	එක්වාදහස් සාරසිය දෙ	2. මහා මාත්‍යාදීන් දිසා නායක
3.	තිස් වන්නෙහි රජ පැමිණි	3. තැ(න්) ධම්මකත තැන් ඇතුළු
4.	ස්වස්ති ශ්‍රී මහා සම්මත	4. වන්ගේන් ..... වංශ පරම්පරාව....
5.	පරම්පරානුය( )) ත සුරිය	
6.	වංශාභිත ජාත ශ්‍රී ලංකා ධිප	
7.	ති ශ්‍රී මත් සිරිසහ බො -	
8.	ශ්‍රී විජයබාහු චක්‍රවත්තී	
9.	ස්වාමීන් වහන්සෙට සත -	
10.	ර වැන්නෙහි මතු අවුරුදු	
11.	පොසොන අව විසෙනි ය	
12.	දෙවිනුවරෙහි නගරිශ නමි	
13.	කෝවිළට පළමු පටන් පැවැත්	
14.	තෙන් පරවාසර කුමඹුරු	
15.	මුල් බිජුවට විසි අමුණක්	
16.	හා නාවාඩුන්නෙ පාතේගම්	
17.	න් කුම්බුරු බීජුවට පසමුණ	
18.	ක් අතපත්තු ආරච්චි	
19.	වෙණ්ඩ රසකොණ්ඩ පෙරුමා එන්	
20.	බත්ගම් පයිළෙ සැළැස්මෙන්	
21.	අගයට අරගෙන දෙන පරවාසර	
22.	ඇතුළු වූ තැන් දෙවියන්ට පූණ්‍ය	
23.	සත්කාර අඛඩව පවත්වනු	

දෙවිනුවර තඹ සන්නස[45]

හත්වන **විජයබාහු** රජතුමා (ක්‍රි.ව. 1509 - 1521) ක්‍රි.ව. 1520 දී **දෙවිනුවර උපුල්වන්** දේවාලයට **හිත්තටිය** (සිත්තටිය) ගම පූජා කරමින් මෙම තඹ සන්නස ප්‍රදානය කර ඇත. **එච්. සී. පී. බෙල්** මහතාගේ කෑගලු වාර්තා නැමැති පොතේ සඳහන්ව ඇති පරිදි ඉතා සිනිඳු පැතලි මේ සන්නස අඟල් 11 ක් දිග අගල් 2 3/4 ක් පළලය. ප්‍රථම පිටෙහි පේළි නවයක්ද දෙවැන්නෙහි පේළි අටක්ද ලියා තිබේ. ඉර හඳ ලකුණද කොටා ඇත.

හත්වන **විජයබාහු** රජතුමාගේ (ක්‍රි.ව. 1509 - 1521) විසින් **දෙවිනුවර උපුල්වන්** දේවාලයේ දෙවියන් සන්තක කර අවුරුද්දකට පණම් දහයක් පඬුරු උපුල්වන් දේවාලයට දෙමින් ප්‍රයෝජන විඳින ලෙස "නැකති වේද ව්‍යාසරුවරුන්ගේ" පුත්‍රයකු වන තේනුවප්පෙරුමාල් ඇතුළු වූවන්ගේ දරු මුනුබුරු පරම්පරාවට සඳ හිරු පවත්නා තෙක් (ආ චන්ද්‍රාතීස්ථායිව) තඹ සන්නස් පත්‍රයකින් දෙන ලද්දකි.

"නැකති වේද වියාසරුන්ට පළමු පටන් ප්‍රවේණිව පැවත ගෙන ආයෙන්" යනුවෙන් මෙම තඹ සන්නසෙහි එන පාඨය අනුව සත්වන **විජයබාහු** රජු මේ තඹ සන්නසෙන් පරිත්‍යාග කිරීමටත් පෙර "නැකති වේද වියාසරුන්"ට **හිත්තටිය** ගම දිවෙලක් වශයෙන් නොහොත් නින්දගමක් වශයෙන් දී ඇති බව පෙනේ.

මේ "නැකති වේද ව්‍යාසාරුන් (ව්‍යාසකාරයන්) යනු **උපුල්වන්** දේවාලයේ වාර්ෂික පුද පෙරහැරවල් පැවැත්වීමේදී ශුභ නැකත් කියා දෙන්නාවූත්, වේද වාක්‍ය හා දේව ස්ත්‍රෝත්‍ර ගායන කරන්නාවූත්, අය බව පෙනේ. "ව්‍යාසාර" (වියසාර) යනු "ව්‍යාසරකාර" යන්නෙන් සෑදුණකි. "ව්‍යාස" යන්නෙහි අරුත වෙන් කිරීම, බෙදා හැරීම, විග්‍රහ කිරීම, විස්තර කිරීම, පිළියෙල කිරීම,පිළියෙළ

[45] Report on the Kegalla District (H.C.P.Bell C.C.S),1892

කරන්නා හෙවත් කළමනාකරන්නා, ව්‍යාස සෘෂිවරයා යන අර්ථ කීපයක් පවතී. මේ අනුව "වේද වියාසරුන්" සමහරුන් සිතන පරිදි නැකති කුලයේ අය නොව බ්‍රාහ්මණයින් බව විශ්වාස කළ හැකිය.

දෙවුන්දර තඹ සන්නස

පළමු පැත්ත

1. ස්වස්ථී ශ්‍රී වෛවසවත මනුසංඛ්‍යාත මහා සංම්මත පරම්පරානුයාත සයසීවංශොත්
2. භූත ත්‍රීසිංහළාධීශ්වර නවරත්නාධිපති ශ්‍රීමත් සිරි සඟ බෝ ශ්‍රී විජයබාහු චක්‍ර
3. වත්තී ස්වාමීන්වහන්සේට දසවන්නෙන් මතු අවුරුදු පොසොන අවසතවකැ
4. නැකැති වේදවියාසරුන්ට පළමු පටන් ප්‍රවේණිකව පැවැති ගෙන ආයෙන් දොළොස්
5. දාහස් කොරළය බද සිත්තටියට හිමි නැගෙනහිරින් මාවත කොකුන් බස්නා ඇල
6. හා දකුණු දිගින් පරගස මහවෙල මාන්කඩ ඉම හා බස්නාහිරින් ලෙණදුව
7. ගල්තොලල ඉම හා උතුරු දිගින් සුදුගල ඉම හා මෙකී සතර මායිමට ඇතුලත් වූ
8. සරියත් මීට වාඩුව සිටි තුඹගොඩ ගමට ඇතුලත් වූ මෙහි බඳගම් මුදල ගස
9. කොළවල් කුඹුරු ඕවිටි ආදී වූ තැන් උත්පලවණ්ණ දෙවි මහරජ්ජුරු

දෙවෙනි පැත්ත

10. සාමින් සන්තක කොට අවුරුදු එකකට පඬුරට පණම් දහයක් බැගින් පසිඳ ප්‍රයෝජන විදිනා
11. නියායෙන් නැකැති වේද වියාසරුන්ගේ කුපුත් තේනුවරජපෙරුමාළ් ඇතුළු වූවන්ගේ
12. දරු මුනුබුරු පරම්පරාවට ආ චන්ද්‍රකීක ස්ථායීව සවසථර පවතිනා පණතට සලස්වා
13. පත්ලියා දෙන්නෙයැයි ජයවර්ධන කෝට්ටයේ මාලිගාවේ සංහාසනයෙ වැඩහිඳ
14. මුදලිවරුන් මැදට වදාළ මෙහෙවරින් මේ සන්නස් තාඩු පත්‍රය ලියා දුන් බවට
15. සන්නස් තිරුවරහන් පෙරුමාළුහ එකෙව භගිනි ලොකෙස
16. මේ වෂා මපිහුහුජාළුම් නාහොගාන කුර ග්‍රාහීය දනෙ දෙතතා වසුන්දරා දණපාලණායො
17. මමීමධෙ‍්‍යා දානා යෙහාර් මධෙ‍්‍යා දානා සෙයාදුනු දනාත් ස්වග්ග මාසොති පාලනා දච්චුතම් පදම්

මෙම තඹ සන්නස අනුව **දෙවිනුවර** දේවාලයට හිත්තටිය ගම ඇතුළුව නැගෙනහිර මාවත කොකුන් බස්නා ඇල (?) දකුණු දිගට පරගස (?) මහවෙල හා බස්නාහිරට ලෙණදුව ගලතොල්ල හා උතුරු දිගට දෙවිනුවර සුදුගල ඇතුලත් ප්‍රදේශ සහ තුඹොගොඩ ගමට ඇතුලත් ගහ කොළ, විල්, කුඹුරු, ඕවිටි ආදියත් වේද ව්‍යාසකරුවන්ට "දිවෙල්" දී ඇත. මෙම ගම්මාන (?) කවරේදැයි විමසිය යුතුව ඇත.

නායිම්මන (නාවිමන) ද්විභාෂා ලිපිය[46]

VI වන **පරාක්‍රමබාහු** රජතුමා (ක්‍රි.ව.1412 - 1467) විසින් පිහිටුවන ලද මෙම ලිපිය දැනට කොළඹ කෞතුකාගාරයෙහි සුරක්ෂිතව තැන්පත් කර ඇත. මෙම ලිපිය **මියුලර්** මහතා විසින් **දෙවුන්දරට** කිලෝමීටර් 03 ක් පමණ උතුරෙන් පිහිටි නාවිමන (නායිම්මන) ගමෙන් සොයාගෙන ඇත. මෙම ලිපිය අඩි 02 අඟල් 09 ක් උස අඩි 01 අඟල් 1/4 ක් පළලය. මෙහි ඉර හඳ සහ සංඛ චක්‍ර යන සලකුණු කොටා තිබේ.

දෙමළෙන් ලියා ඇති මෙම ලිපිය අවසන් කර ඇත්තේ සංස්කෘත සාලිනී වෘත්තයට අයත් ශ්ලෝක දෙකකිනි. ශ්ලෝක දෙක ලියා ඇත්තේ ග්‍රන්ථාක්ෂර වලිනි.

---

[46] Ancient Inscription in Ceylon (Dr.Mullar),1883

මේ රජුගේ දාන ශාලාවෙන් දන් අනුභව කරණ දොලොසක් බ්‍රාහ්මණයන් සඳහා ලංකාධිපති ශ්‍රී **පරාක්‍රමබාහු** රජ තෙමේ නායිම්මන නම් වූ මේ රමණීය ග්‍රාමය දෙවීය. මේ දීමනාවට බාධාකරණ යම් රජෙකු අනාගතයේදී වීනම් ඔවුහු මහත් පව් රැස් කර ගනිත් යැයි කියා තිබේ. නායිම්මන ගමට අමතරව හුංගම්ගොඩ, පහළ කරමුල්ල, වේරදුව යන ගම් හා වතු කුඹුරු **දෙවිනුවර** දෙවි රජුගේ දේවාලයේ සේවය කරණ දොළසක් බමුණන්ගේ දාන කටයුතු සඳහා දුන් බව මෙයින් කියැවේ.

VI වන පරාක්‍රමබාහු සන්නස

රයිස් ඩේවිඩ් මහතා විසින් **දෙවිනුවර** කයිසවැල්ලේ තිබී සොයාගත් මෙම ලිපිය දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත. අගල් 28 ක් උසැති අගල් 14 1/2 ක් පළල අගල් 08 ක් ඝණකම ඇති මෙම ලිපියේ දෙපැත්තේම ලියා තිබේ. සිරිසඟ බෝ ශ්‍රී පරාක්‍රමබාහු චක්‍රවර්ති ස්වාමීන්වහන්සේට 14 වරුෂයෙන් මිළට ගත් පොල්වත්තක් විහාරයට හා දේවාලයට පිදූ බවත් එය ප්‍රයෝජනය ගන්නවුන් විසින් නැවත ගස් සිටුවා සශ්‍රීක කළ යුතු බවත් දක්වා තිබේ.

	(ඒ)	(බී)	(සී)
1.	ශ්‍රී	1. ගෙ පර	1. යුතු
2.	සිරිසහ ෙ	2. ම් පරාවේ	2. මිනිස් (නි)
3.	බා ශ්‍රී පරාක්‍රම බා	3. න් පවත්	3. ල තැන්න
4.	හු චක්‍රවර්ත්ති ස්වා	4. ව සග	4. ම් මෙ(හි)
5.	මීන් වහන්සේට	5. මොක් ස	5. ප්‍රයෝජන
6.	14 වරුෂ පිරිහෙන	6. ම් පත් සෑ	6. එක්කොට
7.	භූමි මහ විහාරෙයට	7. බිය යුතු	7. නිල සැල
8.	අරුතන් ත්‍රී රණට ගෙ	8. මේ ගස් ප්‍ර	8. සිය යු
9.	ත් ඇති කළ පොල් ව	9. යෝජන වී	9. තු
10.	ත්තයි පිළිමගෙට	10. හැඳිනවුන්	
11.	ගස්....යි දෙව්ර	11. මතු මතු	
12.	ජ්ජුරු සාමීන්ට....	12. න් පෑළ (ඉ)	
13.	වර් ධන කළවුන්ට	13. න්ද විය	
14.	යි මෙලෙස මෙකුන්		

මෙම සෙල්ලිපි, සන්නස් හා ලිපි මගින් ඈත අතීතයේ **දෙවිනුවර** හා අවට ගම්වල පැවති තත්වයත් විහාරස්ථානයට හා දේවාලයට රජවරුන් දැක්වූ අනුග්‍රහයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැක. විශේෂයෙන්ම **දෙවිනුවර** අතීතයේ පැවති සමාජාර්ථික තත්වය පිළිබඳවද මනා වැටහීමක් ලබා ගත හැක.

අපරක්කේ ශීලා ලේඛන 2 ක්

උඩ අපරක්ක සහ පහළ අපරක්ක ගම්වලින් ටැම් ලිපි දෙකක් හමුවී ඇති අතර ඒවායින් සම්පූර්ණ අර්ථයක් ගැනීමට නොහැකි වී ඇත.

මින් උඩ අපරක්කේ ඇති ශිලා ලේඛනය අඩි 04 ක් පමන උසැති ගල් කණුවක කොටන ලද්දකි. එහි අක්ෂර ක්‍රි.ව. 15 වැනි සියවසට අයත් යැයි සිතිය හැකිය. "අබා සලමෙවන් මපූර්මකා" යන පාඨය පමණක් කියවා ගත හැකි තත්වයක පවතින අතර ඉර, හඳ, කාක හා සුනඛ රූප කොටා ඇත. මේ සාධක වලින් අනුමාන කළ හැකි වනුයේ **අබාසල මෙවන්** රජකුගේ රාජ්‍ය කාලයේදී රජු

විසින් හෝ ඔහුගේ ආඥාවෙන් හෝ සිදුකළ කිසියම් ප්‍රදානයක් පිළිබඳ ප්‍රස්තුත ශීලා ලේඛනයේ සඳහන් වන බවයි.

මෙහි දෙවනුව සඳහන් කළ පල්ලේ අපරාක්ක ලිපියේ අක්ෂර ගෙවී ඇති බැවින් කියවීමට නොහැකිය.

කඩවැද්දුව තුන්බෝධි විහාරයේ ශිලා ලේඛනය

කඩවැද්දුවට සැතපුම් දෙකක් පමණ නුදුරින් පිහිටා ඇති කෝට්ටවත්ත නම් ගමෙහි තිබී සොයා ගන්නා ලද මේ ටැම් ලිපිය දැනට කඩවැද්දුව තුන්බෝධි විහාරයේ තැන්පත් කර ඇත. මේ ලිපියේ අක්ෂර ඉහත සඳහන් කළ උඩ අපරාක්කේ ලේඛනයේ අක්ෂරවලට සම්පූර්ණයෙන්ම සමානය. කෙසේ වෙතත් මේ ලිපියෙන්ද සම්පූර්ණ අර්ථයක් ගැනීමට නොහැකි වී ඇත.

04.

දෙවිනුවර පෙරහැර සහ පුද සිරිත්

සිංහලයා බක් මාසය අලුත් අවුරුද්ද සැමරීම සඳහාත් වෙසක් මාසය බුදු තෙමඟුල අනුස්මරණය කිරීම සඳහාත් යොදා ගත්හ. පොසොන් මාසය, අනුබුදු **මිහිඳු** හිමි ගුණ සිහිපත් කිරීම් මෙන්ම සමාජ සාධාරණත්වයේ, සංහිඳියාවේ සඳහම් පණිවිඩය දායාද වූ මාසය ලෙසත් සිහිපත් කරති.

ඇසළ මාසය ඈත අතීතයේ සිට දෙවියන්ගේ මාසය ලෙස සලකා පුද පූජා, වත් පිලිවෙත්,සපුරන මාසය ලෙස යොදා ගෙන ඇත. ඉන්දියාවේ පවා ඇසළ මාසය දේව පූජා පවත්වන මාසය ලෙස නම් කර ඇත. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රධානතම ඇසළ උත්සව අතර ඓතිහාසික මහනුවර සෙංකඩගල දළදා මහා පෙරහැර ප්‍රමුඛස්ථානයක් ගනී. **දෙවිනුවර** ඇසළ පෙරහැරද ඉතා දිගු ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ අග්‍රගණ්‍ය පෙරහැරකි.

ශ්‍රී ලංකාවේ ඉපැරණිම දේව පූජා පෙරහැරක් වන **දෙවිනුවර ශ්‍රී විෂ්ණු උපුල්වන්** මහ දේවාල පෙරහැරේ ආරම්භය ක්‍රි.ව. 1258 වසර තරම් ඈතට දිවයන්නකි. **දඹදෙණියෙහි** සිහසුනට පත් සර්වඥ **පණ්ඩිත පරාක්‍රමබාහු** (ක්‍රි.ව. 1258 - 1285) රජතුමා **චන්ද්‍රබානු** නම් ජාවක (මැලේ) රජතුමාගෙන් මේ රට බේරා ගැනීම සඳහා **දෙවිනුවර උපුල්වන්** දෙවියන්ට වූ බාරය ඔප්පු කිරීම සඳහා ඇසළ පෙරහැර ආරම්භ කළ බව සඳහන් වේ.

එයට අමතරව රජතුමාට උපන්දා සිට පැවති වික්කල් ගැසීම (ගොත ගැසීම) සුව වීමට සිද්ධ කළ බාරය ඔප්පු කිරීම තවත් හේතුවක් වී ඇත.

කප් සිටුවීම -

දෙවිනුවර ඇසළ පෙරහැර මංගල්‍යයේ පළමු මංගල කටයුත්තක් ලෙස **කප් සිටුවීමේ** චාරිත්‍රය ඉතිහාසයේ සිට සම්ප්‍රදායානුකූලව සිදුවේ.එය ඉතාමත් පවිත්‍රව, චාරිත්‍රානුකූලව ඉටු කරනු ලබයි.

මෙය එක් අතකින් දෙවියන්ට බාරයක් වීමක් වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙන්න මේ දිනයේ පටන් අසවල් දිනය දක්වා දේවාලයේ පවත්වන පුද පූජා උපහාරය කිසිසේත් හෝ කිසිම උපද්‍රවයක් සිදු නොවීමටත් කිසිදු හිරිහැරයකින් බාධාවකින් තොරව ඉතාමත් සාර්ථකව පෙරහැර පවත්වාගෙන යාමට අවසර ලැබේවායි යන පරමාර්ථය ඇතිව මෙම කප් සිටුවීම කරනු ලැබේ. සාමාන්‍යයෙන් දේව පෙරහැරට දින දහ හතරක් (14) පෙරාතුව මෙම **කප් සිටුවීම** සිදුවේ.

මෙය **කප්රුක් මංගල්‍යය, කප් රුක් සිටුවීම, කප සිටුවීම** යනුවෙන්ද හැඳින්වේ.

දෙවියන් වෙනුවෙන් **බස්නායක** නිළමේතුමා සහ දේවාලය භාර ප්‍රධාන කපු මහතා (මහබෙත්මෙ) දින නියම කර ගත් සම්මුතියකට අනුව **කප සිටුවා** දින හතක් (07) ඇවෑමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය පවත්වන බවට දෙවියන්ට පොරොන්දුවක් ලබා දීම **කප් සිටුවීමේ** චාරිත්‍රයේ අරමුණ වේ.

සාමාන්‍යයෙන් පෙරහැර මංගල්‍යය සඳහා **කප් සිටුවනු** ලබන්නේ ඇසළ මාසයේ පුර පෑලවියේ දවසකය. **කප සිටුවීමට** පෙර චාරිත්‍රානුකූලව **බහිරව** පූජාවක් කරනු ලබන අතර දේවාලය ශුද්ධ පවිත්‍ර කර සඳුන් කිරිපැන් වලින් පිළිම පවා සෝදනු ලැබේ. දේවාලයේ අලුත් තිර රෙදි පවා දමයි. **කප කණුව** සිටුවීමට පෙර දේවාලයේ යාතිකාවක් කරන අතර **කප කණුව** මධ්‍යයේ ඒ වටා සතර වරම් දෙවිවරුන් වන **ධෘතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ** හා **වෛශ්‍රවණ** යන දෙවිවරුන් උදෙසා පාන්පැල් හතරක් (04) ඉදි කරනු ලැබේ. එසේම **අෂ්ඨ** බහිරව (08) දේවතාවුන් වහන්සේලා සිහිපත් කොට පැණි බත් සහිතව **චතු මධුර**, පලතුරු වර්ග සහිත පූජාවක් තබයි. **කප** කණුව සිටවනු ලබන්නේ ඉන් අනතුරුවය.

දෙවිනුවර ඇසළ මංගල්‍යයේ **කප** සිටුවීම සඳහා ගනු ලබන්නේ සඳුන් රුකකි. ලංකාවේ අනෙකුත් දේවාලවල **කප** සිටුවීම සඳහා ගනු ලබන්නේ පල නොහටගත් කිරිගසකි. විශේෂයෙන් කොස් ගසකි. **දෙවිනුවර** දේවාලයේ **කප** සිටුවීම සඳහා ගනු ලබන සඳුන් රුක ඉතාමත් පැරණි එකකි. **කප** කනුව දේවාල භූමියේ සිටුවීමට පෙර ශබ්ද පූජා පවත්වා මහ පෙරහැරින් මහ දේවාලයේ පූජා ඇදුරන්ගේ කරමතින් තෙවරක් දේවාලය වටා පැදකුණු කරයි.

කප කණුව සිටවනු ලබන්නේ ශුද්ධ නැකත් වෙලාවකය. **කප** සිටුවීමට පෙර **ශ්‍රී විෂ්ණු උපුල්වන්** දෙවියන් උදෙසා විශේෂ කන්නලව්වක් කරනු ලැබේ. එය හැඳින්වෙන්නේ දෙවියන්ගේ මුල් කන්නලව්ව නාමයෙනි.

".....පස්වාන් දහසක් සාධු සාධු හිට වැන්දෙන්,බැහැ වැන්දෙන්, නැගූ අතින් වැන්දේන්, දෝත් මුදුනේ තබා වැන්දේන්,දැත දසගිල්ලෙන් වැන්දේන් මා හිස නමා වැන්දේන්, සියක් වර දහස් වර සත් සිලක්ෂ තුන්සිය පනස් යොදුනක් මේ චක්‍රාවාටය තුළ, තාරුකා දිව්‍ය ලෝකයේද සදිව්‍ය ලොකයේද මෙරහත මුදුන මැද පිහිටි ජම්බුද්වීප දේශ ගාන්ධර්වයන්ගේ දේව සුමායට.....සතර අතකින් යුක්තව එක් අතකට පාරා වළල්ලක්ද එක් අතක අභය මුද්‍රාවකින්ද යුක්තව මත්ස්‍ය අවතාරයක්, නරසිංහ අවතාරයක්, පර සිරාම අවතාරයක්, බුද්ධ කල්කි යන දස අවතාරයකින් පරිපූර්ණ වන උතුම් වූ ශ්‍රී විෂ්ණු දේව සාමිණී, සංඛ ශීල දේව නාරායන භවතේ ප්‍රසිද්ධ වන්නාවූ ඔබ වහන්සේගේ ආශිර්වාදය, පිළිසරණ පතාගෙන අද වන දිනක්, ඔබ වහන්සේගේ ගැත්තන් විසින් ඔබ වහන්සේගේ මහා මාළිගාවේ පවත්වන්නාවූ ඇසළ පෙරහැර දේව මංගල්‍යයේ කප්රුක් සිටුවීම සඳහා අවසර පතා සිටිනවා..."

කප කණුව සිටුවීමට පෙර **කප** කණුවේ ශුද්ධ පඬුරකට අමතරව පොල් මලක්ද පුවක් මලක් ගැට ගසනු ලැබේ. සාමාන්‍යයෙන් **කප** කණුව සිටවනු ලබන්නේ නැකැත් වේලාවටය. මෙම අවස්ථාව දැකබලා ගැනීම සඳහා සහ සහභාගී වීම සඳහා අති විශාල පිරිසක් දේවාල භූමියට එක් රැස් වෙති. **දෙවිනුවර** අවට ජනයා පමනක් නොව දුර බැහැර ප්‍රදේශවලින්ද බැතිමතුන් පැමිණෙති.

කප කනුව සිටුවීමට පෙර **බස්නායක නිළමෙතුමා** දේවාලයේ ප්‍රධාන කපු මහතා **කප කනුවේ** පඬුරු ගැට ගසයි.ඉන් පසුවය ඒ අවස්ථාවට සහභාගී වන බැතිමතුන්ට පඬුරු ගැට ගැසීමට අවස්ථාව උදාවන්නේ. **දෙවිනුවර** අවට ගම්වාසීන් පමණක් නොව ඉතා දුර බැහැර ප්‍රදේශවලින්ද සහභාගී වෙති.දේවාල භූමිය පුරාම මෙම අවස්ථාවේ පොල් ගැසීම දක්නට ලැබෙන සුවිශේෂ දර්ශනයකි.

කප සිටුවීමෙන් පසු සෑම දිනකම එළවළු පහක් කිරිබතක් දවල්ට පූජා කරන අතර රාත්‍රී කාලයට පැණි බතක් පූජා කරනු ලැබේ. මෙම පූජාවන් උදේ 5 ට දවල් 11 ට සහ රාත්‍රී 7 ට පැවැත්වීම පුරාණ චාරිත්‍රානුකූලව සිදුවෙයි. මෙසේ දින 07 ක් පැවැත්වීමෙන් පසුව මහ පෙරහැර දේව මංගල්‍යය පවත්වනු ලැබේ.

දෙවිනුවර පෙරහැර මංගල්‍යයේ සුවිශේෂම අවස්ථාව වන්නේ පෙරහැර සඳහා "කප" සිටුවන දින රාත්‍රී දෙවිනුවර හා තදාසන්න සෑම ගෙදරකම පහන් පැලක් සාදා දෙවියන් උදෙසා පහන් දැල්වීමයි. පෙරහැර අවසාන වන තෙක් මෙය දෙවිනුවර හා අවට ගම්මාන පුරාම සිදුවීම අතිවිශේෂ අසිරිමත් සිදුවීමකි.

මෙම කාළය තුළ බාර හාර වී ගැට ගසා ඇති පුද පඬුරු ඔප්පු කරලීමත් සිදු කරයි. එසේම අලුතෙන් පඬුරු ගැට ගසා බාරහාර වීමත් කරති. දේවාලයට පැමිණෙන දහස් සංඛ්‍යාත බැතිමතුන් හිස් සෝදා නා පිරිසිදු වී පැමිණෙන අතර දෙහි පුළුස්සා හිසේ සහ පඬුරුවල ගෑමටද අමතක නොකරති.

පෙරහැර චාරිත්‍ර

පුර පෑළවිය දිනට **කප** සිටුවීමෙන් දින හතක් (07) ඇවෑමෙන් පළමු පේළි පෙරහැර පැවැත්වේ.ප්‍රථම පේළි පෙරහැරට සහභාගී වීම සඳහා **බස්නායක නිළමෙතුමා** සවර්ණාභරණයෙන් විභූෂිතව නැකැත් වෙලාවට සිය නිළ කාර්යාලයෙන් පිටත් වේ. **බස්නායක නිළමෙතුමා දෙවිනුවර** රජමහා විහාරස්ථානයට ගොස් මල් පහන් පුදා තෙරුවන් නැමැද මහා සංඝරත්නයේ ආශීර්වාදය ලැබ **ශ්‍රී උපුල්වන් විෂ්ණු** මහා දේවාලයට පැමිණෙයි.

අවරිය පන්දම -

දෙවියන්ගේ ආශීර්වාදය ලබා ගැනීමෙන් පසුව **බස්නායක නිළමෙතුමා** දේවාලයෙන් පිටත්ව ප්‍රධාන කපු මහතා හා එක්ව පෙරහැරේ මුලින්ම ගෙන යනු ලබන **අවරිය පන්දම** කපුරු හා තෙල් දමා දල්වනු ලැබේ.මෙම **අවරිය පන්දම** ලංකාවේ කිසිඳු ඇසළ පෙරහැරක හෝ දේව පෙරහැරක දක්නට නොලැබෙන විශේෂ අංගයකි. අවරිය පන්දම දල්වනු ලබන්නේ ශුභ නැකතකට අනුවය.

අවරිය පන්දම අසලින්ම පෙරමුණේ රාළලා ගමන් කරති. ඒ අසලින්ම පන්දමේ භාරකරුවන් වන නිළවීර සහ ගුණරත්න පරම්පරාවේ අයවලුන්ය. **අවරිය පන්දම** ගෙන යනු ලබන්නේ සම්ප්‍රදායානුකූලව **මුහන්දිරම්** හා **නිළවීර** පරම්පරාවට අයත් පුද්ගලයින් විසිනි.

මහ වාහල්කඩ අසලට ගෙන ගොස් දල්වන තෙක් **අවරිය පන්දමට** සාමාන්‍ය බැතිමතුන්ට තෙල් දැමීම තහංචිය. **බස්නායක නිළමේතුමා** කපුරු හා තෙල් දමා පත්තු කිරීමෙන් පසු අවශේෂ ජනයාට **අවරිය පන්දමට** තෙල් දැමීමට අවසර ඇත. දිවයිනේ සතර දිග් භාගයෙන් පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පෙරහැරේ ගෙන යනු ලබන **අවරිය පන්දමට** තෙල් දැමීම සිදු කෙරේ. විශේෂයෙන්ම වෙද මහත්වරුන් විසින් හිදිනු ලබන තෙල් වර්ග මුලින්ම **අවරිය පන්දමට** දැමීම සිරිතකි.

ගුරුළු කොඩිය (ගරුඬා කොඩිය) -

අවරිය පන්දම දල්වා **බස්නායක නිළමේතුමා** පෙරහැරේ ගෙන යනු ලබන **ගුරුළු** කොඩිය **(ගරුඬා** කොඩිය) දිග හරිනු ලැබේ. **ගුරුළු** කොඩිය **(ගරුඬා** කොඩිය) දිග හරින තෙක් පෙරහැරට ගමන් කිරීමට අවසර නැත. **ගුරුළු** කොඩිය යනු **ශ්‍රී විෂ්ණු** දෙවියන්ගේ කොඩියයි. මේ බව සඳහන් කරන **ගන්දර පී.ඩී.එස්. වීරසූරිය** මහතා **දෙවුන්දර** දේවාලය **විෂ්ණු** දෙවියන්ගේ දේවාලය යන විශ්වාසය හට ගැනීමෙන් පසු මේ පෙරහැරේ ගරුඬා (ගුරුළා කොඩිය) ගෙන යාම ආරම්භ වී ඇත. **ගුරුලා ශ්‍රී විෂ්ණු** දෙවියන්ගේ වාහනයයි.[47] මේ පිළිබඳව වැඩිදුරටත් සඳහන් කරන **වීරසූරිය** මහතා මෙසේද පවසයි. "මෙයින් අවබෝධ වන්නේ මේ ඇසළ පෙරහැර **විෂ්ණු** දෙවියන්ගේ දේවාලය පිළිබඳ සංවත්සර උත්සවය බවයි. **උපුල්වන්** දෙවොලේ ඇසළ පෙරහැරය **දෙවුන්දර** පවත්වනු ලබන්නේ"

මුලින්ම පෙරහැරේ **අවරිය පන්දම** ගෙන යන අතර ඉන්පසු **ගුරුළු** කොඩියත් ඒ දෙපස ඉර හඳ කොඩියත් ගෙන යනු ලැබේ. **ඉර හඳ** කොඩිය II වැනි ශ්‍රී වීර පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රදානය කරන ලද්දකි. ඉර හඳ පවත්නා තාක් කල් මෙම පෙරහැර පැවැත්විය යුතු බව එයින් සංකේතවත් වෙයි.

---

[47] දෙවුන්දර ඉතිහාසය - ගන්දර පී.ඩී.ද එස් වීරසූරිය මහතා -125 පිටුව.සී/ස එස්.ගොඩගේ සහ සහෝදරයෝ-1949

කුරු ඇතා කොඩිය -

පිළිවෙලින් ඉන්පසු ජාතික කොඩිය හා බෞද්ධ කොඩිය ගෙන යන අතර පළාත්, දිසා කෝරළ හෙවත් කොට්ඨාස 16 ක කොඩි ගෙන යන අතර **කුරු ඇතා** කොඩියද ගෙන යයි. රුහුණේ ලාංඡනය වන **කුරු ඇතා** කොඩිය ලංකාවේ කිසිම දේවාලයක පෙරහැරක දක්නට නොලැබෙන සුවිශේෂී කොඩියකි.

දුටුගැමුණු මහ රජතුමා **මාගම්** පුරවරයේ සිට **අනුරාධපුර විජිතපුර** මහ සටන සඳහා ගිය ගමනේදී **කුරු ඇතා** කොඩියද ගෙන ගිය බව ප්‍රකටය. රුහුණේ ලාංඡනය කුරු ඇතා බවට පත්වුයේ රුහුණු වැසියන්ගේ ශූර වීරභාවය හා එඩිතර සටන්කාමී ගතිය නිසාය. **රුහුණේ තංගල්ලේ නෙටොල්පිටියට** නුදුරු **බටඅත** කැලයේ එකල බහුලව වාසය කල කුරු ඇතා විශාල ශරීරයක් ඇති හැඩි දැඩි එකෙකු නොවේ. එහෙත් මෙම ඇතා සටනේදී පසු නොබසින ඌ සාමාන්‍ය මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් ඇති ශක්තිමත් සත්වයෙකි. සටනින් ජයගෙන මිස පැරද පලා නොයන **කුරු ඇතා** ජය ගන්නා තෙක් සටන් කරයි. එසේ නොහැකි නම් පලා නොගොස් මැරී වැටෙන තෙක් සටන්කරයි. රුහුණේ ජනයාගේ ධීර වීර භාවය සහ වීරෝධාරභාවය **කුරු ඇතාගෙන්** නිරූපණය වන හෙයින් **කුරු ඇතා** රුහුණේ කොඩිය ලෙස භාවිතයට ගෙන ඇත.

මාතර - කතරගම මහා මාර්ගයේ **දෙවිනුවර** දේවාලයට සමීපව ස්ථාපිත කර ඇති ලංකාවේ උසම සැතපුම් කණුව වන 103 සැතපුම් කණුව මුදුනේද **කුරු ඇතා** සළකුණ දැකිය හැක.[48]

පෙරහැර මංගල්‍යයේ අවසාන රන්දෝලි පෙරහැරේ දිවියා ලකුණ ලාංඡනය සහිත විශේෂ කොඩියක්ද ගෙන යනු ලැබේ.

දෙවිනුවර දේවාල පෙරහැරේ සුවිශේෂත්වය වන්නේ රුහුණට අනන්‍ය වූ පහත රට සම්ප්‍රදායට අයත් - විශේෂයෙන්ම මාතර සම්ප්‍රදායට අයත් - නැටුම් රාශියක් ඇතුලත් වීමය. දෙවිනුවර මහා දේවාල පෙරහැර එක් අතකින් රුහුණේ පහත රට - මාතර සංස්කෘතික සම්ප්‍රදාය නිරූපණය කෙරෙන අනගිහවනීය උතුම් දේශීය මංගල්‍යයකි. මෙම පෙරහැරට විශේෂයෙන්ම පහත රට දේව තොවිල් වලට අයත් නැටුම් අංග රාශියක් ඇතුලත් වේ. ඒ නැටුම් අංග අතර **ශුද්ධ මාත්‍රා** නැටුම, **පත්තිනි** නැටුම, **ගිනි දෙවි** නැටුම, **විෂ්ණු මල් අස්න** නැටුම, **තෙල්මේ** නැටුම කිහිපයකි. එයට අමතරව රුහුණු නැටුම් සම්ප්‍රදායට අයත් සළුපාලිය,වඩිග පටුන, ආශිර්වාද නැටුම, පතුරු නැටුම, කුලු නැටුම, රබන් නැටුම, කළගෙඩි නැටුම, ලී කෙළි නැටුම, ගොයම් නැටුම සහ පහත රට තොවිල් සම්ප්‍රදායට අයත් මහසමයම, දෙකොන විලක්කුව, කුමාර සමයම, හැන්ද සමයම අමුක්කු සන්නිය, ගුල්ම සන්නිය, මරු සන්නිය, කොර සන්නිය, මිහිරි සන්නිය ආදිය ඇතුලත් වේ.

මුහුදු බඩ ප්‍රදේශවලට අනන්‍ය වූ සුවිශේෂ කෝළම් නැටුම් වලට අයත් අඬබෙර කෝලම, ජසලෙන්චිනා කෝලම, පොලිස් කෝලම, කරපිට කෝලම, ආරච්චි කෝලම ආදියද ඇතුලත් වේ.

සාමාන්‍යයෙන් **දෙවිනුවර ශ්‍රී විෂ්ණු උපුල්වන්** දේව පෙරහැර දේශීය සංස්කෘතික අංගයන් මතු කර දක්වන අන්දමට පැවැත්වීම පෙර පටන් පැවැතෙන චාරිත්‍රයකි. ඇතැම්විට පෙරහැර පෙළ ගස්වා ගමන් ගන්නා අතරතුර යම් යම් සුළු වෙනස්කම් සිදු වුවද ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් පෙරහැර ගමන් ගනු ලැබේ.

1. අණබෙරකරු සහ පණිවිඩකරු
2. කසකරුවන්
3. අවරිය පන්දම
4. පෙරමුණේ රාළ
5. ගුරුළා (ගරුඩා කොඩිය)
6. බෞද්ධ කොඩිය/ජාතික කොඩිය/ඉර හඳ කොඩිය
7. හේවිසි කණ්ඩායම

---

[48] දෙවිනුවර අවට නටඹුන් පරිච්ඡේදයේ වැඩිදුර තොරතුරු පළවෙයි.

මේ ආකාරයෙන් බස්නායක නිළමේතුමා (42) විෂ්ණු දේවාල කපු මහතා (46) දේවාභරණ අලියා පිට වැඩවමින්ද ගමන් කරනු ලැබේ.

කසකරුවන් මුල් කාළයෙහි පෙරහැරට ඇතුලත් නැත. එය මෑත කාළයෙහි සිට එක්වූ අංගයකි. එසේම ධාතු කරඬුව වැඩමවීම සහ ධර්ම පුස්තකය වැඩමවීම 2003 වසරේ සිට සිදුවී ඇත. එය මෙම පෙරහැරට බෞද්ධ මුහුණුවරක් දීම සඳහා ආරම්භවූවකි.

අවරිය පන්දම දල්වා එය මුලින්ම ගෙන යාමෙන් මෙම පෙරහැර රාත්‍රී කාළයේ පැවැත්වූ බවට හොඳම නිදසුනකි. එහෙත් දැනට පෙරහැර පවත්වනු ලබන්නේ දහවල් කාළයේය.

ඈත අතීතයෙහි පෙරහැර හතක් (7) පැවැත්වූ බවට පැරණි තොරතුරු වල සඳහන් වේ. එහෙත් එය දින හතරක් (4) දක්වා අඩුවී ඇත. එහෙත් නැවත් වරක් 1987 වසරේ සිට නැවත වරක් පෙරහැර හතක් (07) පැවැත්වීම ආරම්භ කර ඇත.

පෙරහැර හතක් පැවැත්වූ බවට තොරතුරු පවසන පැරණියන් ප්‍රකාශ කරනුයේ, පැරණි **දෙවිනුවර** දේවාලය වටා පරිවාර දේවාල හතක් (07) පැවති බවත් ඒ දේවාල වල පෙරහැර හතක් (07) පැවැත්වූ බවත්ය. **උපුල්වන්** මහ දේවාලය පෙරහැර ප්‍රමුඛ කරගෙන මේ දේවාල පෙරහැර එකල පවත්වා ඇත. 'හත් දෙයියනේ, හත් දේවාල' යන ජන ව්‍යවහාරයටද පැමිණියේ දේවාල හතක් (07) පැවති නිසා බව සඳහන් වේ. අදත් මහ දේවාලය වටා දේවාල හතක් (07) දක්නට ලැබේ.

අලුත් නුවර දේවාලය පිහිටු වීම සම්බන්ධ පැරණි ලිපියක ඇසළ පූජාව පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත. ඒ අනුව දේවාලය අභ්‍යන්තරයෙහි යාග හෝම පවත්වා පිටත් වන පෙරහැර හඳගල ලඟින් මහා මාර්ගයට පිවිස සිංහාසන පාරේ ගමන් කොට **සිංහාසනයයි** දැන් ව්‍යවහර වන දේවාලය ළඟ නැවතී වතාවත් කර **අම්පිටිය** පාරට ඇවිත් **ප්‍රදීපාගාර** පාරට ගමන් කොට **කිරළවැල්ල** හන්දිය ළඟින් රවුම් පාරේ වමට නොහැරී ඉදිරියට අවුත් **මාතර - තංගල්ල** පාරට සම්ප්‍රාප්තව බටහිරට හැරී ගමන් කොට රවුම් පාරේ හන්දියෙන් වමට හැරී **සඳගල** ළඟට ඇවිත් **මහවත් මඩුවේ** නෂ්ඨාවශේෂ අතරින් ගමන් කොට ගල් දොරටුවේන් ඇතුළු වී දේවාල භූමියට පැමිණ සිරිත් පරිදි ගෙවදියි.

පෙරහැර දේවාලයට ගෙවදීමෙන් පසු පොල් ගෙඩියක් ගසා දේවාශිර්වාද කිරීමෙන් පසු පෙරහැර කටයුතු නිමාවට පත්වෙයි.

බුද්ධභෝගයක් ලෙස සැලකෙන කුඹුරු ගොවිතැන් කපා පා ගන්නා අවස්ථාවල මුලින්ම මඟින වී කුරුණිය 'පිං වී' කුරුණිය ලෙස දෙවියන්ට බුදුන්ට වෙන් කරයි. දේවාලයේ පෙරහැර පැවැත්වෙන කාලය තුළ **දෙවිනුවර** ප්‍රදේශයේ පමණක් නොව මාතර අවට ගොවි ජනයා තම මුල් අස්වැන්නෙන් ලැබූ ශෂ්‍යය (වී) දේවාලයේ දාන මාන කටයුතු සඳහා ගෙනවිත් බාර දීම සිදුකෙරේ. මෙම වී හඳුන්වන්නේ **'අක් යාලේ වී'** නමිනි. විශේෂයෙන්ම **නිල්වලා** නිම්නයේ **මහමාවී** කුඹුරු හිමියන් මෙය අනිවාර්යෙන්ම සිදු කරති.

කිතුල් මැදීමෙන් ලබා ගන්නා මුල්ම පැණි කොටස **දෙවියන්** සඳහා වෙන්කෙරේ. මෙය නිල්වලා ඉහල නිම්නයේ ගැමියන්ගේ සුවිශේෂී පිළිවෙතකි.එම පැණි කොටස හඳුන්වනු ලබන්නේ **අක්මුල් පැණි** නමිනි.එම පැණි හෝ පැණි වලින් සාදා ගන්නා හකුරු දේවාලයෙන් පිරිනැමෙන දානය සඳහා ලබාදීම නොකඩවා සිදු කෙරෙන චාරිත්‍රයකි.

දෙවිනුවර දේවාලයේ මහ පෙරහැර පැවැත්වෙන කාලය තුළ වී, හාල් පමණක් නොව **දෙවිනුවර** අවට ජනයා පොල්, පුවක්, බුලත් ආදියද නොකඩවා ලබා දෙති. එසේම මී ගව පාලනයේ යෙදෙන පිරිස් තම දෙනුන්ගෙන් දොවා ලබාගෙන මුදවා ගත් **මී කිරි** ද දේවාලයට බාරහාර කරති. මේ නිසා දෙවිනුවර අවට ජනයාගේ සමාජ, ආර්ථික ජීවිතයද දේවාලය හා සම්බන්ධ වෙති.

එපමණක් නොවේ. ගෙවල් වල සාදන රස කැවිලි සහ කැවුම්, කොකිස් වැනි දේවල්ද දේවාලයට බාර කරති.දෙවිනුවර පෙරහැර කාලයට දෙවිනුවර පමණක් නොව අවට ගම්මාන එකම මඟුල් සිරියක් උසුලයි. විශේෂයෙන්ම තම භව භෝග වල **මුල්වැන්න** ඉතාමත් පිරිසිදුව, පවිත්‍රව, භක්තිමත්ව දෙවියන් උදෙසා පූජා කරති.

මහජනතාවට වැළඳෙන ලෙඩ රෝග වලදී පමණක් නොව දේව උදහසින් වැළඳෙන අම්මාවරුන්ගේ සහ අපල උපද්‍රව වලදී **උපුල්වන්** දෙවියන් උදෙසා විශේෂ යාග හෝම, කන්නලව් හා ආශිර්වාද ගැන්වීම් පෙරහැර කාලය තුළ සිදු කෙරේ.

දේවාල පෙරහැර නිමාවීමෙන් පසුව සත් දිනක් ඇවෑමෙන් පෙරහැරට සහභාගී වූ **බස්නායක නිළමෙතුමා** ප්‍රමුඛ නිළමෙවරුන්ටත් කාර්ය මණ්ඩලයටත් සියළුම දේව ගැතිවරුන්ටත් දෙවිනුවර හා අවට ගම්වැසියන්ටත් පොදුවේ ශ්‍රී ලංකාවාසි සියලුම දේව ගැතිවරුන්ටත්, දෙවිනුවර හා අවට ගම්වැසියන්ටත් පොදුවේ ශ්‍රී ලංකාවාසී සියලුම ජනයාටත් වස් දොස් දුරලීම සඳහා දේව තොවිලය හෙවත් **කෝල්මුර යාගය** සිදු කරනු ලැබේ.

එදින එළිවන යාමයේ දෙවොල් දෙවියන් උදෙසා **ගිණි පෑගීම** සිදු කරන අතර හිමිදිරි පාන්දර **දේව දානය** පිංකම හා **හාල් කිරි** බෙදා දීම සිදු කෙරේ.

05

දෙවිනුවර හා තදාසන්න ප්‍රදේශයේ පුරා විද්‍යාත්මක වටිනාකම

දෙවිනුවර ඈත අතීතයේ විවිධ නම් වලින් හැඳින්වූ බව ඉතිහාසය සාක්ෂි දරයි. ක්‍රි.ව. 104 වැන්නෙහි **ඊජිප්තුවේ** තාරක ශාස්ත්‍රඥයෙකු වූ **ටොලමී** මෙම නගරය හඳුන්වා ඇත්තේ දගන (Dangana) යනුවෙනි. **ඉබන්බතූතා** නම් වූ ඉස්ලාම් භක්තික දේශ සංචාරකයා **දිනවාර්** (Dinewar) යන නමින් හඳුන්වා ඇත.

දෙවිනුවරට ව්‍යවහාර වූ පැරණි නාමය **ගිරිහෙළ පුරය** යැයි ප්‍රකටය. **පරෙවි** සන්දේශයෙහි එන කවියක් අනුව "කිහිරැළි උපුල්වන් - දෙවි රජුනි ගිරිහෙළ පුර"[49] යනුවෙන් සඳහන් වීමෙන් පැහැදිලි වේ. **උපුල්වන්** දෙවි රජු ගොඩ බැසීමෙන් පසු ඔවුන් වාසය කළ නගරය හෙයින් එතැන් සිට දෙවියන්ගේ නගරය, දේව නගරය හෙවත් දෙවුන්දර, **දෙවිනුවර** නමින් මෙම නගරය ප්‍රකට විය.

හින්දු භක්තිකයන් මෙම නගරය භාවිතා කළේ දෙවියන් ගොඩබට තොට යන අරුතින් තෙයිවාන්තුරෙයි (තෙයිවාන්තුරේ) යනුවෙනි.

දෙවිනුවර ඉතිහාසය **රාම - රාවණ** යුගය දක්වා දිවයන්නක් බව ඇතමෙකු පවසයි. දෙවන පෑතිස් (ක්‍රි.පූ.307-267) රජ සමයෙහි **දෙවිනුවර** ආර්යන්ගේ වාස භූමියක්ව පැවති බවද සඳහන් වේ. **I වැනි දාපෝඨතිස්ස** (ක්‍රි.ව. 640- 652) රජ සමයෙහි මේ නගරය මධ්‍යම ප්‍රමාණයේ දියුණුවක් පැවති බව පෙනේ. ඒ රජතුමා මෙහි කළක් වාසය කළ බව **ගලතුරු මුල** පිරිවෙන අනුව නිගමනය කළ හැක.

ගලතුරු මුල පාය -

දෙවිනුවර තිබූ ගලතුරු මුල පායක් පිලිබඳ තොරතුරු **පරෙවි** සන්දේශයෙහි මෙසේ සඳහන් වෙයි.

සලතුරු ටැඩින් සුලකළ තුන් මහල්	යෙදූ
නිලතුරු කිකිණි බඳ රන් දද පෙළ	සුසැදූ
දුලතරු වැලෙවි පලගෙහි මුතු ලැල්	සිනිදු
ගලතුරු මුළ පායෙහි මහ ඟනන	වඳු[50]

මෙම කවිය අනුව ගලතුරු මුල පාය මහල් තුනකින් යුත් සංඝාවාසයකි.

---

[49] පරෙවි සන්දේශය - 201 කවිය -වී.ඩී.එස්.ගුණවර්ධන, සංස්කරණය 2012. සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

[50] පරෙවි සන්දේශය - 153 කවිය -වී.ඩී.එස්.ගුණවර්ධන, සංස්කරණය 2012. සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

මෙම ගොඩනැගිල්ල අසවල් තැන පිහිටුවා තිබුනැයි ඉඳුරා කිව නොහැකි වුවද ගලතුරු මුල පිරිවෙන් ශාලාවේ නෂ්ඨාවශේෂ වශයෙන් සැළකිය හැකි ගෙවී ගිය සඳකඩ පහනක්ද, ගල් කුළුණු කිහිපයක්ද දක්නට ලැබේ. මෙම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර වපසරිය අඩි 12x2 කි.

පොලොන්නරුවේ බුද්ධ සීමා මන්දිරයට හුරු බවක් පෙනෙන මෙම බිමට දැමූ පැරණි බදාමයෙහි කොටසක් තවමත් දක්නට ලැබේ. මේ අනුව මේ අවශේෂව ඇති ගොඩනැගිල්ලේ අත්තිවාරම ගලතුරු මුල පිරිවෙනේ බද්ධ සීමා මාලකය විය යුතු යැයි ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමියෝ[51] පවසති. එකොලොස්වෙනි දොලොස්වෙනි සියවස් වල ගෘහ නිර්මාණ ක්‍රමය අනුව බිත්ති ශක්තිමත් වීම සඳහා මැදට යොදන ලද ගල්කණු කිහිපයක්ද තවමත් කෙළින් වී තිබේ. ගෙවී ගොස් ඇති සඳකඩපහනෙහිද හංස පේළියක් කොටා තිබේ.

ගලතුරු මුල පාය තෙමහල් සංඝාවාසයක් කරවා මහ සඟනට පූජා කරන ලද්දේ **මහා විජයබාහු** රජතුමාගේ (ක්‍රි.ව. 1065 - 1120) මහේෂිකාවක විසින් බව **මහාවංශය**[52] කියයි. **කෝකිළ** සන්දේශය ලියූ **තිලක** පිරිවෙන්පති හිමියන් මෙහි විසූ මහ සඟ ගණ ගැන මෙසේ පවසයි.

පසැස් මදාරා විසිතුරු තුරෙහි	නද
විසෙස් විලස විහිදුණු කුසුමෙව්	සුවඳ
අපිස් ගුණෙන් යුතු යතිඳුන් හට	නිබඳ
සතොස් සිතෙහි පුරමින් නමදව	සබඳ[53]

මහා පරාක්‍රමබාහු රජතුමා දවස (ක්‍රි.ව.1164 - 1197) **ගලතුරු මුල** පිරිවෙනෙහි අධිපතිව වැඩ සිටියේ **නන්ද** නම් මහ තෙරනමකි. රජතුමා ඒ තෙරුන් වහන්සේගේ ගුණ කදම්භය හා කීර්තිය අසා රාජගුරු පදවිය භාර ගන්නා ලෙස කාරුණිකව ආරාධනා කර ඇත. කීර්ති ප්‍රශංසා කිසිවක් අපේක්ෂා නොකළ උන්වහන්සේ එය ඉතා කාරුණිකව නොපැකිළිව ප්‍රතික්ෂේප කළහ. මේ පිළිබඳව **මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය** ග්‍රන්ථයෙහි සඳහන් කරන ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** නාහිමියෝ අධිපතිකම් සරණ සොයා යන නායක පදවි ගැන දඟලන ඇතැම් වත්මන් භික්ෂූන්ට මෙය ආදර්ශයක් බව සඳහන් කර ඇත.

එහෙත් රජතුමා සිදුකළ ශාසනය පිරිසිදු කිරීමේ කාර්යයේහීද කළ ආරාධනාව පිළිගෙන රුහුණේ **දෙවිනුවර** සිට භික්ෂූන්වහන්සේලා පිරිවරාගෙන පොළොන්නරුවට වැඩම කොට ශාසන සංශෝධනයේදී කාශ්‍යප මහා තෙරුන් වහන්සේට සහාය වූහ. එදා ගලතුරු මුල පැවති තත්වය අවබෝධ කර ගන්නට මෙම සිද්ධිය පමනක් වැදගත් වෙයි.

ගලතුරු මුල වෙහෙර

ගලතුරු මුල පාය බිහි වූයේ **ගලතුරු මුල වෙහෙර** නිසා බව ප්‍රකටය. මහාවංශයේ පනස්හත් වැනි පරිච්ඡේදයේ ඒ බැව් සඳහන් වේ.[54] එහි සඳහන් වන ආකාරයට **දඨෝපතිස්ස** රජතුමාගේ (ක්‍රි.ව. 640-652) මුණුපුරු වූ කුමරුවෙකු පැවිදිව ඉතා ශීල සමාදානයෙන් යුක්තව ආරණ්‍යගතව වැඩ වාසය කර ඇත. උන් වහන්සේගේ ශීල සද්ධා ගුණය නිසා දේවතාවෝද ඒ ගුණයන් වර්ණනා කළහ. මෙම ප්‍රවෘත්තිය ඇසූ රජතුමා උන්වහන්සේ කරා එළැඹ තමන්ට අනුශාසනා කරමින් වැඩ වාසය කරන ලෙස ආරාධනය කළේය. ප්‍රථමයෙන් එය ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ රජතුමා නැවත නැවතත් ආරාධනා කොට මනා කොට සකසන ලද ප්‍රාසාදයක වස් වස්සවා උන්වහන්සේගේ අනුශාසනා පරිදි පාලනය කළේය.

---

51 මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමි -107 පිටුව

52 මහාවංශය - 60 පරිච්ඡේදය -84 ගාථා

53 කෝකිළ සන්දේශය -36 කවිය -වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය -2009- සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

54 මහාවංශය - 57 පරිච්ඡේදය -31-39 ගාථා

ඒ යතිවරයාණන් වහන්සේ **සේලන්තර** විහාරයෙන් (ගලතුරු මුල වෙහෙරින්) නික්ම මේ විහාරයන්හි භික්ෂූන් රැස්කොට විසූ සේක්ද ඒ විහාරය **සෙලන්තර** සමූහයයි ප්‍රසිද්ධියට පැමිණ ඇත.

එකළ රුහුණේ ගලතුරු මුල නමින් වූ ආරාණ්‍ය සේනාසනයක් පැවති අතර එයින් නික්ම ආ භික්ෂූන් වහන්සේ වැඩ වාසය කළ ස්ථානය ගලතුරු මුල නම් වූ අතර එය දේවාලයක් සමීපව පිහිටි බවද යථෝක්ත ගලතුරු මුල රුහුණු රටේ ප්‍රධාන විහාරස්ථානයක් ලෙස සැලකූ බවද මහාවංශය පෙන්වයි.

ගලතුරු මුල ආරාණ්‍ය සේනානසයෙන් පැමිණි භික්ෂූන් වහන්සේ වැඩ විසූ ගලතුරු මුල වෙහෙර වර්තමාන දෙවිනුවර රජමහ විහාරස්ථානය ලෙස විශ්වාස කළ හැකි බවද ඒ අසළ පිහිටි දේවාලය ශ්‍රී විශ්ණු දේවාලය නමින් ප්‍රසිද්ධ උපුල්වන් දේව මන්දිරය බවද ගන්දර **පී.ඩී.එස්.වීරසූරිය** මහතා **දෙවුන්දර ඉතිහාසය** පොතෙහි දක්වයි[55]. මෙම ගලතුරු මුල පාය **තොටගමුවේ ශ්‍රී රාහුල** හිමියන් **පරෙවි** සන්දේශයේහි වර්ණනා කර ඇත.[56]

රුහුණට පැමිණි **I වැනි දාඨෝපතිස්ස** රජතුමා (ක්‍රි.ව. 640- 632) කළක් දෙවිනුවර වාසය කර ඇති බව මෙම ආයතනයේ තොරතුරු පරීක්ෂා කරන විට පැහැදිලි වේ. එසේ සිදු වී ඇත්තේ රජතුමාගේ මුණුබුරෙකු වූ යතිවරයාණන් වහන්සේ නමක් මෙහි වැඩ විසූ නිසා බවද ප්‍රකටය.

II වැනි වීරබාහු (ක්‍රි.ව. 1391 -1397) රජ සමයෙහි සිදු කරණ ලද සංඝ සමගියට ගලතුරුමුල මෛත්‍රීය හිමියන් බෙහෙවින් උපස්ථම්භක වූ බව **ශාසනාවතරණ** ග්‍රන්ථයෙහි සඳහන් කරයි.

රුහුණේ ප්‍රාදේශීය පාලකයෙකු වශයෙන් **කතරගම** පාලන මූලස්ථානය කර ගත් **ලෝකේශ්වර** රජතුමාගේ (ක්‍රි.ව. 1244- 1263) මෙහෙසිය ගලතුරු මුල පාය තෙමහල් මන්දිරය ප්‍රතිසංස්කරණය කොට මහ සඟනට පූජා කරන ලද බව **මහාවංශය** පවසයි.[57]

සිංහල බෝධිවංශය රචනා කරන ලද විල්ගම්මුල සඟරජ මාහිමියන්ගේ ආචාර්ය වරයාණන් වූ ෂඩ්භාෂා පරමේෂ්වර ත්‍රිපිටක වාගීශ්වර **ශ්‍රී රාජගුරු** ගලතුරු මුල හිමිනමක් තොටගමු රජමහා විහාරාධිපතිව වැඩ විසූ බවද ප්‍රකටය.

රත් පත් සුළුපාය

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් **දෙවුන්දර** දේවාල භූමියේ **රත්පත් සුළුපාය** නමින් යුත් සංඝාවාසයක් පිළිබඳව **පරෙවි** සන්දේශයෙහි සඳහන් කරයි. මෙය **ගලතුරු මුල** තරම් විශාල වූවක් නොවන බව **සුළුපාය** යන යෙදුමෙන්ම අදහස් කරන්නට පිලිවන.

දුල සක්මන් පිරිසිදු සිව් සිල්	සොදුරු
නල සක්මන් බිඳි මිස දිටු තුරු	පදුරු
සල සක්මන් තර කර විසු	තෙරුනැදුරු
බල සක්මන් **රත්පත් සුළු පා**	මැදුරු[58]

මෙම මැදුර තඹපතින් සෙවිලි කරන ලද දැකුම්කළු අගනා ප්‍රාසාදයක් බව තොරතුරු වල සඳහන් වේ. එහෙත් මේ **රන්පත් සුළුපාය** පිහිටා තිබුනේ කොහිදැයි කියන්නට තරම්වත් නටඹුන් කිසිවක් දක්නට නැත.

---

55 දෙවුන්දර ඉතිහාසය - ගන්දර පී.ඩී.එස්.වීරසූරිය, 70 පිටුව - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1949

56 පරෙවි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ,153 කවිය

57 මහාවංශය - 60 පරිච්ඡේදය

58 පරෙවි සන්දේශය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය - 154 කවිය, සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2012

මෙම ස්ථානයහි **තිලක** පිරිවෙන හා **නන්දන** පිරිවෙන යනුවෙන් හැඳින්වෙන විද්‍යාස්ථාන දෙකක් පැවති බව තොරතුරු හෙළි වෙයි. **තිලක** පිරිවෙන්පති හිමියන් ගැන සඳහන් වෙනවා විනා එම පිරිවෙන ආරම්භ කළ අයෙකු ගැන තොරතුරක් නොමැත. **තිලක** පිරිවෙන්පති හිමියන් විසින් **කෝකිළ** සන්දේශය කළ බව සඳහන්ව ඇත.

නන්දන පිරිවෙන

මහා පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි.ව. 1169 - 1197) බෑනණුවන් වන වීරබාහු කුමරුන් විසින් **නන්දන** පිරිවෙන කරවන ලද බව සඳහන් වේ.

චන්ද්‍රභානු නම් ජාවක (මැලේ) කුමාරයා විශාල සතුරු සේනාවක් රැගෙන ලක්දිව ආක්‍රමනය කළ බව ඉතිහාසගතව ඇත. සූර වීර රණකාමී **වීරබාහු** කුමරුවන් දෙවිනුවර උපුල්වන් දෙවියන්ට බාරයක් වී සතුරන්ට මුහුණ දුන්නේය.

චන්ද්‍රභානුට විරුද්ධ සටනේදී **වීරබාහු** කුමරුන් මෙහෙය වූ සිංහල බල සේනාවට විශිෂ්ඨ ජයක් හිමි විය. මේ විජයග්‍රහණයට තුඩුදුන් මූලික හේතුව **දෙවිනුවර උපුල්වන්** දෙවිරජුගේ ආශිර්වාදය හේතුවෙන් බව හිස් මුදුනින් පිළිගත් **වීරබාහු** කුමාරයා **දෙවිනුවරට** පැමිණ විශාල දේව පූජාවක් පවත්වා දේව ප්‍රසාදය තවදුරටත් ලබා ගත්තේය. එයින් නොනැවතුනු කුමාරයා දේවාශිර්වාදය ලබා ගැනීම සඳහා පොදු ජනතාවගේ ප්‍රසාදය ඇති වන පරිදි අගනා මන්දිරයක් තනවා මහසඟනට පිදීය. **නන්දන පාය** නමින් හැඳින්වුණු මේ මන්දිරයේ ආරම්භ කළ පිරිවෙන **නන්දන** පිරිවෙන නමින් පතළ විය.[59] නන්දන පිරුවන නමින් ද ප්‍රසිද්ධ වූ මෙය ක්‍රි.ව. 1257 වැන්නෙහි නිර්මාණය කරන ලද්දකැයි පැවසේ.[60]

නන්දි වෘෂභ රූපය

ශිව දෙවියන්ගේ වාහනය වූ **නන්දි** නම් වෘෂභයාගේ මනස්කාන්ත සෙල්මුවා රුවක් **දෙවිනුවර** රජමහා විහාරයේ උඩ මළුවේ දක්නට ලැබේ. මෙම රූපය පුරාණ **කයිසවැල්ලෙන්** සොයාගත් බව සඳහන් වේ. ප්‍රතිමාව හා වෘෂභ රූපයේ නිර්මාණ ක්‍රමයෙන් මෙම රුව එකළොස්වන හෝ දොළොස්වන සියවස් වලට අයත් ද්‍රවිඩ ශිල්පය අනුව කරන ලද්දක් බව පෙනේ. මෙම වෘෂභ රූපය මෙම දේවාලය **විශ්ණු** දේවාලය වශයෙන් භාවිතා වීමත් සමගම පිහිට වූ බවක් හැඟේ. මෙම රුව **කයිසවැල්ලෙන්** සොයාගත් බවට තොරතුරු ලැබෙන බැවින් ඇතැම් විට **කයිසවැල්ලේ** ශිව දේවාලයක් තිබෙන්නට ඇත.

දාගැබ් මළුවේ තවත් කුඩා ගණදෙවි රූපයක්ද දක්නට ලැබේ. එහෙත් එය කවර ප්‍රදේශයකින් ලැබුණු එකක් දැයි තොරතුරක් නැත. ඇතැම් විට මෙම ගණදෙවි රූපය රාම සුන්දර වෛශ්‍යයා විසින් කරවන ලද ගණදෙවි කෝවිලෙන් සොයා ගත්තක් විය හැක.

රාම රාවණා කුළුණ

දෙවිනුවර රජමහ විහාරස්ථානයේ උඩ මළුවට පිවිසෙන පිය ගැටපෙළ මුදුනේ තඹවන් පැහැයෙන් යුත් අඩි 06 ක් පමණ උසැති ගල් කුළුණක් දක්නට ලැබේ. එය පුරා විද්‍යාත්මක හා ඓතිහාසික වශයෙන් ඉතා වටිනා එකක් බව පෙනේ. උඩ මුදුන ථූපාකාරයක ස්වරූපයෙන් යුත් මෙම කුළුණේ විවිධ හැඩයෙන් යුතුවූ නිර්මාණය කරන ලද අතර අඩි 3 ක් පමණ ඉහළින් සතර පැත්තේ විවිධ කැටයම් කොටා ඇත. එහි එක් පැත්තක යුද්ධයෙන් පැරදී බිම ඇද වැටී සිටින රජෙකු නිරූපිතය.

---

[59] මහාවංශය - 30 පරිච්ඡේදය

[60] Ceylon Antiquary and Literary Register (Vol vi part iii)

මෙම කුළුණ රාම - රාවණා සටන සිහිවීම පිණිස කරවන ලද්දකැයි ඇතැමෙක් ප්‍රකාශ කරති. මෙම කුළුණෙන් **රාම - රාවණා** සටන සංකේතවත් කරන බව ප්‍රකාශ කරන ඔවුන් **රාම** රජුගේ හිස වැටුණු තැන කුළුණ ඉදි කොට ඇති බව පවසයි. එය තහවුරු කිරීම සඳහා **දෙවිනුවරට** නුදුරු **රස්සන් දෙනිය** නම් ග්‍රාමය එකළ රාක්ෂසයන් වාසය කළ ගම බවද සඳහන් කරයි. රාක්ෂස - දෙනිය, රාස්සන් - දෙනිය පසුව රස්සන් දෙනිය වී ඇත. එසේම දෙවිනුවරට නුදුරු වඳුරා දෙනිය නම් ගමක් ද වෙයි. එය **රාම - රාවණා** සටනට පැමිනි **රාමගේ** හමුදාවට අයත් **හනුමන්** සමඟ පැමිණි වඳුරන් සිටි ප්‍රදේශය බව සඳහන් කරයි.

දාපුළුසෙන් රජතුමා (I වැනි දප්පුල) (ක්‍රි.ව.661 - 664) **දෙවිනුවර** නගරය කරවා ඔහුගේ ප්‍රත්‍රයා වූ **ධනුර්ධරගේ** ද දේවිය වූ **සඳවන්** (චද්‍රවති) දේවියගේ ද රූපයන් කරවූ බවද ඉතිහාසයෙහි සඳහන් වෙයි. ඉහත කී කුළුණේ කැටයමෙන් නිරූපණය වන්නේ **ධනුර්ධර** කුමාරයා යැයි ඇතැම්හු ප්‍රකාශ කරති.

06.දෙවිනුවර පුදබිම්

(විහාරස්ථාන, දේවාල, කෝවිල් සහ දේවස්ථාන)

දෙවිනුවර හා තදාසන්න ප්‍රදේශය තුළ දිවයිනේ පමණක් නොව දේස දේශාන්තර වල පවා ප්‍රකට විහාරස්ථාන, දේවාල, කෝවිල් සහ දේවස්ථාන රාශියක් දක්නට ලැබේ. විශේෂයෙන්ම මෙම පුජාභූමි සියල්ලටම එකසේ දීර්ඝ මෙන්ම පෞඩ ඉතිහාසයක් දක්නට ලැබේ. එසේම මෙම පුදබිම් එදා මෙන්ම අදත් ජනී ජනයාගේ අප්‍රමාණ ගෞරවාදයට මෙන්ම භක්තිපූර්වක වන්දනාමානයට බඳුන් වී ඇත.

දෙවිනුවර බෞද්ධ පූජා භූමී අතර දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහා විහාරස්ථානය ප්‍රමුඛ වෙයි. එයට අමතරව ගන්දර පුරාණ මහා විහාරය, ගල්ගනේ පුරාණ විහාරය, ලංකා රජමහා විහාරය, ශ්‍රී පවර සිරි නිවේසාරාමය, උඩ අපරක්කේ ශ්‍රී සේපාලිකාරාමය, වන වාසල පුරාණ මහා විහාරය, කඩවැද්දූව තුන්බෝධි විහාරය, පාතේගම සිරි නිකේතාරාමය ප්‍රමුඛ වෙයි.

දේවාල අතුරෙන් දේස දේශාන්තර වල පවා ප්‍රකට ශ්‍රී උපුල්වන් විෂ්ණු දේවාලය ප්‍රමුඛ වන අතර සිංහාසන පෙදෙසේ සිංහාසන කෝවිලක්ද වෙයි.

මෙයට අමතරව දෙවිනුවර ගණ දෙවි දේවාලයක්ද පැවති බවට තොරතුරු අනාවරණය වෙයි. පැරණි ගණ දෙවි කෝවිල වැල්ලමඩමේ පැවති බව සංදේශ කෘතීන්ගෙන් තොරතුරු හෙළිදරව් වන අතර ශිව දේවාලය කයිසවැල්ලේ සමුදුර ආසන්නයේ පැවති බව හෙළිවෙයි. දෙවිනුවර නාග කෝවිල දෙවුන්දර අංක 02 සෙල්ලිපියේ සඳහන් වන්නේ නගරිස නීල කෝවිල යැයි ඇතමෙකු ප්‍රකාශ කරති. එය මාතර - තංගල්ල පාරේ අංක 101 සැතපුම් කණුව අසල මැද්දවත්ත ප්‍රදේශයේ ඇති නාගබෝධිය බව සැලවේ. දෙවොල් දෙවි දේවාලයක් තිබූ බවත් ප්‍රකාශ වෙතත් එය කවර ප්‍රදේශයක පිහිටියේ දැයි දැන ගැනීමට සාක්ෂි නැත.

දෙවිනුවර ප්‍රාදේශිය මහ ලේකම් බල ප්‍රදේශය තුළ ශ්‍රී මනිරතනාරාමය, ශ්‍රී මානිකාරාමය, මහමෙව්නා අසපුව, ශ්‍රී ජිනරදත්තාරාමය, ශ්‍රී සුබෝධාරාමය, සාම දීප විහාරය, සිරි නිකේතාරාමය, ශ්‍රී සුදර්ශනාරාමය, අශෝකාරාමය, ශ්‍රී විදර්ශී යෝගාශ්‍රමය, විජයරත්නාරාම විහාරස්ථානය, අබේසේකාරාමය, ශ්‍රී ජයවර්ධනාරාමය, පන්ථකාරාම විහාරස්ථානය, ජයබෝධිරාමය,සිරි පවර විජයාරාමය, ශ්‍රී සුධර්මාරමය, සුදම්මෝදමාරාමය, වඳුරාදෙණිය පුරාණ මහා විහාරය, ශ්‍රී නිගෝධාරාම සාම විහාරය, සිරි ආරියාරාමය, ග්‍රාම මණ්ඩපාරාමය, බෝමුරේ පුරාණ විහාරය, ශ්‍රී මණ්ඩලාරාමය, තඹගල ආරණ්‍ය සේනාසනය, ඉන්ද්‍රාරාමය, ධම් රැකි සිරිවඩන වෙහෙර, පුර්වාරාමය, සාම දීප විහාරය හා විජයානන්ද සංඝාවාසය යන විහාරස්ථාන ඇතුලත් වෙයි.

බැද්දෙගම්මැද්ද එගොඩවත්ත බෝධිය, පල්ලෙ අපරක්ක මුත්තෙට්ටුවත්ත බෝ කොටුව හාස්කම් සහිත ස්ථාන ලෙස ප්‍රකටය.

ගන්දර ප්‍රදේශයේ මහා භද්‍රකාලි දේවාලයක්ද දක්නට ලැබේ.

දෙවිනුවර දැනට ක්‍රිස්තියානි හෝ කතෝලික පල්ලි දක්නට නොලැබෙන අතර ගන්දර ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියක්ද දක්නට ලැබේ. මොහිදීන් ජුම්මා නමින් හැඳින්වෙන එය ප්‍රදේශයේ මුස්ලිම් ජනයාගේ අප්‍රමාණ ගෞරවයට සහ වන්දනාවට පාත්‍රවී ඇත.

දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහ විහාරය

දෙවිනුවර රජමහ විහාරස්ථානය අද හැඳින්වෙන්නේ **පරම විචිත්‍රාරාම රජමහ විහාරය** යන නමිනි. එක්තරා යුගයක එය **භූමි මහා විහාරය** යනුවෙන්ද හඳුන්වා ඇත.[61] **කිහිරැළි වෙහෙර**[62] , **ගිරිහෙළ වෙහෙර** යන නම් වලින්ද මෙම විහාරස්ථානය ප්‍රකටව තිබුනි.

දෙවිනුවර **බණ්ඩරවත්තේ විහාරය** යනු ක්‍රි.ව. 1813 දී **විලියම් ග්‍රැන්විල්** දිසාව නමින් ලියන ලද තැගී පත්‍රයක සඳහන් වේ.

මහාවංශයෙහි **I වැනි දප්පුල** (දාපුළුසෙන්) (ක්‍රි.ව. 659 -661) රජතුමා විසින් කිහිරැළි වෙහෙර කරවා දෙවියන් පිදීයැයි සඳහන් වේ.[63] එහි **කිහිරැළි** නාමය යෙදීමෙන් කිහිරි ලීයෙන් කළ දේව රූපයක් තිබූ බව පිළිගත හැක. එසේම නගරයට **දේව නගරය** යැයි නම් කර ඇත.

සාමි දප්පුල (දාපුළුසෙන්) රජතුමා විසින් මෙම විහාරස්ථානය කරවීමට පෙරද මේ ශුද්ධ භූමිය වැදගත් ආරාමයක් බවට පවතින්නට ඇතැයි **දේවානම්පියතිස්ස** රජ යුගයේ (ක්‍රි.පූ. 307 - 267) දෙතිස් ඵලරුහ බෝධි රෝපණයෙන් හෙළිවෙයි.

පොළොන්නරුවේ රජ කළ **මහා විජයබාහු** (ක්‍රි.ව.1055 -1110) රජතුමා දේව නගරයෙහි කැඩී බිඳී ගිය විහාරාරාම අංග ප්‍රතිසංස්කරණය කරණ ලද බව **මහාවංශය** කියයි. **මහා පරාක්‍රමබාහු** (ක්‍රි.ව. 1164 - 1197) **දෙවන පරාක්‍රමබාහු** (ක්‍රි.ව. 1250 -1285) **සිව්වන පරාක්‍රමබාහු** (ක්‍රි.ව. 1305 -1347) වීරබාහු (ක්‍රි.ව. 1207 - 12) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (ක්‍රි.ව. 1198 - 1207) **ලෝකේෂ්වර, මානවම්ම, දාඨෝපතිස්ස** ආදී රජවරුන් මෙන්ම ඈපාවරුන් මෙම විහාරස්ථානයට ගම් බිම් පූජා කර ඇති බව ඉතිහාසය කියාපායි. සිංහල රජවරුන් මෙම ගොඩනැගිලි කරවන්නටත් පෙර ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසේ මධ්‍ය භාගයේදී දෙවුන්දර ගැන බටහිර ගත්කතුවරුන් දැන සිටි බව සාක්ෂි තිබේ.[64]

දෙවිනුවර රජමහ විහාරය ගැන **තොටගමුවේ ශ්‍රී රාහුල** හිමියන් විසින් රචිත **පරෙවි** සන්දේශයෙහි මෙසේ සඳහන් වෙයි.

"සදන වෙනේ කිසල කැනේ සසල කොට
මලය ගිනේ මද පවනේ එන වෙතට
සිහිල සිනේ දැහැ ගිමනේ සෙමෙන් සිට
නුඹ වදනේ පළමු වෙනේ වෙහෙර තට"[65]

දෙවිනුවර තිලක පිරිවෙන් පති හිමියන් විසින් රචිත **කෝකිළ** සන්දේශයෙහි විහාරස්ථානය ගැන සඳහන් කරන්නේ මෙසේය.

"සුවිමල් සපිරි සඳරැස් වන් එක පැතිර
එකතුල් ලකළ රළ වැළ ලෙළ කිරි සයුර

---

61 දෙවුන්දර අංක 2 සෙල් ලිපිය

62 මහාවංශය 45 පරිච්ඡේදය - 55 පිටුව - "කිහිරැළි වෙහෙරකොට දෙවියන් පිදී"

63 මහාවංශය - 43 පරිච්ඡේදය -55 .ගාථා

64 Tennent History VOL II Part VII - ටොලමීගේ විස්තරය

65 පරෙවි සන්දේශය - 148 කවිය- වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය - 2012 - සී.සඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

හැමකල් දිමුතු මුතු වැලි තුළ මළු	පවර
සුවිසල් මෙපුර වැද වෙහෙරට වදු	මිතුර"[66]

කෝකිළ සන්දේශකරු සිය දූතයාට සුවිසල් සපිරි පූර්ණ චන්ද්‍රයාගේ ඉතා නිර්මල කාන්තිය පැතිර පවතින්නාවූ සඳරැස් පතිත වන කිරි සයුර වන් දීප්තිමත්ව බබළන්නාවූ මුතු වැනි වැලි තලයෙන් යුක්ත වූ අංග ඇති නගර මධ්‍යයෙහි ඇති ඉතා විශාලවූ විහාරයට පිවිසෙන ලෙස කියා සිටියි.

බුදු මැදුර

එපමනක් නොවේ.විචිත්‍ර චිත්‍ර වලින් සුසැදි බුද්ධ මන්දිරයෙහි සිත් පහදවන අයුරින් බබළන නිර්මල බුද්ධ ප්‍රතිමාවන්ගේ ශ්‍රී පාද පද්මයන් වැඳ නමස්කාර කරන ලෙසද **කෝකිළ** සන්දේශ කාරක හිමියන් මෙසේ පවසයි.

"සිතියම් වලින් විසිතුරු මුනි මැදුරු	වල
මනරම් ලෙසින් බබළන මුනි රූ	නිමල
සිතපෙම් වඩා වැඳ සිරිපා යුග	කමල
බව ගිම් නිවන නිවනත් කර සැප	විපුල"[67]

මෙම කවියට අනුව දෙවිනුවර රජමහ විහාරස්ථානයේ දාගැබ සටාකාර වේ. එහෙත් අද මෙම දාගැබ ප්‍රතිසංස්කරණය කර ඇත්තේ බුබ්බුලුකාර අන්දමිනි. මෙම දාගැබ දෙවිනුවර නගරය පිහිටවූ **I වැනි දප්පුල** (දාපුළුසෙන්) රජතුමාගේ කෘතියකි.

මෙම චෛත්‍යයේ ආරක්ෂාවට පොළොන්නරුවේ රජකළ මහා විජයබාහු (ක්‍රි.ව.1065 - 1111) රජතුමා වටදාගෙයක් කරවන ලද්දේ ක්‍රි.ව. 1065 දීය. අදත් දාගැබ වටා ගල්කණු කිහිපයක නටඹුන් දැකිය හැක.

තිසර සන්දේශයෙහි බුදු මැදුරත් බෝධියත් මහ සඟනත් දස පද හැල්ලකින් මෙසේ වර්ණනා කරයි.

"වැජඹීමෙන් උදම් - ලත් මේ දෙවිඳු	නිසයුරු
සයුරු අයුරු මෙවෙහෙර බබළන	රැසිරු
රැසිරු සරින් යුතු තුන් දියටෙක	ඉසුරු
ඉසුරු නිවනුදු දෙන - මුනි රූද ලකුණෙන්	සරු
නිසරු බවට ගිමට සෙවනෙත එක	මිතුරු
මිතුරු යුරු සිරින් අයන ළ පවි	ඇදුරු
අඳුරු රැසෙව් දුම රදුනුදු සෙත්	කතුරු
කතුරු වන් සිදින මිසදිටැඹුල	පතුරු
පතුරු වන තෙදැකි දිව විමනෙක	මිතුරු

---

[66] කෝකිළ සන්දේශය - 33 කවිය - වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය -2009

[67] කෝකිළ සන්දේශය - 34 කවිය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය -2009

මිතුරු සඳ මෙසග ගණ වැඳ කර යතුරු[68]

මෙම දස පද හැල්ලෙන් බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය වැඳීමට ව්‍යංගයෙන් කියැවින.

ඔත් පිළිම ගේ

විහාරස්ථානයට දකුණු පසින් ඔත් පිළිමය පිහිටා ඇත. සැතපෙන (හොත් - ඔත්) පිළිම රුවක් මේ ගෙයි වූ බැවින් මෙම නාමය ව්‍යවහාරයට පත්විය. මෙම **ඔත් පිළිම ගේ** අත්තිවාරම පමනක් දැනට දක්නට ලැබෙන අතර පැරණි ප්‍රතිමා මන්දිරය වෙනුවට අලුත් මන්දිරයක් තනා ඇත. ඉපැරණි කාළයෙහි තනවා තිබූ **ඔත් පිළිම ගේ** ඔත් පිළිමය පමණක් දැනට දක්නට ලැබේ.

ඔත් පිළිම ගේ කුරුණෑගල රාජධානිය කරගත් **IV වැනි පණ්ඩිත පරාක්‍රමබාහු** (ක්‍රි.ව. 1305 - 1347) රජතුමාගේ කෘතියක් ලෙස සඳහන් වෙයි. **මහාවංශයෙහි** සඳහන් වන පරිදි එතුමා විසින් දෙමහල් පිළිමගෙය කරවා හාත්පස පිහිටි අරමද **බෙලිඅත්තේ ගැටමාන්න** නම් ගමද පූජා කර ඇත.[69]

මෙම ප්‍රතිමා මන්දිරය තොටගමුවේ **ශ්‍රී රාහුල** මාහිමියන් **පරෙවි** සන්දේශයෙහි මෙසේ දක්වයි.

"සුවිසි අසෙකි සතලා අම නිවන් පුරා
සැසිසි මුනිඳ සැපසේ සැතපුණු අයුරා
පැදිසි රිවි කිරණ ගෑ වලස මනහරා
තෝ නිසි ලෙසින් වැඳ ඔත් පිළිම හිමිවරා"[70]

හිටි පිළිම ගේ

හිටි පිලිම ගේ පිහිටා තිබී ඇත්තේ **ඔත් පිළිම** ගෙය ඉදිරිපිට යැයි අනුමාන කෙරේ. එය තිබුනු තැන පිහිටි සෝපාණ පංතියක් හා අත්තිවාරම් සමහරක නටඹුන් අදත් දක්නට ලැබේ. ඉතා අලංකාර සඳකඩ පහනක් මේ නටඹුන් අතර දක්නට හැක.

ශ්‍රී රාහුල හිමියන්ගේ **පරෙවි** සන්දේශයෙහි මෙම හිටි පිළිමගෙය ගැන මෙසේ සඳහන් වේ.

"සැඩ ලෙටි මරු පැරයු ඉඳ බෝ තුරු ලගෙහි
දිඩ දිටි රුවෙල් කසුබන්ලු අට මගෙහි
මැඩ පැටි කරන දිටු පවඳුරු සතනගෙහි
වැඩ සිටි පිලිම හිමි වඳු සිටි පිළිමගෙහි"[71]

හිටි පිළිමය සහිත **පිළිම මන්දිරය** තෙමහල් පායකි. එය සිව්වැනි **බුවනෙක බාහු** (ක්‍රි.ව. 1344-1353) රජු දවස නිමකරන ලද්දකි.

නිකාය සංග්‍රහයේ හිටි පිළිමගෙය පිළිබඳ පුරාවෘත්තය සඳහන් වේ. ඒ තොරතුරු අනුව ගම්පල රජ සමයෙහි විසූ **සතරවෙනි බුවනෙකබාහු** (ක්‍රි.ව. 1347 -1361) රජතුමාගේ අමාත්‍යවරයෙකුගේ ඉදිකිරීමකි.

බෝධිය

දෙවිනුවර රජමහ විහාරස්ථානය ගැන කියන විට බෝධිය ගැන විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. මෙම බෝධිය **ශ්‍රී රාහුල** හිමියන් රචිත **පරෙවි** සන්දේශයෙහි සඳහන් වන්නේ මෙසේය.

---

[68] තිසර සන්දේශය - 26 කවිය - මහාචාර්ය ඒ.වී.සුරවීර සංස්කරණය- 1991- සී.ස.ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

[69] මහාවංශය -90 පරිච්ඡේදය

[70] පරෙවි සන්දේශය -151 කවිය- වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය 2012 - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

[71] පරෙවි සන්දේශය - 150 කවිය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය -2012 - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

"ගුණ බෝ මුනි රජුට මුළු තුන් ලෝ කිරළු
පෙර ලෝ ඇදුරු පුදනුව බැරම ලොවිනළු
කල දෝ යටග බැඳ නිල්මිණි සත එකළු
වැඳ බෝ දුම්දු මොක් පුර සිරිලබ යහළු"[72]

බෝධිය ගැන පවසන්නේ මේ අයුරිනි.

"සිදුරු අසන තුරු පෙති මහ වියත සර
මහරු සුදු කැදින් රැදි මුනි ඉටු මිතුර
සසරු නිමල් කැන් සත් පුදැති පින කර
සොඳුරු දුම්දු සඳ පිණිපා කර මිතුර"[73]

ශ්‍රී රාහුල හිමියන් රචිත **පරෙවි** සන්දේශයෙහි **ගලතුරු මුල පාය** නමින් හැඳින්වෙන සංඝාවාසයක් තිබූ බවත් සඳහන් වෙතත් එහි නටඹුන් වත් අද දක්නට නැත.

"සලතුරු ටැඹින් සුලකළ තුන් මහල් යෙදූ
නිලතුරු කිකිණි බඳ රන් දද පෙළ සුසැදු
දුලතරු වැලෙව් පලගෙහි මුතුලැල් සිනිඳු
ගලතුරු මුළ පායෙහි මහ සඟන වඳු"[74]

මෙම තෙමහල් සංඝාවාසය ඉදි කොට මහ සඟනට පූජා කළේ **මහා විජයබාහු** රජතුමාගේ බිසව විසිනි.[75] රුහුණේ පාලකයෙකු වූ **කතරගම ලෝකේශ්වර** රජතුමාගේ බිසව මෙම සංඝාවාසය අලුත්වැඩියා කරන ලද බව පැවසේ.

රත් පත් සුළු පාය

ගලතුරු මුල පාය තරම් විශාල නුවූ **රත්පත් සුළුපාය** නම් වූ සක්මන් මලුවකින්ද යුක්ත වූ තවත් සංඝාවාසයක් තිබූ බව **තොටගමුවේ ශ්‍රී රාහුල** හිමියන් විසින් රචිත **පරෙවි** සන්දේශයෙහි සඳහන් වෙයි.

"දුල සක්වන් පිරිසිදු සිවි සිල් සොඳුරු
නල සක්වන් බිඳි මිසදුටු තුරු පැදුරු
සල සක්මන් තර කර විසු තෙරුනැදුරු
බල සක්මන් රත්පත් සුළු පා මැදුරු"[76]

මෙය තිබුනේ කවර ස්ථානයක දැයි කීමට සාධක නැත. එසේම **චන්ද්‍රබාහු** කුමාරයා සමඟ සටන් වැඳ ජයගත් **ජයබාහු** කුමාරයා **නන්දන** පිරිවෙන නමින් ප්‍රසිද්ධ වූ පිරිවෙනක් කළ බව **මහාවංශයේ** සඳහන් වෙයි.[77] මෙය ක්‍රි.ව. 1257 දී කරවන ලද බව සඳහන් වේ.[78]

---

[72] නිකාය සංග්‍රහය - "එකල මෙහෙණවර වංශාභිජාත සේනා ලංකාධිකාර සෙනෙවිරත් නම් මන්ත්‍රීශ්වරයාණ...."

[73] කෝකිළ සන්දේශය -35 කවිය -වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය -2009

[74] පරෙවි සන්දේශය -153 කවිය

[75] මහාවංශය - 60 පරිච්ඡේදය -84 ගාථාව

[76] පරෙවි සන්දේශය -154 කවිය - වී.ඩී.එස්. ගුණවර්ධන සංසීකරණය 2012- සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

[77] මහාවංශය - 60 පරිච්ඡේදය-84 ගාථාව

පුරාණ වනවාස විහාරය

මෙම අතිපෞරාණික පූජනීය මහා විහාරස්ථානය මාතර - තංගල්ල පාරේ 104 -105 වැනි සැතපුම් කණු අතර දකුණු දෙසින් දෙවුන්දර නැගෙනහිරට අයත් වාව්ව ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

වාව්ව වනවාස පුරාණ මහා විහාරය යන නමින් ඇත අතීතයේදී හැඳින්වූ මෙම විහාරස්ථානය දැනට වනවාසල පුරාණ රජමහ විහාරස්ථානය නමින් හැඳින්වේ. අතීතයේදී මෙම ප්‍රදේශය මහා වනයක් වශයෙන් පැවති අතර ඒ නිසාම විහාරස්ථානයට **වනවාස** විහාරස්ථානය නමින් ප්‍රකට වූ බව ජනශ්‍රැතියෙහි සඳහන් වේ. මෙයට වඩා වෙනස් මතයක්ද ඇත. එනම් දෙවුන්දර රජමහ විහාරවාසී විදර්ශන ධුරධාරී තෙරුන් වහන්සේලා විවේක සුවය සඳහා වනවාසය රිසි වූයේ මෙම ස්ථානයෙහිය. එනිසා මෙම ස්ථානයට වනවාස යන නාමය ව්‍යවහාර වූ බවය. එය වඩාත් තහවුරු වන්නේ අතීතයේදී මෙම ප්‍රදේශය වනගත ප්‍රදේශයක් වූ බැවිනි.

මෙම විහාරස්ථානය වඩාත් පූජනීය තත්වයට පත්වන්නට ඇත්තේ අද වන විටත් ඉතාමත් දහම් සිසිලසක් ලබා දෙමින් වැඩ සිටින දෙතිස් ඵලරුහ බෝධීන් වහන්සේ නිසාය. අතීත පුරා කථා වලට අනුව **දේවානම්පියතිස්ස** (ක්‍රි.පූ. 307 -267) රජතුමා විසින් දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේලා කිහිපනමක් වැඩමවාගෙන කතරගම දෙසට ගමන් කරන අතරතුර මෙම ස්ථානයේදී ගිමන් හැරීමට නැවතී බෝධිය රෝපණය කළ බවය.

මෙම ස්ථානයේ දිනපතාම බෝධි පූජා පවත්වන අතර බොහෝ පිරිසකගේ ගැටළු වලට සහනයක් ලබාදීමට මෙම බෝධීන් වහන්සේට හැකියාව ඇති බව පැවසේ. බොහෝ අනුහස් සහිත බෝධියක් බව ප්‍රචලිතය.

මෙය **සිංහල බෝධි වංශයට** ද ඇතුළු වී තිබෙන අතර බුදු සමය ලක්දිව ප්‍රචාරණය වන සමයෙහිද ජනාකීර්ණ ප්‍රදේශයක් වූ බව ඉන් හෙළිවෙයි. මෙහි ප්‍රතිමා ගෘහයක් තිබූ බවට නටඹුන් දක්නට ලැබේ. මෙම පන්සලේ පැරණි සීමා මාලකයක්ද පිහිටා ඇති අතර ප්‍රදේශය පුරා පන්සල් වල උපසම්පදා විනය කර්ම කටයුතු සඳහා මෙම සීමා මාලකය භාවිතා කළ බව සඳහන් වේ.

දැනට විහාරස්ථානයේ පවතින සංඝාවාසය 1895 වර්ෂයේ පමණ ඉදිකරණ ලද්දක් බවට සඳහන් වේ. ක්‍රි.ව. 1914 දී පූජ්‍ය **දෙවුන්දර ධම්මානන්ද** හිමියන් විසින් **ශ්‍රී ධර්මරක්ෂිත** නිකාය පිහිටුවා අපමණ සාසන සේවාවක් ඉටුකළ **අත්තුඩාවේ** මාහිමියන් සිහිවීම පිණිස උන්වහන්සේගේ නමින් පිරිවෙනක් ආරම්භ කොට මෙම ස්ථානයෙහි පවත්වාගෙන ගොස් තිබේ.

ගල්ගණේ පුරාණ විහාරය

දෙවිනුවර විහාරවාසී භික්ෂූන් වහන්සේලා වාසය කළ ඊටම අයත් විහාරස්ථානයක් ලෙස **ගල්ගණේ පුරාණ විහාරය** හැඳින්වේ.

මාතර - තංගල්ල පාරේ දෙවුන්දර කඩවීදිය අසලින් උතුරු දෙසට **ගල්ගණේ** පාරේ සැතපුම් 1/2 ක් පමණ තුදුරින් මෙම විහාරස්ථානය පිහිටා ඇත. දෙවිනුවර ග්‍රාම නිලධාරී වසමට මෙම විහාරස්ථානය අයත්ය.

ගල්ගණේ යන්නෙහි **ගණ** යනු සංඝ සමූහය යන්න අදහස් වේ. මෙහි සංඝයා වහන්සේලා විශාල පිරිසක් වාසය කරන්නට ඇති බව ඒ අනුව දැක්විය හැකිය. මෙම විහාරස්ථානයේ ඓතිහාසික බව සනාථ කරන්නට ඇති බව ඒ අනුව දැක්විය හැකිය. මෙම විහාරස්ථානයේ ඓතිහාසික බව සනාථ කරන්නට මෙහි පවතින බෝධිය දැක්විය හැක. මෙය ඉතා හාස්කම් සහිත බෝධියක් බව ගැමියන්ගේ දැඩි විශ්වාසයයි.

---

[78] Ceylon Antigvary and Literary Register (VOL VI part III)

මෙම විහාරස්ථානයේ පැරණි විහාර මන්දිරයක්ද වෙයි. විහාර මන්දිරය තුළ සමාධි මුද්‍රාවෙන් නෙළන ලද බුද්ධ ප්‍රතිමාවකි. එසේම ඇතුලත වටේටම පිහිටි බුදු පිළිම රාශියකි. මේ අතර විශාල සැතපෙන පිළිම වහන්සේ නමක්ද වෙයි.

ඉතාමත් දර්ශනීය භූමිභාගයක පිහිටි කුඩා චෛත්‍යයකි. විහාරස්ථානයේ දක්නට ලැබෙන ඉතා හාස්කම් සහිත දැඩිමුණ්ඩ දේවාලයකි.

මෙම විහාරස්ථානයේ විසූ භික්ෂූන් වහන්සේ නමක් යකුන්ගෙන් වැඩගත් පුවතක් ප්‍රදේශවාසීන් අතර පවති. පූජ්‍ය හෙල්ලල ධම්ම රතන හිමියන් වර්තමානයෙහි විහාරාධිපති ධූරය හොබවයි.

ලංකා රජමහ විහාරය

ලංකා රජමහ විහාරය, තලල්ල දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් ඓතිහාසික පූජා භූමියකි. අනුරාධපුර යුගයට අයත් මෙහි ඉපැරණි චෛත්‍යයද බෝධියද බුදුගෙයද එම පෞරාණික බව ප්‍රකට කරවයි.

විහාරස්ථානයේ රෝපිත බෝධීන්වහන්සේට භාරහාර වී පූජා සිදු කිරීමෙන් රෝග පීඩා උවදුරු දුරුවන බවට ජනතාව තුළ ඉමහත් විශ්වාසයක් පවති. එමෙන්ම මෙහි ඇති විෂ්ණු කතරගම දේවාල දෙකෙහි පුද පූජා කිරීමෙන්ද යහපත් ප්‍රතිඵල ගෙන දෙන බවටද බැතිමත්හු විශ්වාස කරති. එමනිසා අවට ගම්වලින් මේ පුද බිමට පැමිණ පුද පූජා සිදු කරති.

ලංකා රජමහ විහාරයේ බුදු පිළිම නෙළා ඇත්තේ නා දැව වලිනි. ඒ මත බදාමවලින් අලංකාර කොට ඇත. පිළිමවල සිවුරු සකසා ඇත්තේ කිතුල් අරටුවලිනි. පොළොන්නරු යුගයේදී මහා විජයබාහු (ක්‍රි.ව. 1065-1120) රජතුමා විසින් දෙවිනුවර පුදබිම ප්‍රතිසංස්කරණය කිරීමේදී මේ විහාරයද ප්‍රතිසංස්කරණය කර ඇති බව ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වෙයි.

මේ විහාරස්ථානයේදී දේව පූජා සිදු කොට ඇත. ඒ සඳහා රජතුමාද සහභාගී වී ඇත. පොල්ගැසීම සඳහා භාවිතා කරන ලද ඉපැරණි ගලක්ද විහාරස්ථානයේදී දැක ගැනීමට පුළුවන. කෙම්මුර දිනවලදී රජතුමා විසින් විශේෂ දේව පූජා සිදු කළ අතර එය සිදු කරන ලද ජනතාව මේ විහාරස්ථානය අවට පදිංචි කොට ඇත. **ගණිතගොඩ** ලෙස එම ප්‍රදේශය අදත් ව්‍යවහර වෙයි.

ලංකා රජමහ විහාර භූමියෙහි ඉපැරණි රජ මාළිගයක් පිහිටා තිබූ බවද කියැවේ. ඇතමෙකු විශ්වාස කරන්නේ එය දෙවිනුවර ප්‍රදේශයේ විසූ පාලකයෙකුට අයත්ව තිබූ ගමකි. එම රජු **දෙවැනි දප්පුල** (ක්‍රි.ව. 664- 673) ලෙසද ඇතැම්හු සලකති. එම රජු මාළිගාවේ නටඹුන් තවමත් විහාරයේ දක්නට ඇත. රජ මාළිගය විහාරයක් කොට මහා සංඝයාට පූජා කළ බව සිතිය හැකිය.

මෙහිදී හමුවූ ගඩොල් අනුරාධපුර සමයේ මැද භාගයට අයත් යැයි සැලකිය හැක. එසේම **ලංකා රජමහ විහාරස්ථානයේ** තිබී සොයා ගන්නා ලද කහවනු නමැති ඉපැරණි කාසි කැබලිද එම යුගයට ම අයත් ඒවා බවටද විශ්වාස කෙරේ.

මාතර තංගල්ල ප්‍රධාන මාර්ගයේ තලල්ල දකුණ පිහිටා ඇති **ලංකා රජමහ විහාරය, ලංකා තිලක විහාරය** ලෙසද ඇතැම් කාලවලදි හඳුන්වා දී ඇති බව විහාරයට පූජා කරන ලද සන්නස් වල සඳහන් වෙයි.

ගන්දර පුරාණ මහා විහාරය

ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් **ගන්දර පුරාණ මහා විහාරය** දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගන්දර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත. මෙම විහාරස්ථානය සංචාරක ආකර්ශනය දිනාගත් වෙහෙර, විහාරස්ථානය, ප්‍රදීපාගාර, සුන්දර වෙරළ තීරය ආදි ස්ථාන රැසකින් සමන්විත භූමියක පිහිටා ඇත.

ඒ සියල්ලටම වඩා **ගන්දර පුරාණ මහා විහාරයේ** ඉතිහාසය විවිධ රසංලිප්ත මෙන්ම බොදුබැතිය නංවන ජනශ්‍රැති රාශියකින් ද වෙලී පවති.

සිංහලේ හාමුදුරුවන් නමින් ප්‍රකට **කඳුබොඩ රතනජෝති** මාහිමියන් විසින් 18 වෙනි සියවසේ ආරම්භ කරණ ලද **ගන්දර පුරාණ මහා විහාරය** පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත්කමක් උසුලයි. පෞරාණික බුදු මැදුර පිරික්සන විට පෙනී යන කරුණු අනුව පිට මාලයේ බිත්තිවල ඇඳි රූප විවිධ කාල වකවානු නියෝජනය වන බව පෙනේ. මේ නිසා පෞරාණික මෙන්ම පුරා විද්‍යාත්මක වශයෙන්ද ඉතා වැදගත්කමක් හිමිවේ. මේ නිසා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් බුදු මැදුරත් පොත්ගුල් ගොඩනැගිල්ලත් විහාරස්ථානයේ ඇති කෞතුක භාණ්ඩ සියල්ලත් සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කෙරේ.

චෛත්‍යරාජයාණන් වහන්සේ පසුකාලීනව නිමවා ඇති බව මල් ආසනයේ සඳහන් වර්ෂයට අනුව අනුමාන කල හැක. බු.ව. 2451 දී එය නිමවූ බව දැක්වීමෙන් වර්ෂ 110 ක් පමණ වෙතැයි සිතිය හැක. **ගන්දර පුරාණ මහා විහාරයේ** දැනට දක්නට ලැබෙන පැරණි තඹ භාණ්ඩ, පන් භාණ්ඩ, කාසි හා යකඩ භාණ්ඩ, පෝසිලේන් භාණ්ඩ, පැරණි තිර රෙදි ,ලේන්සු, සෝමන් ආදී පැරණි රෙදි පිළි සංරක්ෂණය සඳහා යොමු කිරීමෙන් එහි ඇති පෞරාණික හා පුරා විද්‍යාත්මක අගය කෙතෙක් දැයි වටහා ගත හැක.

පඩි පංසල, ගල්පඩි පංසල යන අන්වර්ථ නාමයන්ගෙන් ද ප්‍රකට **ගන්දර පුරාණ මහා විහාරය** ආරම්භ කළ **කඳුබොඩ රතනජෝති** හිමියන් දක්ෂ වෛද්‍යවරයෙකු මෙන්ම ගුප්ත ශාස්ත්‍රයෙහිද කෙළ පැමිණි හිමි නමකි. ප්‍රදේශයේ ප්‍රකට ජනකතා අනුව උන්වහන්සේ ඇස් වෙදකමෙන් සහ මන්ත්‍ර ශාස්ත්‍ර අංශයෙන් විස්කම් දක්වා ඇත.

කඩවැද්දූව තුන්බෝධි විහාරය

වැලිවිට සංඝරාජ මාහිමියන් විසින් කන්ද උඩරටින් ආරම්භ කරන ලද බෞද්ධ පුනරුදය එම කාලයේ සිටම පහතරට බෙදාහළ පුදබිමක් ලෙස **කඩවැද්දූව තුන්බෝධි රජමහ විහාරය** අතිශය වැදගත්කමක් උසුලයි.

දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් ප්‍රදේශයට අයත් **කඩවැද්දූව බටහිර** ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මෙම පුදබිම පිහිටා ඇත. **මුල්ගිරිගල විහාරය** යළි පහතරට බෞද්ධ කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන ලද්දේ පූජ්‍ය **වටරක්ගොඩ ධම්මපාල** නාහිමියන් විසිනි. පැවිදි සිසු පරපුරක් බිහි කිරීමට පුරෝගාමී මෙහෙවරක් සිදු කළ උන් වහන්සේ මාතර දිස්ත්‍රික්කයේ ද දහම් අධ්‍යාපනය ඇති කරලීමෙහිලා ක්‍රියා කළහ.

ඒ වෙනුවෙන් ආරම්භ කළ පිරිවෙන් විද්‍යාස්ථානය **කඩවැද්දූව තුන්බෝධි විහාරයයි.**

ක්‍රි.ව. 1754 දී **කඩවැද්දූව තුන්බෝධි විහාරය** ආරම්භ කොට ඇත්තේ **තුන්බෝධි වත්ත** නැමැති ඉඩමේය.එහෙත් ඊට පෙරද එම ස්ථානයේ බෞද්ධ විහාරයක් පැවති බවට පුරා විද්‍යාත්මක නටඹුන් වෙයි. දෙවිනුවර පෘත්‍රීගීසී ආක්‍රමණ සිදුවූ අවධියේ දී එම පැරණි විහාරස්ථානය විනාශ කරන්නට ඇතැයි සිතිය හැක.

කඩවැද්දූව තුන්බෝධි විහාරයේ දක්නට ලැබෙන්නේ මහනුවර යුගයේ විහාරාරාම ලක්ෂණයන්ය. මෙහි තිබෙන චෛත්‍යය සියවස් දෙකකට වඩා පැරණිය. එහි නිධන් කිරීම සඳහා අනුරාධපුරයේ ථූපාරාමයෙන් ධාතුන්වහන්සේ වැඩම කරවන ලද බවද කියැවේ.

මේ විහාරස්ථානයේ බුදුගෙය මහල් දෙකකින් සමන්විතය. එය 1856 දී ඉදි කරන ලද්දකි. ඇතුළු ගර්භයේ ප්‍රධාන බුදු පිළිමයට අමතරව තවත් බුදු පිළිමද නෙළා ඇත. එමෙන්ම එහි සත්සති ඇතුළත් චිත්‍ර නිර්මාණ, සතර වරම් දේව රූපද තිබේ. එමෙන්ම පිට මාලයේ ඉතා දැකුම්කලු නෙළුම් මල්, ලියවැල් ආදී සිතුවම් වලින් අලංකාර කොට ඇත.

මේ විහාරස්ථානයේ දක්නට ඇති ආවාසගෙය සහ ධර්ම ශාලාවද පෞරාණික වටිනාකමින් යුතුය. පොහොය සීමාවද ඉතා පැරණි වූවකි. ඒ අනුව ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේ පොහොය කිරීම සිදු කළ ප්‍රමුඛ ස්ථානයක් ලෙස **කඩවැද්දූව තුන්බෝධි විහාරය** සැලැකිය හැකිය.

බෝධීන්වහන්සේ තුන්නමක් වැඩ සිටීම නිසා **තුන්බෝධි විහාරය** ලෙස හඳුන්වන්නට ඇත. පහතරට බෞද්ධ අධ්‍යාපනයේ මුල් කාලයට අයත් විහාරස්ථානයක් නිසා **තුන්බෝධි විහාරය** 1932 වන තුරුම පුරාණ විහාරය ලෙස හඳුන්වා තිබේ.

ප්‍රදේශයේ සෙසු විහාරස්ථාන ඉදි කිරීමට පෙර මේ විහාරස්ථානය ඉදිකොට තිබූ නිසා පසු කාලයේදී ඉදිවූ විහාරස්ථානවල පූජාවන් ආරම්භ වූයේ **කඩවැද්දූවේ තුන්බෝධි** විහාරයේ හේවිසිය නාද කිරීම ආරම්භ කිරීමත් සමගින්ය. එම නිසා "කඩවැද්දූවේ හේවිසිය වාගේ" යැයි ඉපැරණි කියමනක්ද මේ විහාරය මූලික කොට නිර්මාණය වී ඇත.

උඩ අපරැක්කේ සේපාලිකාරාමය

උඩ අපරැක්ක ග්‍රාමය මෙන්ම **උඩ අපරැක්ක සේපාලිකාරාමය** ද දීර්ඝ ඉතිහිසයක් ඇති ප්‍රදේශවාසී ජනතාවගේ ගෞරවනීය වන්දනාමානයට ප්‍රාත්‍රවී ඇති විහිරස්ථානයකි. වර්තමානය වන විට විහාරස්ථානයකට අයත් චෛත්‍යය, බෝධිය, සංඝාවාසය ඇතුලු සියලුම අංගෝපාංගයන්ගෙන් පරිපූර්ණ වූ පිං බිමකි.

උඩ අපරැක්ක **සේපාලිකාරාමයට** පිංවත්ත නැමැති ඉඩමක් වෙයි. එය අතීතයේ සිට අං ඇදීම, පොල් ගැසීම සහ දේව තොවිලයන් පවත්වන ස්ථානයක් වෙයි.

සේපාලිකාරාමය ඉදිරිපිට කුඹුරෙහි තනි ගොඩැල්ලක බෝධියක් ඇත. ඒ බෝධිය ඉදිරිපිට තුඹසකින් වැසීගිය සෙල්ලිපියක් තිබී ඇත. කළකට පෙර ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** නාහිමියන් මෙම සෙල් ලිපිය පිටපත් කර ආචාර්ය **සෙනරත් පරණවිතාන** මහතාට යවා ඇත. ඒ ගැන එතුමාගේ අදහස වී ඇත්තේ මෙය සෙල් ලිපියේ කැබැල්ලක් පමණක් බවයි. ඒ ගැන එතුමා පවසා ඇත්තේ **අබාසල මෙවන් රජකුගේ** මෙහෙවරින් දුන් පෙරහැරක යනු පමණය.

මෙහි සඳහන් අකුරු බුද්ධ කාලයෙන් පසළොස්වන (15) සියවසට අයත්ය. මේ අනුව ලිපිය ක්‍රි.ව. 10 වන සියවසට අයත් බව පැවසේ. **අබාසලමෙවන්** යනු කවර රජෙක්දැයි ඉඳුරා කිව නොහැක. කෙසේ වෙතත් මෙයින් වසර දහසකට (1000) පෙර මෙගම රාජ වරප්‍රසාදයක් වශයෙන් පරිත්‍යාග කර ඇත. එම දීමනාවන් **අත්තානි පෙරහැර දීමනා** යැයි කියුනු ලැබේ.

උඩ අපරැක්කේ සේපාලිකාරාම භූමිය කනින විට උළු කැබලි හා ගඩොල් කැබලි කැබලි බොහෝසෙයින් ලැබී ඇත. මෙම ගඩොල් කැබලි අතර 15 - 16 වැනි සියවස් වලට අයත් හංස රූප සහිත ගඩොල් කැබලිද හමුවිය. එබැවින් පැරණි විහාරය මෙම ස්ථානයේ තිබුණේ යැයි විශ්වාස කළ හැක.

මෙම විහාර භූමියේ තිබී පුරා වස්තු රාශියක් හමුවී ඇත. ඒ පුරාවස්තු අතර රියනක් පමණ උසැති මනස්කාන්ත පස්ලෝ බුදු පිළිමයක්, අඟල් 14 ක් උසැති මැණික් එබ්බවූ රිදී කරඬුවක්, එහි ඇතුලේ රන් කරඬුවක් වෙයි. බුබ්බුලාකාර චෛත්‍යයක ආකාර කරඬුවෙහි රිදීමය ඡත්‍රයකින්ද ස්වර්ණමය බෝකොළ වලින්ද ගර්භයේ සතර පැත්තෙහි බෝකොළ සතරේ හා මුදුනේ සවි කොට ඇති මැණික්ද වේ. දේවතා කොටුවේ එක් පැත්තක කුඩා මැණික් දහයක් සවිකොට ඇති මැණික්ද වේ. දේවතා කොටුවේ එක් පැත්තක කුඩා මැණික් දහයක් සවිකොට ඇති අතර මුදුන රවුම් වේ. දේවතා කොටුවේ එක් පැත්තක කුඩා මැණික් දහයක් සවිකොට ඇති අතර මුදුන රවුම් වේ. සියල්ල මැණික් ගල් 24 කි. කැටයම් කළ ඡත්‍රය ඉතාමත් අගනේය. අඟල් 8 ක් පමණ උසැති ඇතුළේ ඇති දඹ රන් කරඬුව රුවන්වැලි සෑයේ ආකෘතිකයකැයි කිව හැකිය. එහි ඇතුලේ ධාතූන් වහන්සේලා තැන්පත් කර තිබුණි බවක් පැවසේ.

මෙම සියලු තොරතුරු අනුව **උඩ අපරැක්කේ සේපාලිකාරාමය** ඉතාමත් පෞරාණික ස්ථානයක් බව කියැවේ.

සිරි නිකේතාරාමය-

පාතේගම උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් **සිරි නිකේතාරාම විහාරස්ථානය** ප්‍රදේශයේ පිහිටි ඉපැරණි විහාරස්ථානයකි. අක්කර පහක (05) පමණ භූමි භාගයක පිහිටි මෙය විහාරස්ථානයකට අයත් චෛත්‍යය, බෝධිය, බුදු මැදුර, සංඝාවාසය ආදී සියලුම අංගයන්ගෙන් පරිපූර්ණ විහාරස්ථානයකි.

මෙම විහාරස්ථානයේ ඇති සුවිශේෂත්වය වන්නේ බුදු මැදුරෙහි **උම්මග්ග ජාතක කතා** වස්තුව සම්පූර්ණයෙන්ම චිත්‍රයට නගා තිබීමය. ක්‍රි.ව. 1814 දී මෙම සිතුවම් කර ඇති බව විශ්වාස කරයි.

කපුගම බෝඹුරේ විහාරස්ථානය-

ප්‍රදේශයේ පැරණි විහාරස්ථානයක් වූ මෙම විහාරස්ථානය පහත රට සංඝනායක පදවියෙන් හා ශ්‍රී පාදස්ථානයේ නායක පදවියෙන්ද පුද ලද **පූජ්‍ය කරතොට ධම්මාරාම** මහ නාහිමියන්ගේ ශිෂ්‍ය **ගාල්ලේ මේධංකර හිමියන්** ආදීම විහාරාධිපති හිමියන්ය.

ප්‍රදේශයේ සහ අවට ජනතාවගේද නොමද වන්දනීයත්වයට හා පූජනීයත්වයට පත් **බෝඹුරේ විහාරය** විහාරස්ථානයට අයත් සියලුම අංගයන්ගෙන් සමන්විතය. අක්කර 30 ක නොඅඩු පන්සල් වත්ත හා ඒකාබද්ධ වූ ගොඩ ඉඩම්ද වී අමුණු පහක පමණ කුඹුරුද අයත්ය.

මෙම විහාරස්ථානයේ සුවිශේෂත්වය වන්නේ ඉතා වැදගත් පැරණි පුස්කොළ පොත් වලින් සමන්විත පුස්තකාලයක් පිහිටීමය.

උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාලය

දෙවුන්දර **උපුල්වන්** මහා දේවාලය **දාපුළුසෙන්** (I දප්පුල) (ක්‍රි.ව. 664 - 673) රජතුමා විසින් කරවා **උත්පලවර්ණ** දිව්‍ය රාජයාගේ රක්ත චන්දන ප්‍රතිමාව (රත්හඳුන් පිළිමය) කරවා මහත් උත්සව ශ්‍රියෙන් වැඩම කරවා ගෙන පැමිණ තැන්පත් කළ බව **පැරකුම්බා සිරිතෙහි** එන පහත සඳහන් කවියෙන් පැහැදිලි වෙයි.

"ඉමල් හල මුනි ලෙසින් වදහල
මෙලක රකිනුව මෙත් සිතින්
උපුල් වන් දෙවි රජුන් පිළිරුව වඩිනු
දැක මහ සයුරකින්
විමල් ගුණයුත් නමින් දාපුළුසෙන් රජෙක්
ආ එමොහොති න්
විපුල් සිරි දෙවිනුවර කරවා පිහිට
කරවිය යහපතින්"[79]

දළදා සිරිතෙහි ඒ බව සඳහන් කෙරෙන්නේ මෙසේය.

".....ගිරියෙල වෙහෙර කරවා **උපුල්වන්** දෙවිරජාණන් රුව පිහිට වූ දාපුළුසෙන් රජුයැ...."[80]

දිගනේ බුද්ධරක්ඛිත හිමියන් රචිත කඩයිම් පොතෙහි

".....ගිරියෙල වෙහෙර කරවා **උපුල්වන්** දෙව් රජාන පිහිට වූ දාපුළුසෙන් රජය...."[81] යනුවෙන් ඉහත සඳහන් ජනශ්‍රැතිය සත්‍ය බව පැහැදිලි කරයි.

---

[79] පැරකුම්බා සිරිත

[80] දළදා සිරිත - 6 පරිච්ඡේදය

රාජ රත්නාකාරයෙහි සඳහන් වන අන්දමට **දාපුළුසෙන්** (ක්‍රි.ව. 664 -673) රජතුමා **උපුල්වන්** දෙවියන්ගේ රත් හඳුන් පිළිරුව පිහිටුවන්නටත් පෙරත් දෙව්රජුන් දෙවිනුවර පිහිටුවා තිබුණු බව මෙසේ සඳහන් වෙයි.

".....ඔහු (දළුපතිස්)[82] බෑ පැසුළු සිරිසඟබෝ රජ පියගල් වෙහෙර කරවා **දෙවිනුවර දෙව්රජුන්** පිහිටුවා..."[83]

ඇතැම් විට මෙම පිළිරුව රන් හෝ වෙනත් ලෝහයකින් සාදන ලද්දක් විය යුතුය.

මහාවංශය සඳහන් කරන අන්දමට ක්‍රි.ව. 641 දී රජ බවට පත් කුළුණ තිස් රජකළ බවත් ඒ කාළයෙහිද දෙවුන්දර දේවාලය තිබී ඇත. **ටර්කර්** ඉතිහාසයේද මේ බව සඳහන් කර ඇත.[84]

දෙවිනුවර දේස දේශාන්තරයෙහි ප්‍රකට වූයේ රාජධානියක් හෝ බෞද්ධ මහා විහාරයක් නිසා නොව **උපුල්වන් මහා දේවාල**ය නිසා බව අවිවාදිතය.

ක්‍රි.ව. 1234 දී රජ බවට පත් නැම්බර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු නමින් ප්‍රකට **II වැනි පැරකුම්බා** රජතුමා දේවාලය ප්‍රතිසංස්කරණය කොට සංවර්ධනය කර ඇත. ඒ බව මහාවංශයෙහි මෙසේ සඳහන් වෙයි.

"..... ඉක්බිති රජතෙමේ පුණ්‍යයට ආකාරයක් බඳුවූ දේව නගරවරය ද උත්පලවර්ණ දිව්‍ය රාජයාගේ මන්දිරයද බොහෝ කලක් පෙරාතුයෙහි නඟන ලද බැවින් හාත්පසින් ජීර්ණ භාවයට පැමිණියේ වනැයි අසා හෝ මිහිපල් තෙමේ නගරවරාගමනය කොට එහි දේව රාජාලය (දිව්‍යරාජභවන) පරිද්දෙන් අභිනව කොට මනාව සර්වභොග වාසය කළේය. අනතුරුව හේ නරාධිපති තෙමේ ඒ නගරය දෙවිනුවරට බඳුව සුන්දර වූ සර්ව සම්පත්තියෙන් සම්පූර්ණ කර වූයේය."[85]

දැනට පවතින මහ දේවාලය පුරාණ දේවාලය තිබූ ස්ථානයෙහිම අභිනවයෙන් ඉදි කරන ලද්දක් බව ගන්දර **පී.ඩී.එස්.වීරසූරිය** මහතා සිය **දෙවුන්දර ඉතිහාසය** පොතෙහි සඳහන් කර ඇත.[86] මෙය දොරටු තුනකින් යුක්තය. දකුණු දොරටුව උභය පාර්ශවයෙහි ගල් තරාදියෙන් යුක්ත පැරණි කවුලු (ජනේල) දෙකක් තිබේ. ඒ පැරණි දේවාලයේ නටඹුන්ය.

දේවාලය තුළ දකුණු දිග බලා සිටින ආකාරයෙන් නිර්මාණය කර තිබෙන ප්‍රතිමාව දැන් පවත්නා දේව මාලිගය ඉදි කළ පසු කරවන ලද්දකි. දේවාලයේ ඇතුළු බිත්තියේ විෂ්ණුගේ අවතාර වන මත්ස්‍ය, කූර්මාවරාහ, නරසිංහ, වාමන, පරශුරාම, රාමචන්ද්‍ර, කෘෂණ, බුද්ධ යන නව විධ අවතාර සහ මතු පහළ වන අවතාරය වෙනුවට සුදු අශ්වයෙකුගේ රූපයද සිත්තම් කොට තිබුණි.

මහ දේවාලය භූමියෙහි පැරණි ගල් කණු බොහොමයක් දක්නට ලැබේ. ඒ අතර තවත් ගල්කණු රාශියක් තැනින් තැන විසිරී තිබේ. ඇතුම් ගල්කණු පොළොවටද ඇද වැටී ඇත. දේවාලය දෙපස ඇත් ඔළුවක් හා සිංහ ශරීරයක් ඇති නුවර කලාවිය දිශාවට අයත් ගජසිංහ කොඩියේ පමණක් ඇති ගංසිංහ රූප සතරෙකි. පඬුරු සේදීමට පැන් සැපයෙන දර්ශනීය ගල්බදුනක්ද දක්නට ලැබේ.

දේවාලයක් දිග්ගෙය, උඩමාල්ගෙය, ගබඩාගෙය, රිට්ටාගෙය, මුළුතැන්ගෙය යන මේ අංගෝපාංගයෙන් සමන්විත යුතු බව සඳහන් වේ. එහෙත් දැනට පවතින දේවාලයේ මෙකී අංගයන්ගෙන් දක්නට ලැබෙන්නේ ගබඩාගෙය හා මුළුතැන්ගෙය පමණි. දිග්ගෙය, උඩුමාල්ගෙය සහ රිට්ටාගෙය යන අංග තුන (03) දැනට දක්නට නොලැබේ.

මෙයට එකම හේතුව වන්නේ පැරණි දේවාලය පෘතුගීසීන් විසින් සම්පූර්ණයෙන් විනාශ කිරීමය. ඉන්පසුව ඉදිවූ දේවාලයේ මේ අංග ඉවත් වී ඇත.

---

[81] දිගනේ බුද්දරත්බිත හිමියන්ගේ කඩයිම් පොත - 6 පරිච්ඡේදය

[82] දළුපතිස්, කළුණ දෙටුතිස්, දෙටුපතිස්, දාඨෝපතිස්ස යනු මහාවංශයේ සඳහන් දාඨෝපතිස්ස(ක්‍රි.ව. 641) රජුය.

[83] රාජරත්නාකරය - 30 පරිච්ඡේදය

[84] මහාවංශය - 37 පරිච්ඡේදය

[85] මහාවංශය - 85 පරිච්ඡේදය

[86] දෙවුන්දර ඉතිහාසය - ගන්දර පී.ඩී.එස්.වීරසූරිය 84 පිටුව -1949- සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

උපුල්වන් දේවාලය ගැන **මයුර** සන්දේශයෙහි සඳහන් වන්නේ මෙසේය.

"ලෙව් රකිනුව ලක සක කළ ගියෝ මෙනේ
දෙව් රජ හිමි දෙවිනුවරට වඩින දිනේ
දෙව් පුරයෙන් පහ බෑයොත් තිබූ මෙනේ
සව් මිණි කොත් කැන් දිළි ගුවන ගම මිනේ"[87]

මෙම කවිය අනුව දේවාලයේ වූ මැණික් කොත්වල කාන්තියෙන් අහස පවා ආලෝකමත් වී ඇත.

දේවාලයට පිවිසෙන **මාවත් මඩුව** ද **මයුර** සන්දේශකරුවාගේ නොමද වර්ණනාවට ලක්වී ඇත.

"පෑපත් සුදම් සබයේ සිරි පහළ කොට
යාපත් විලස පනා මෙන් නර ලොවට
මාවත් පතනුවන් වන් විට වන පිහිට
මාවත් මඩුව දැක යාගන් පුරවරට"[88]

දේවාලයේ පෙරහැර ගමන් කිරීමට තනා තිබූ මේ ගොඩනැගිල්ලේ නෂ්ටාවශේෂ වශයෙන් ගල්ටැම් සිව්පෙළක් අද දක්නට ලැබේ. මේ පිළිබඳව සඳහන් කරන ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** හිමියන් පෙරහැර ගමන් කරන විට දෙපස අංශ පරතරයද මැද මඟුල් පරතර යයිද නම් කෙරෙන බව පවසයි. මඟුල් පරතරයේ ගමන්කරණ ඇත්හාමිගේ දකුණු අංශයෙන් මහ බෙත්මේද වම් අංශයෙන් දෙවෙනි බෙත්මේද යායුතු බැව් දැක්වේ.[89] **මේජර් පෝබර්ස්** මාවත් මඩුවේ නශ්ඨාවශේෂ මුහුදු තෙර තෙක් තිබූ බව සඳහන් කරයි.[90]

දේව මන්දිරයේ වාසලෙහි හෙවත් දොරටුවෙහි වූ ගල්තොරණ **පරෙවි** සන්දේශයෙහි සඳහන් වන්නේ මෙසේය.

"නුදුරුව නුබට සිටි වහසල් බිහිදොරිනි
ඇදුරුව නොදිසි සුර රද පහමිණි රුසිනි
සොඳුරුව සෑදුණු එනුවර දෙව්පුර නමිනි
ඇඳුරුව වනත අනතය දහසක් වතිනි"[91]

දෙවිනුවර උපුල්වන් ශ්‍රී විෂ්ණු දේවාලයේ දක්නට ලැබෙන **මහවත් මඩුව** හා **ගල් උලුවස්ස** දේවාල අංග අතර වඩාත් කැපී පෙනේ. සම්පූර්ණයෙන්ම සංරක්ෂිත සෙල්මුවා උළුවස්ස පුරා විද්‍යාත්මක අතින් අතිශයින් වැදගත් ස්ථානයක් හිමිකර ගනී.

---

[87] මයුර සන්දේශය - 116 කවිය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය - 2012 " සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

[88] මයුර සන්දේශය -115 කවිය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය - 2012 " සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

[89] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය- ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි -109 පිටුව- 1994- කර්තෘ ප්‍රකාශනයකි.

[90] Eleven Years of Ceylon - Majar Fobas

[91] පරෙවි සන්දේශය -165 කවිය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය - 2012 " සී.ස.ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

වර්ෂයක් පාසා පැවැත්වෙන දෙවිනුවර ඇසළ පෙරහැර දේවාලයෙන් පිටවී වීදී සංචාරය පිණිස **මහවතට** වදින්නේත් පෙරළා ගෙවදින්නේත් මේ දොරටුව සහිත ගල්කණු අතරිනි. දේවාලයේ සිට මහවතට බසිනා මෙම ස්ථානයේ සඳකඩ පහනක් තිබූ අතර එම ස්ථානය **හඳගල ගාව** යනුවෙන් ව්‍යවහර කෙරුණි. වර්තමානයේද බෝහෝ දෙවිනුවර වැසියන් එම ස්ථානයට **හඳගල ගාව** යැයි කියනු ලැබේ.

පුරා විද්‍යාත්මක මෙන්ම කලාත්මක අතින්ද ඉතාමත් ඉහළ මට්ටමක පවතින මෙම සෙල්මුවා උළුවස්ස පිළිබඳව **ආචාර්ය කඹුරුපිටියේ වනරතන** නාහිමියන් දක්වන අදහස විද්වතුන්ගේද පැසසුමට හා ගෞරවයට ලක්වී ඇත. මක්නිසාද යත් එය ඒ තරමටම සාධාරණ, යතාර්ථවාදී එකක් බැවිනි.

".....මහවත් මඩුව නම් වූ දීර්ඝ ශාලාවේ කෙළවරේ වර්තමාන දේවාල භූමියට ඇතුල්වන තැන ඇති මේ උළුවස්ස අගනා කර්මාන්තයකි. පුරාවිද්‍යාත්මක විමංශනාක්ෂයකින් බැලිය යුතු මෙය අඩි 7.5" x 4" උස හා පළල ඇත්තේය. කිඹිසි මුහුණක් සහිත මකර තොරණකින් යුක්තය. මකර තොරණට කිඹිසි මුහුණ එක්වුයේ 8 -10 සියවස් වලදීය.

උළුවහු කණු දෙකෙහි පෙණෙන කැටයම් අතර අශ්වාරූඪ වූ යුද්ධ භටයන්ගේ සටහනක්ද දකුණු ඉන්දියාවේ මහබලිපුරම්හි ඉඳවූ දේවාල වල ප්‍රධාන උළුවස්සෙහි මුදුන සැරසූ ගජලක්ෂ්මී රූපයද මෙහි ඇති විශේෂාංගයෝය.මෙහා බලිපුරම්හි සුප්‍රසිද්ධ සත්මහ දේවාල කරවූයේ ක්‍රි.ව. 630 - 668 රාජ්‍යය කරවූ මහාමල්ල නරසිහ වර්මන් රජතුමාය. රූපයන්ගෙන් අලංකාරවූ තොරන් තැනීමද ප්‍රථමයෙන් ආරම්භ කළෝ සවන අටවන සියවස්හි කාංචියේ රජකරවූ පල්ලව රජවරුය. අශ්ව ලාඩමක හැඩය ඇති මෝස්තර සටහන්ද යෂ්ටියට වෙරදී සිටින ආකාරයට හෝ ආචාර පවත්නා විලාසයට නෙලූ දොරටුපාල රූපයද පල්ලව කෘතීන්හි විශේෂාංගයෝය. ක්‍රි.ව. 630- 668 දක්වා රාජ්‍යය කරවූ ෂෂ නරසිංහ වර්මන් රජු විසින් නැඟී සිටි සිංහරූප, දොරටුව ළඟ කරවිණි. කඩුගත් අත් ඇතිව ද්වාරපාල රූප සහිත සිංහ රූප යෙදීම කෝවිල් සම්ප්‍රදාය අනුගමනය කිරීමකි. ඉහත දැක්වූ උළුවස්ස පල්ලව සම්ප්‍රදාය ලක්දිවට වැද්දගත් අවස්ථාවේදීම කරණ ලද්දකැයි සිතිය හැකිය. මෙහි දැක්වෙන අශ්වාරෝහකයන්ගේ කැටයම් මේ යුගය හැරෙන විට අපට දක්නට ලැබෙන්නේ ගම්පල සමයට අයත් සුප්‍රසිද්ධ ඇම්බැක්කයේ දේවාලයෙහි දිග්ගෙයහි ලී කැටයම් අතරය."[92]

තිසර, මයුර, පරෙවි හා **කෝකිළ** යන සංදේශ කාව්‍ය පොත් සතරේම දෙවිනුවර දේවාලය පිළිබඳව කදිම තොරතුරු සඳහන් වේ. එසේම ලංකාවේ විවිධ පාලකයන්, රජවරුන්,මැති ඇමතිවරුන් මෙහි සංවර්ධනය සඳහා අපමණ කටයුතු කර ඇති අතර අවට ගම්බිම් ද පූජා කර ඇත. එයට අමතරව විදේශිය රජවරුද දේවාලය සඳහා ප්‍රදානයන් කර ඇත.

දියෝගුද තුමෝ, ඉබන් බතූතා, වෙනට් අබුජෙඩ්, ටැනර්, සී. ඇප්. ගෝඩන් කමින්, ස්ටැන්ගෝස් ගොර්ඩන්, ද ක්වරෝස් පියතුමා, කොන්ස්තන්තීනු ද සා නැමැති විදේශිය ලේඛකයන් හා පාලකයන් දෙවිනුවර දේවාලය පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත.

ඉබන් බතූතා (Iban Battuta) නැමැති මුස්ලිම් දේශ සංචාරකයා පවසන අන්දමට දහසක් පමණ වූ බ්‍රාහ්මණ පූජක පිරිසක්ද පන්සියයකටත් අධික වූ දේවදාසින් (නළගනන්) සමූහයක්ද දේව පූජා සඳහා කැපවී සිටියහ. ඔහු තවදුරටත් පවසන අන්දමට වැදගත්කමින් හා වන්දනා කරුවන්ගේ පැමිණීමෙන් ශ්‍රී පාද ස්ථානයට ප්‍රථම අංකය ලැබෙන අතර දෙවැනි අංකය හිමිවන්නේ දෙවුන්දරටය (ඉැබ්ඒර).

සිංහාසන පුරාණ කෝවිල

දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයට අයත් සිංහාසන පෙදෙස වසමේ පිහිටි **සිංහාසන පුරාණ කෝවිල** දිගු ඉතිහාසයක් ඇති පූජනීය සිද්ධස්ථානයකි. ඇතැමෙකුගේ මතය අනුව **කතරගම** දෙවියන් ගොඩ බසින ලද ස්ථානයක් ලෙස සලකති. එහෙත් එයට වඩා වෙනස් මතයක්ද ප්‍රදේශය පුරා පවති.

---

[92] මාතර පුරා විදයාත්මක ඉතිහාසය - පිටුව 109 - 110 - ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමි - 1949 කර්තෘ ප්‍රකාශනයකි.

ප්‍රදේශවාසීන්ගේ අදහස් අනුව මුහුදින් පාවී ආ කිහිරි ලීයකින් දේව රූපයක් නිර්මාණය කර එම දේව රූපය මෙම කෝවිල පිහිටි ස්ථානයේ මුහුද දෙස බලා සිටින ආකාරයට සිටුවා තබා ඇත.පසුකලෙක එය දඹුල්ල ප්‍රදේශයට ගෙන ගොස් ඇත. පසු කලෙක 1950 වසරේ එම කිහිරි රූපය තිබුණු ස්ථානයේ දේවාලයක් ඉදිකළ බවත් එය **සිංහාසන පුරාණ කෝවිල** ලෙස නම් කළ බවත් සඳහන් වේ.

දාපුළුසෙන් රජතුමා විසින් තනවා ඇතැයි සැලකෙන සිංහාසනයක් මෙහි තිබී ඇතැයි සැලකේ. දෙවිනුවර ශ්‍රී උපුල්වන් විෂ්ණු දේවාලයේ සිට සිංහාසන පාර ඔස්සේ මෙම කෝවිල දක්වා ලී වලින් තැනූ වහලක් සහිත ආවරණයක් ඉදිකර ඇත. එහෙත් එහි සලකුණක් හෝ දැනට දක්නට නැත.

දෙවිනුවර මහ දේවාලයේ වාර්ෂික පෙරහැර සිංහාසන පාර, අම්පිටිය පාර හා ප්‍රදීපාගාර පාර ඔස්සේ වීදී සංචාරය කරයි. පෙරහැර යන අතරවාරයේ විශේෂ පුද පූජා සිංහාසන පුරාණ කෝවිල වෙත සිදුකරණු ලැබේ. ධිවර රැකියාවේ යෙදෙන ධිවරයින් තම රැකියාව සඳහා මුහුදු යෑමට පෙර සිංහාසන පුරාණ කෝවිලට භාරභාර වන අතර මුහුදු ගොස් පැමිණ එම බාරභාර ඔප්පු කරන බවත් පැවසේ.

07.

දෙවිනුවර ග්‍රාම නාම සහ ඓතිහාසික ස්ථාන

රුහුණේ ඉපැරණි රාජධානි අතරට එක්වන දෙවිනුවර පිහිටීමෙන්ම ආරක්ෂිත නගරයක් වූ අතර දර්ශනීයත්වයෙන් සහ පෞඩත්වයෙන් ද අගතැන් පත්වූවකි. ලංකාවේ දකුණු දිග තුඩුවේ පිහිටි දෙවිනුවර ඉතිහාසය දෙස පිරික්සා බලන විට එය සිංහල රාජධානි සමයටත් පෙර ප්‍රකට වූ බව විදේශීය ලේඛකයන්ගේ වාර්තා අනුව පෙනීයයි. **ඊජිප්තුවේ පැලිසියුම්** හි තාරකා විද්‍යාඥයෙකු වූ **ක්ලැයුසියස් ටොලමි** මෙම නගරය හඳුන්වා ඇත්තේ **දඟන** (Dangana) යන නාමයෙනි. ඒ අනුව මෙම නගරය රාජධානියක් ලෙස නිර්මාණයවීමටත් පෙර සිට දෙවිනුවර විදේශීය රටවල පවා ප්‍රකට වූ බව පැහැදිලි වේ.

එහෙත් ඒ දෙවිනුවර යන නාමයෙන් නොවේ.

දෙවන පෑතිස් රජ සමයෙහි (ක්‍රි.පූ. 307 - 267) දෙවිනුවර දෙතිස් ඵලරුහ බෝධි ශාඛාවක් රෝපණය කළ බව ජනශ්‍රැතියෙහි සඳහන් වෙයි. **ඉබන් බතූතා** නම් ඉස්ලාම් භක්තික දේශ සංචාරකයා දෙවිනුවර නගරය හඳුන්වා ඇත්තේ **දිනවාර්** (Dinewar) යනුවෙනි.

දෙවිනුවර රාජධානියක් වශයෙන් ස්ථාපිත II වැනි දප්පුල (දාපුළුසෙන්) (ක්‍රි.ව. 664 - 673) රජ සමයෙහිය. **දාපුළුසෙන්** (සාමි දප්පුල) රජතුමා උපුල්වන් දෙවියන්ගේ දේවාලය කරවා නගරය දේව නගරය යැයි නම් කළ බව ඉතිහාසය පවසයි. එතුමා මහා වීථි දහ අටකින්ද, පටු මාවත් දහ අටෙකින්ද, ඔලොක්කු[93] දහ අටකින්ද, මුඩුක්කු[94] දහ අටෙකින්ද යුත්කව පුරාණ ගෘහ නිර්මාණ ශිල්පය අනුව **පද්මා** නගර සංකල්පය අනුව මේ නගරය කරවා ඇත. එයට අමතරව ගලින් කරන ලද ළිං හතක්[95] සහ වැව් පොකුණු[96] හතක් ද නගරයේ සිවුකොන දේවාල සතරක්ද කරවා ඇත.

දෙවිනුවර නාම ප්‍රභවය

දෙවිනුවර පුරවරයට එදා විශාල ප්‍රදේශයක් අයත්ව තිබී ඇත. දෙවිනුවර ඇත අතීතයේ විවිධ නම් වලින් හඳුන්වා ඇත. කළෙක දෙවිනුවර **ගිරිහෙළ පුර** නම් වූ අතර බටහිර දිග

---

93 ඔලොක්කු -සාමාන්‍ය පාරවල්

94 මුඩුක්කු - ඊටත් කුඩා පාරවල්

95 ගල් ළිඳ,තෝන්ඩිය ළිඳ,හාමුදුරුවන්ගේ ළිඳ

96 ඇත් දැඩි පොකුණ, වෙලේ පොකුණ, හුනියම් පොකුණ, කහ පොකුණ, වාව්වේ වැව ආදිය

වැසියන් හඳුන්වා ඇත්තේ **දෙවුන්දර තුඩුව** (Dondra Head) යන නමිනි. **තුඩුව** යනු කෙළවර - ශේෂය - කොන ය. ඒ අනුව එම නාමය අපරදිග වැසියන් භාවිතා කර ඇත.

උපුල්වන් දෙව් රජු ගොඩ බැසීමෙන් පසු ඔවුන්ගේ වාසභවනය වූ නගරය බැවින් එතැන් සිට මේ නගරය දේවේන්ද්‍ර > දේවේන්දර > දෙවෙන්දෙර > දෙවුන්දර නමින් ප්‍රකට විය. හින්දු භක්තිකයින් මෙම නගරය හඳුන්වා ඇත්තේ **තෙයිවාන් තුරෙයි** යනුවෙනි. දෙවියන් ගොඩබට තොට යනු මේ ද්‍රවිඩ වචනයේ අර්ථයයි. (තෙයිවාන් තුරෙ > තෙවුන්තර > දෙවුන්දර) දෙවියන්ගේ වාස භවනය වන **තෙයිවන් උරෙ** යන තේරුමින් දමිළ ව්‍යවහාරයෙන්ද **දෙවුන්දර** යනු තද්භව විය හැක.

ද්වි හින්න තීර්ථ > දෙබුන්දර > දෙවුන්දර යනුවෙන්ද; ධෝවන ද්වාර > දෙවුන්දෙර > දෙවුන්දර යනුවෙන්ද; ධෝවන ධරණ > දෙවුන්දර > දෙවුන්දර යනුවෙන්ද දෙවුන්දර සිදුවීයැයි ද තවත් මතයකි.

එහෙත් අද වන විට මෙම නගරය දෙවිනුවර නමින් ප්‍රකටය. අතීතයේ ඉතා විශාල ප්‍රදේශයක් පුරා පැතිර තිබූ දෙවිනුවර නගරය අද දෙවිනුවර උතුර, දෙවිනුවර දකුණ, දෙවිනුවර නැගෙනහිර, දෙවිනුවර බටහිර, වාව්ව, කපුගම බටහිර, කපුගම නැගෙනහිර යනාදී ගම් වර්තමාන බෙදීම් වලට අනුව දෙවිනුවර නගරයට අයත් වෙයි.

ගල්ගේ - ගල්ගනේ

දෙවිනුවර නගරයට උතුරු දෙසින් කිලෝමීටර් 1/2 ක් පමණ දුරකින් මනරම් කදු ගැටයක් මත මුළුමනින්ම කලුගලෙන් නිමකරන ලද ගොඩනැගිල්ලක් වෙයි. එය හැඳින්වෙන්නේ **ගල්ගේ, ගල්ගනේ** නමිනි. පුරා විද්‍යාඥයන්ගේ හා ඉතිහාසඥයන්ගේ නොමඳ සැලකිල්ලට ලක්වූ මෙම ගොඩනැගිල්ල ගැන විවිධ මත පළවී ඇත. මහාචාර්ය **සෙනරත් පරණවිතාන** මහතාගේ මතය අනුව මෙම ගල්ගේ පැරණි උපුල්වන් දෙවොලය. එතුමා එසේ ප්‍රකාශ කර ඇත්තේ මෙය දේවාල සම්ප්‍රදායෙන් ගොඩනගා ඇති නිසාය. පැරණි දේවාල ගොඩනඟා ඇත්තේ ගර්භ ගෘහය, මණ්ඩපය, අන්තරාලය යන අංග තුනකින් යුත්තවය.

පරණවිතාන මහතාගේ දෙවැනි තර්කය වන්නේ විහාර භූමියක දේවාලය නොපිහිටිය යුතු බවයි. සිය ගණන් නළඟණන් රැඟුම් දුන් දේවාලය විහාර භූමියට දුරින් පිහිටිය යුතුයි යනුයි.එය සන්දේශ කෘතීන්ගෙන්ද පැහැදිලි වේ.

පරණවිතාන මහතාගේ තෙවෙනි තර්කය වන්නේ එදා මුහුදු යාත්‍රාකරුවන්ට දේවාලයේ දේව රූපයේ දෙඇස්වලට සවිකර තිබුණු මැණික්වල ආලෝකය දිස්වූ බව සංචාරකයන් පවසා ඇති බවය. එසේ නම් දේවාලය පිහිටිය යුත්තේ උස්බිමක විය යුතුයැයි ඒ මහතා සිතන්නට ඇත.

මේ ගල්ගෙය දිග පළල පිළිවෙලින් අඩි 26 x 16 කි. උස අඩි 12 කි. ගල්ගේ ගොඩනැගිල්ල නිර්මාණ ලක්ෂණ අනුව මෙය හින්දු හෝ බෞද්ධ යැයි නිගමනය කළ නොහැකිය. මෙහි දැක්වෙන කුළුණු හිස්, සොළී සමයේ ද්‍රවිඩ ගොඩනැගිලිවල දක්නට ලැබෙන කුළුණු හිස්වලට සමානය. ඇතුළු ගර්භයේ දොරටුවෙහි හෝ පඩිපෙළක් නොමැත. බිත්ති මට්ටම බැඳ තිබෙන්නේ නොගැඹුරු සතරැස් කුළුණු වලින් පමණකි. ගොඩනැගිල්ලේ එක් එක් කොටස් පිළිබඳ සම කඩවසම් බව සලකන විට සිංහල ද්‍රවිඩ ගෘහ නිර්මාණ මිශ්‍රත්වයෙන් තැණුනු අමුතු නිර්මාණයකි.

කොටස් දෙකකට වෙන් කර ඇති හෙයින් උළුවහු දෙකකින් යුක්තය. එහි පලාපෙති කැටයම් කර ඇත්තේය. ඇතුළු බිත්තියේ ගලෙහි බදාමයක් ආලේප කර සායම් කළ බවක් පෙනෙන්නට තිබේ. මණ්ඩපයෙහි ඇතුළු වන දොරටුවෙහි මණ්ඩපයට නැගීමට ගල්පඩි කීපයක් දෙපස කැටයම් කළ රූපද තිබේ. ගල්ගෙයි පියස්සෙහි කැටයම් කළ රූපද තිබේ.

ගල්ගෙට ඇතුළු වන උළුවස්සේ වම් උළුවහු කඳේ නයිපෙණ දහනවයකි. දකුණු උළුවහු කඳේ ඇත්තේත් නයිපෙණ එපමනය. උඩෙලිපතේ නයිපෙණ දොළසකි. එයටත් ඉහළින් වූ බෝරදයේ දෙකෙළවර නෙළුම් මල් දෙකකි. එම බෝරදය උඩෙලිපතට වඩා දිගය. එයටත් ඉහළින් වූ

බෝරදය උඩෙලිපතේ ප්‍රමාණයමය. එහි දෙකෙළවර සිවුපෙති පුෂ්පයකින් යුක්තවා මෙන්ම නයිපෙණ සතකින්ද හොබණේය. මේ පළමුවැනි ගල් ඕවරකයේ ලකුණුය.

දෙවැනි ඕවාරකයේ උළුවස්සද කැටයම්ද පළමුවැන්න හා නොසම වනුයේ පළමු වැන්නේ පද්ම ලක්ෂණය වෙනුවට දෙවැන්නේ පුෂ්ප කැටයම යෙදීම පමණය. ගල් පියස්සේ සිවු දිග පිටතට නෙරුණු සරල සමාන්තර ගල් රූ කිහිපයක් දර්ශන පථයට හමුවේ.

මේ ගල්ගේ පිළිබඳව තවත් මතයක් වන්නේ **රාම** කුමරු **රාවණ** රජු විද මරණයට පත් කිරීම සඳහා දුනුදිය මෙහෙය වූ ස්ථානය ලෙසය. මෙම ස්ථානයේ රාම කුමරු විසින් බමුණන්ගේ උපදස් පරිදි ශිව දේවාලයක් පිහිටවනු ලැබූ අතර **රාවණ** රජු මැරී වැටුනු තැන **ශ්‍රී රාම** (විෂ්ණු) දේවාලය පිහිටුවන ලැබීය. **විෂ්ණු** දේවාලයේ ගල්කණු අතර **රාම** කුමාරයා දුනුදිය මෙහෙයවා විදින අන්දම දැක්වෙන ගල් කණුවක්ද (තඹ පැහැති) විහාර භූමියේ දක්නට ඇත. මෙම **ගල්ගෙය** සහිත **ශිව දේවාල**ය මහ දේවාලයේ පරිවාර දේවාල හතරෙන් (04) එකක් හැටියට ද සැළකේ.

මෙම ගොඩනැගිල්ල නැගෙනහිර දිසාවට මුහුණලා පිහිටා ඇති බැවින් මෙය සූර්ය නමස්කාරය සිදු කළ ස්ථානයක් ලෙසද සඳහන් වේ.මෙය ඉතා උස් ස්ථානයක පිහිටා ඇති බැවින් මුලින්ම හිරු එළිය වැටෙන බැවින් හිරු උදාව සටහන් කරන ස්ථානයක් බවටද සඳහන් වේ. ඈත අතීතයේ අපේ හිරු දෙවියන් වෙනුවෙන් දේවාල 04 ක් තිබුණු බවට මතයක් වේ. එයින් දෙකක් රුහුණු ප්‍රදේශයේ පිහිටා තිබූ අතර එකක් **දෙවුන්දර හිරුගල් තිලක** කය. (ඉරුගල් තිලකයයි.) මාතර දිසාපතිව සිටි **කැප්ටන් ජෝන් ඩොයිලිගේ** දිනපොතේ ඇති සටහනකට අනුව දෙවුන්දර දේවාලයේ කපු මහතා සිංහල අලුත් අවුරුද්ද විස්තර කෙරෙන සටහනකින් ලංකාවේ දකුණු තුඩුව වන දෙවිනුවරට හිරු මුදුන් වීම මුල්කරගෙන සිංහල අලුත් අවුරුදු උළෙල පැවැත්වූ බව සඳහන් වේ.[97] මෙම ස්ථානයේ පැරණි පුස්කොල පොත් බලගතු මන්ත්‍ර, තෙල් වර්ගද නිධන් කර ඇති හාස්කම් ඇති ස්ථානයක් ලෙසටද ප්‍රකටය. දෙවිනුවර උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් ස්ථානයකි.

ගල්ගේ අසලට ගිය විට මුළු දෙවුන්දර නගරය සහ අවට හොඳින් දර්ශනය වේ.මෙම ස්ථානය ආරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස ප්‍රාදේශීය රජවරුන්, පාලකයන් භාවිතා කළ බවටද ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙම ස්ථානයේ සිට උමගක් ඇති බවටද පැවසේ. ගල්ගේ ඉහළම ස්ථානයක පිහිටා ඇති බැවින් අවටින් කවර බලවේගයක් පැමිණියද එය දර්ශනය වන බවත් දක්නට ඇත.

මෙම ගල්ගෙය මහල් දෙකකින් යුක්තව පවතින්නට ඇති බව පැවසේ. මෙහි ඉහළ මාලය මුළුමනින්ම දැවයෙන් නිර්මාණය කරන ලදුව පසු කාළයේ එම දැව විනාශ වී ඇති බව පැවසේ.

අතීතයේ ගම්මුන් සෙත් ශාන්ති කටයුතු සඳහා මෙම ස්ථානයට පැමිණ තිබේ. යක්ෂ, පිසාච, භූත දෝෂ ආදිය මග හරවා ගැනීම එහිදී සිදුවිය.

අංගහවත්ත

දෙවිනුවර උතුර වසමට අයත් ප්‍රධාන ගම්වලින් එකකි. මෙම නාමය ඇතිවීමට හේතු දෙකක් ගැන ප්‍රදේශවාසීන් අතර කථා පුවත් පවතී.

දේවාලවල අඹ කොළ එල්ලා තැබීමේ පුරාණ චාරිත්‍රයක් පවතී. අඹ කොළ, කොහොඹ කොළ විශනාශක කොළ වෙයි. මේ සඳහා දේවාල වලට අඹ කොළ සැපයුණේ මේ ප්‍රදේශයේ වූ විශාල අඹ ගසකිනි. මේ මහ අඹ ගස පිහිටීමේ හේතුවෙන් තදාසන්න ප්‍රදේශය අංගහවත්ත (අඹ ගහ වත්ත > අම්ගහවත්ත > අංගහවත්ත) නම් වී ඇතැයි පැවසේ.

---

[97] රුහුණු අලුත් අවුරුදු සිරිත් - ජයතිස්ස තෙන්කෝන් 32 -33 පිටු- 2015- සී.ස.ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

එහෙත් මෙයට වඩා වෙනස් මතයක්ද පවති. ඉපැරණි කාළයේ දෙවිනුවර සිංහාසන පෙදෙසේ කෝවිල අසල අං ඇදීම සහ ගරා යක් නැටීම ශාන්ති කර්ම සිදු කළ ස්ථානයක් වෙයි. මෙම ශාන්ති කර්ම සිදු කර ඇත්තේ ප්‍රදේශයේ ප්‍රධාන ජීවනෝපායන් වන ගොවිතැන සහ ධීවර කර්මාන්තය සරුවී ගම සශ්‍රීක වී ගම්වාසීන් ට යහපත් ජීවන තත්වයක් උදාකර දීම සඳහාය.

අවුරුද්දක් පාසා සිදු කරන මෙම ශාන්ති කර්මය සඳහා අං කඳක් අවශ්‍යය. මේ සඳහා භාවිතා කර ඇත්තේ පැල පොල් ගසක අං කඳකි. එහි මහත පැත්තේ තවුවක් (හිලක්) විඳ අං ගැට ගැසීම සිදු කරයි. මෙම කටයුත්ත සඳහා අවශ්‍ය අං කඳ වාර්ෂිකව ගෙන යන ලබන ප්‍රදේශය අංගහවත්ත නමින් ජනප්‍රවාදයේ පවති.

පැරණි ඕලන්ද පාර - Old Dutch Road

මෙම මාර්ගය දෙවිනුවර උතුර ග්‍රාම නිලධාරී වසමට අයත්ය. දෙවිනුවර නගරයේ සිට ගන්දර දෙසට ගමන් කිරීමේදී දෙවිනුවර පිරවුම්හල පසුකර මද දුරක් ගමන් ගන්නා විට වම් අතට දිවෙන අතුරු මාර්ගයකි. මෙම මාර්ගය වර්තමානයේ හේන හන්දියෙන් අවසන් වේ. නමුත් පෙරකළ මෙම මාර්ගය හේන හන්දිය දක්වා නොගොස් වෙල්යාය මැදින් ගොස් (මැදගොඩ) **සුදුගල** හන්දියෙන් වර්තමාන තංගල්ල - මාතර මාර්ගය හා සම්බන්ධ වී ඇත.

ලන්දේසීන් මේ රට යටත් කර ගැනීමෙන් පසු තම භට කණ්ඩායම් සමඟ ගමන් කිරීමේදී ප්‍රධාන මාර්ග මෙන්ම ගම්මාන හරහා වැටුනු අතුරු මාර්ගයද නිර්මාණය කර ගත්හ. ඒ අනුව නිර්මාණය කළ, මීට පෙර භාවිතා නොකළ අතුරු මාර්ගයකි **පරණ ඕලන්ද පාර**. මෙය **Old Dutch Road** ලෙස පෙරදී භාවිතා වී ඇත. මෙලෙස අතුරු මාර්ගයන් මොවුන් භාවිතා කර ඇත්තේ ආරක්ෂාව සහ ගම්මාන වල තොරතුරු ලබා ගැනීම අරමුණු කර ගනිමිනි.

දෙවිනුවර මධ්‍යම ග්‍රාම නිලධාරී වසමට දෙවිනුවර අතීතයට සම්බන්ධ ඉතා පැරණි ළිං හතරක් (04) දක්නට ලැබේ. පිළිවෙලින් ඒවා,

1. ගල්ළිඳ
2. කජ්ජුගහ ළිඳ
3. තෝන්ඩිය ළිඳ
4. හුනියම් පොකුණ

නම් වෙයි.

දෙවිනුවර ප්‍රදීපාගාරය

දෙවිනුවර දකුණ ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇති පුරා විද්‍යාත්මක වටිනාකමකින් හා සංචාරක ආකර්ශනයකින් යුතු ස්ථානයක් ලෙස ප්‍රදීපාගාරය හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකාවේ පිහිටා ඇති උසම ප්‍රදීපාගාරය වන මෙහි උස අඩි 160 කි. මුල වට ප්‍රමාණය අඩි 170 කි. කපන ලද කලුගල් වලින් නිර්මාණය කරන ලද අටපට්ටම් හැඩයෙන් යුත් මෙය අනුක්‍රමයෙන් ඉහලට යනවිට වට ප්‍රමාණයෙන් අඩු වී ගොස් තිබෙන අයුරු සිත්ගන්නා සුලුය. මෙය තට්ටු 09 කින් යුක්තය. පියගැට 222 ක් නැගීමෙන් මුදුනේ ප්‍රදීපය කරා ළංවිය හැක.

නිලධාරීන් සඳහා ඉදිවූ ගෙයද කදිම දර්ශනයකි. කපන ලද ගල් කුට්ටි වලින් සාදා ඇති මෙහි ඇතුළු බිත්ති සුණු පිරියම් කර කිරි සුදු පැහැයෙන් බැබළෙයි.

ක්‍රි.ව.1887 දී පැවැත්වුණු **වික්ටෝරියා** රැජිනගේ දියමන්ති ජුබිලි මංගල දින මෙම ප්‍රදීපාගාරයට මුල් ගල් තබන ලදි. ක්‍රි.ව. 1889 එම රැජිනගේ උපන්දිනයදා ලංකාණ්ඩුකාරවරයෙකු වූ **සර් ආතර් හැමිල්ටන් ගෝඩන්** මහතා මෙය විවෘත කර ඇත.

මෙහි නිර්මාණ ශිල්පියා වනුයේ **සර් ජේම්ස් නිකොලස් ඩග්ලස්** මහතාය. මෙම ඉදිකිරීමට ඒ අසල සමීපයේ පිහිටි සුදුගල් උපයෝගී කරගෙන ඇති අතර ගඩොල් හා වානේ එංගලන්තයෙන් ආනයනය කර ඇතැයි පැවසේ.

මෙම ප්‍රදීපාගාරයට ඉදිරියෙන් තවත් සුවිශේෂී සිහිවටනයක් ඇත. එනම් ලංකාවේ දකුණු කොනේ පිහිටි අවසාන මැණුම් ලකුණය. ශ්‍රී ලංකාව සතර අතටම මැනීමේදී ආරම්භක ස්ථානය මෙම සළකුණය.

වෙලේගොඩ

විල් වැව් ආශ්‍රිත ගම් මණ්ඩිය **විල්ගොඩ** නමිය. දැන් භාවිතා වන්නේ **වෙලේගොඩ** යනුවෙනි. මෙම භූමී ප්‍රදේශය පහත්ය. විල් ආදී ජලාශ මෙහි තිබූ බවට එයද සාක්ෂියකි.

දෙවිනුවර **තොන්ඩිය** ළිං වලින් එකක් මෙම වසමේ පිහිටා ඇත.

මෙම ගමට අයත් අතුරු ගමක් වන්නේ **පහන් සිල්ලය.** පනා (කොස් ගස්) සමූහයෙන් සිසිල් වූ ගැවැසි ගත් ප්‍රදේශය **පහන්සිල්ලය.** එය **පනන්සීල්ල** යනුවෙන්ද බැවහර වේ.

නුගේගොඩ

මෙම ග්‍රාමයට නම සැදී ඇත්තේ ඒ ගමේ පිහිටි නුග ගසක් හේතුවෙනි. ගමේ ආරම්භක ස්ථානය නුග ගසක් තිබෙන බැවින් **පුංචි නුගේ** ලෙසද පසුව එය **නුගේගොඩ** ලෙසද හඳුන්වා ඇත.

පුරා විද්‍යාත්මක හා ඓතිහාසික අගයකින් යුත් ස්ථාන සහ ස්මාරක කිහිපයක් මෙම වසමට අයත්ය. ඒ ලංකාවේ උසම සැතපුම් කණුව වූ **103 වැනි සැතපුම් කණුව**, රක්ෂිතයක් ලෙස නම් කර ඇති **කලපුව** සහ **දඬුබර ඇල**ය.

103 වැනි සැතපුම් කණුව

මාතර - තංගල්ල ප්‍රධාන මාර්ගයේ දෙවිනුවර මහජන බැංකුව ඉදිරිපිට පිහිටා ඇති 103 සැතපුම් කණුව අඩි 07 ක් පමණ උසකින් යුක්තය. තනි කර කලුගලෙන් නෙලන ලද මෙම කණුවේ අඩි 04 ක් උසකින් 103 කොටා ඇත. එම ස්ථානයේම මදක් පහලින් ඉංග්‍රීසියෙන් **DONDRA -** ඩොන්ඩ්‍රා යනුවෙන් සටහන් කර ඇත.

කණුව මුදුනෙහි රුහුණු කොඩියේ ප්‍රධාන ලාංඡනය වන කුරු ඇතා සටහන් කර ඇති අතර ඊට මදක් ඉහළින් සිංහලෙන් **දෙවිනුවර** යනුවෙන් සටහන් කර ඇත.

කුරු ඇතා රුහුණට සුවිශේෂී වූ සතෙකි. රුහුණේ කොඩිය වූ කුරු ඇතා කොඩියටද ඌ ඇතුලත්ය. නොටොල්පිටියට නුදුරින් වූ **බටඅත** කැලයේ අතීතයේ බහුලව විසූ කුරුඇතා සුවිශේෂී වූ ඇතෙකි. ශරීර ප්‍රමාණයෙන් ඉතා විශාල නොවූ ඌ **රුහුණු ගැටයා** නමින්ද හැඳින්වේ. යුධබිමේදී ඉතා එඩිතරව සටන් කරණ කුරු ඇතා කිසිවිටෙක සටනින් පැරද පලා නොයන්නෙකි. ජය ග්‍රහණය නොකරන්නේ නම් මැරී වැටෙන තෙක් සටන් කරන ස්වාභාවයක් ඌ තුළ දක්නට ලැබේ.

රුහුණේ ජනතාවගේ ධීරවීරභාවය සංකේතවත් කිරීමට මෙම **කුරු ඇතා** රුහුණේ කොඩියට ඇතුලත් කර ඇත.

මීට අවුරුදු 200 කට පමණ පෙර එනම් 1808 දී පමණ පෙර මෙම මායිම් ගල පිහිටුවා ඇති බව සැළවේ. ඒ රජ ගෙදර සිට (වත්මන් ජනාධිපති මැඳුර) ශ්‍රී ලංකාවේ සැතපුම් සලකුණ කරගෙන යද්දීය. එකළ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ ඉංග්‍රීසී ජාතිකයෙකු වූ **ග්‍රැන්ඩ් විල්** නැමැත්තා විසින් මෙම සැතපුම් කණුව ස්ථාපිත කර ඇත.

මේ රටේ සුවිශේෂී සන්ධිස්ථානයක් වන දෙවිනුවර සැතපුම් කණුව අනෙකුත් සැතපුම් කණුවලින් වෙනස්ම ආකාරයට නිර්මාණය **ග්‍රැන්ඩ් විල්** මහතාට අදහසක් පහළ වී ඇත. ඒ අනුව මෙම සුවිශේෂී සැතපුම් කණුව ස්ථාපිත කළ බව සිතිය හැක.

වාව්ව

දෙවිනුවර නගර සීමාවේම පිහිටි **වාව්ව** අද වෙනමම ග්‍රාම නිලධාරී වසමක් ලෙස ස්ථාපිත වී ඇති අතර විවිධ ජනශ්‍රැති වලට තෝතැන්නක් වී ඇත. **වාව්ව** ප්‍රදේශයේ අතුරුගම් ලෙස දංකැටිය, කන්දවත්ත හා කන්ද ගොඩැල්ල ඇතුලත්ය.

වාව්ව ගමට දකුණු දෙසින් මුහුද පිහිටා ඇති අතර මුහුදු මට්ටමට වඩා අඩි 30 - 40 ක් පමණ (**වාව්ව** වැල්ල හැර) තරම් උසකින් ගම පිහිටා ඇත. මුහුදට දළ බෑවුමකි. මුහුදු වෙරළක් නැත. ඒ වෙනුවට විශාල ගල්කුළු (ගල්කුට්ටි) මුහුදට මායිම් වේ. මේ ගල්කුළු අතර නොයෙක් ආකාරයේ විවර හා හිඩැස් පිහිටා ඇත. ගොඩබිම දෙසට කා වැදුණු බොකු ආකාර ස්ථාන 02 ක්ද පිහිටා ඇත.එයින් එක් ස්ථානයක් කුඩා ධීවර බෝට්ටු නැංගුරම් පලක් ලෙස යොදා ගන්නා අතර අනෙක් ස්ථානය කොහු කර්මාන්තය සඳහා අවශ්‍ය පොල් ලෙලි පල්කරන ස්ථානයක් ලෙස භාවිතා කරයි.

මෙවැනි ගල්කුළු සහිත කඳු ප්‍රදේශයක් මුහුදට මායිම්ව පිහිටා ඇති බැවින් මුහුදින් හමා එන සුළඟ මෙම ගල් අතර වැදීම නිසා හෝ්.... හෝ්..... ශබ්දය සමඟ හූ.... ශබ්දයක් නිතර ඇතිවේ. එමනිසා වාතයේ ඇති වන හූව නිසා ගමට

වා... හූව > වාහූව > වාවූව > වාව්ව යන පරිදි ව්‍යවහර වූ බව ජනප්‍රවාදයෙහි සඳහන් වෙයි.

මෑතක් වනතුරුම ගමේ ප්‍රධාන ජීවනෝපාය වී තිබුනේ වී ගොවිතැනයි. එහෙත් අද වන විට වී ගොවිතැන ක්‍රමයෙන් ඈත් වී ජනතාව ධීවර කර්මාන්තය හා බැඳුණු රැකියාවල නිරතව සිටිති. එදා කුඹුරු ගොවිතැන් කළ කුඹුරුයායන් අද වන විට වල්බිහි වී ඇත. එම වැවේ සිට මුහුදට ඇලක් නිර්මාණය කොට වී ගොවිතැන කර ඇති බව ජනවහරේ කියැවේ.

වාව්වේ වැවේ වී වැව්වා යනුවෙන් එකම අකුරකින් එකම වැකියක් නිර්මාණය වී ඇත්තේ මෙම වැව ඇසුරෙනි. එදා සරුවට වගා කළ කුඹුරුයාය **මානිල්වල** වෙල්යාය ලෙස ප්‍රකටය.

වාව්ව ගමේ පැරණි ජලමූලාශ්‍ර විශාල ප්‍රමාණයක් තිබූ බව සඳහන් වේ. එහෙත් අද වන විට,

- සල්ගහ ගල් ළිඳ
- පන්සලේ ගල් ළිඳ
- උළු පට්ටලේ හේන ගල් ළිඳ
- ආරේ ළිඳ
- මානිල්වල ළිඳ

පමණක් ඉතිරී වී ඇත. මෙම ළිං ඇත සිංහල රජ දවස දක්වාම පැරණි බව සඳහන් වේ. මෙම ළිං බොහොමයක්ම විශාල ගල් කුට්ටි යොදා ගනිමින් ක්‍රමවත්ව නිමවා ඇත.

කහ පොකුණ

කහ පොකුණෙහි ජලය එකළ කහ පැහැයෙන් යුතු විය. එනම් කහ දියර පිරුණු විලකි. කහ දියර විෂ බීජ නාශකයක් ලෙස පොදු පිළිගැනීමක් ඇත. චාරිත්‍රානුකූලව සිදු කරන සුබ කටයුතුවලදී කහ දියර වලින් පිරිසිදු වීම අද දවසේද සුලභ කාරණයකි.

දෙවිනුවර දේවාලයේ පෙරහැර දේවාලයට ගමන් කිරීමට පෙර කහ පොකුණ දක්වා පැමිණ එහි ජලයෙන් සියලුම දෙනා පිරිසිදු වෙයි. අනතුරුවය යළි පෙරහැර ගමන් අරඹනුයේ. එසේම දේවාලයට යන බැතිමතුන් තම පුද පඬුරු කහ දියර යොදා පිරිසිදු කර ගන්නේ මෙහි ජලයෙනි. ඒ නිසාම මෙම පොකුණේ ජලය නිතරම කහ පැහැ ගැන්වී පැවතුණු බැවින් මෙම පොකුණට **කහ පොකුණ** නමින් ව්‍යවහරයට පත් වී ඇත.

පෙරහැරේ මාර්ගය වෙනස් වීම නිසා අද මෙම චාරිත්‍රය සිදුකෙරෙන්නේ නැත. **කහ පොකුණ** වර්තමානයේදී කවාකාරව පිහිටා ඇත.

සිංහාසන පෙදෙස

දෙවිනුවර නගරයට ආසන්නයේම පිහිටා ඇත. උපුල්වන් දෙවියන්ගේ සිංහාසනය පිහිටි ප්‍රදේශය **සිංහාසන පෙදෙස** නමින් අදත් ව්‍යවහාරයෙහි පවතී. මහා දේවාලයේ සිට සිංහාසනය තෙක් ගල්කණු තිබුණු බවට සාක්ෂි තිබේ. මේ රජතුමාගේ සිංහාසනය යැයි ඇතමෙකු වැරදි මතයක් ඉදිරිපත් කරයි. මේ රජුගේ සිංහාසනය නොවේ.

සිංහාසන කෝවිල පිහිටා ඇත්තේ සිංහාසන පෙදෙසේය. ඒ නිසා සිංහාසන පෙදෙස යැයි බැවහරේ පවතින බවට තවත් මතයකි. කිහිරිකඳට ආරූඪ වූ දෙවියන් පා වී ආවේ මෙම වැල්ලට යැයි ජනශ්‍රැතියෙහි සඳහන් වෙයි. ඒ නිසා **සිංහාසන වැල්ල** යැයි අතුරුගමක් ද වෙයි.

මගුල් තොට වැල්ල නමින් හැඳින්වෙන්නේ ද සිංහාසන වැල්ලය. කිහිරි කඳ පාවී ගොඩට ගනු ලැබූ උතුම් තොටුපල නොහොත් මංගල තීර්ථය මගුල් තොට වැල්ලය. මේ වැලි පෙදෙස **පාතාරඹ** දක්වා විහිදේ.

අදත් මෙම මුහුදු තීරය **මගුල් තොට වැල්ල** නමින් ව්‍යවහාරයෙහි පවතී. මගුල් වැල්ල යනුත් මෙයමය. **තිසර** සන්දේශයෙහි **මගුල් වැල්ල** සඳහන් වන්නේ මෙසේය.

"එන සලෙළුන් කොපමණ පානා	ඉඩම
පුර වෙසඟන සැදි මාවේ මුතු	මඩම
මැද බැඳි මිණක් වන් ලෙවි නඳනා	මඩම
බලමින් මඟුල් වැලි තෙලෙහිම කර	වැඩුම"[98]

රාජකීය පිරිස සුබ විහරණය සඳහා දාහය නිවාගනු පිණිස සක්මන් කිරීම් ආදිය කළ හෙයින් මේ වැලි තලාව **මඟුල් වැල්ල** නමින් පතළ වූ බවද ඇතමෙකු පවසති.

මඩන්වැල්ල, සිංහාසන පෙදෙසේ පිහිටි ගමකි. සිංහාසනය සමීපයේ සෑදුණු මඩම ආශ්‍රිත වැලි තලය මඩම් වැල්ල > මඩන්වැල්ල නමින් ප්‍රකට වී ඇත.

අං ඇදීමේ උත්සවය පැවැත්වූ ප්‍රදේශය අංපිටියයි. එය අද **අම්පිටිය** නමින් බැවහරේ පවතී. **අම්පිටිය** සිංහාසන පෙදෙස් පිහිටි අතුරුගමකි.

දෙවිනුවර ඇසල පෙරහැර සෑම වසරකම සිංහාසන පාර, අම්පිටිය පාර හා ප්‍රදීපාගාර පාර ඔස්සේ වීදී සංචාරය කරයි. පෙරහැර යන අතරතුර **සිංහාසන පුරාණ කෝවිලට** විශේෂ පුද පූජා පවත්වයි.

---

[98] තිසර සන්දේශය - 29 කවිය - මහාචාර්ය ඒ.වී.සුරවීර සංස්කරණය -සී.ස.ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ-1991

කපුගම

දෙවිනුවර ශ්‍රී උපුල්වන් විෂ්ණු දේවාල පරිශ්‍රයේ සිට කිලෝමීටර් 02කට පමණ නුදුරින් තංගල්ල දෙසට වන්නට පිහිටි කපුගම අතීතයේ ඉතා පෞරාණික වටිනාකමකින් යුත් විශාල ගම්මානයකි. දෙවිනුවර දේවාලය හා සම්බන්ධ කටයුතු වල යෙදුනු කපුමහත්වරු ජීවත්වූ ගම් ප්‍රදේශය **කපුගම** නමින් ජනවහරේ සඳහන්වේ. කපුගම ප්‍රධාන ගම දැනට කපුගම මධ්‍යම, කපුගම නැගෙනහිර, කපුගම බටහිර සහ කපුගම උතුර නමින් ග්‍රාම නිලධාරී වසම් 04 කට බෙදා ඇත.

දේවාලයේ යාග හෝම හා තේවා කටයුතු ආදී පූජක කටයුතු සඳහා බ්‍රාහ්මණ පූජකවරු ඇත අතීතයේ සිටි බව සන්දේශ කෘතීන් වලින් මෙන්ම සමකාලීන ඓතිහාසික ග්‍රන්ථ වලින් හෙළිවෙයි. ඒ බ්‍රාහ්මණයන්ගේ වාස භූමිය වූයේ මෙම ගමය. එකල මෙම ප්‍රදේශය **බමුණුගම** හෝ **බ්‍රාහ්මණ ග්‍රාමය** යනුවෙන් වයවහාරයට පාත්‍ර වී ඇති බව පැවසේ. මේ ගමේ **බ්‍රාහ්මණගෙවත්ත** නමින් යුක්ත වතු කිහිපයක් දැනදු පැවතීම මෙයට සාධක ලෙස දැක්විය හැකිය.

විදේශීය ආක්‍රමණ වලදී දේවාලය කඩා බිඳ දැමීමත් සමඟ බමුණන්ගේ පූජක වෘත්තිය අවසන් වී ඇත. කළකට පසුව දේවමෙහෙයට පත්වූයේ ස්වදේශීක පූජකයන්ය. ඔවුන් අදුන්වන ලද්දේ දේවාලයේ කපුරාළ හෝ කපුවා යන නාමයෙනි. ගම් වඩුවක් පැවැත්වීමට **කපු, පත්තිනි** හා **ගී කියන** ගන තුන් ගොල්ලම සිටිය යුතුය.

ගී ගායනා කිරීම් ආදියෙන් හෝ යාදිනි මෙන් හෝ දේව ස්ත්‍රෝත්‍ර කරන අය ගී කියන - හෝ ගී ගයන හෝ ගී ගන යනුවෙන් පතළ වුහ. ඔවුන්ගේද කපුවන්ගේද වාසය වූයේ මේ ගමය. එතැන් සිට මෙම ගම **කපුගම** නම් විය.

මෙම ගම පුරාණ කාලයේදී දේවාලය හා බොහෝ සබදකම් තිබුණු බවට සාක්ෂි අපමණය.

කපුගම ගේ, ගී ගගන ගේ, කපුගම ගී ගගනගේ, පත්තිනි ගේ, හේවා පත්තිනිගේ, ගජමන් පත්තිනිගේ, හේවා ගජමන් පත්තිනි ගේ, හේවා කළු කපුගේ ආදී පෙළපත් නාමයන් කපුවන්ගෙන් අවිච්ඡින්නව පැවතෙන බවට නොබිදිය හැකි සාක්ෂියකි.

කපුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ දක්නට ලැබෙන පහත සඳහන් වතු සහ ඉඩම් සම්බන්ධව ජන වහරේ පවතින තොරතුරු ඉතාමත් රසවත්ය. විචිත්‍රවත්ය.

කෝවිල වත්ත

එවකට කෝවිල්වල වැඩ කරන ලද අය පදිංචිව සිටි නිසා එම ඉඩම **කෝවිල වත්ත** නම් වී ඇත.

හප්පෙගොඩ

හක්බෙල්ලන් මතුවූ ඉඩම **හප්පෙගොඩ** ලෙස හැඳින් වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ගනේගොඩ වත්ත

පුරාණ කාළයේදී ගනේගොඩ නමින් විහාරස්ථානයක් මෙහි පැවති බව ජනවහරේ සඳහන් වූවත් වර් තමානයේදී ඒ පිළිබඳ කිසිදු සාක්ෂියක් දක්නට නැත. මේ පිළිබඳව තවත් මතයක් වෙයි. මහනුවර යුගයේදී සංඝ ශාසනය පිරීහී තිබූ අවධියේදී ගණින්නාන්සේලා නමින් පැවිදි පිරිසක් දිවයිනේ විවිධ ප්‍රදේශවල වාසය කළහ. එබඳු පිරිසක් වාසය කළ ඉඩමගොඩ ගණින්නාන්සේලා > ගොඩ, ගණයන්ගේ ගොඩ > ගණේගොඩ නමින් පසුව ව්‍යවහාරයට පත්වී ඇත.

නාද කපුගේ වත්ත

දේවාල පරිශ්‍රයේ නාථ දේවාලයේ කටයුතු සිදුකල කපු මහතා මෙහි ජීවත්වී ඇති අතර එකළ එය නාථ කපුගෙවත්ත ලෙස ව්‍යවහරට පත්වී ඇත. එහෙත් තවත් මතයක් වන්නේ

දේවාලයේ ස්ත්‍රෝත්‍ර හා ගී ගැයූ (නාද පැවැත්වූ) කපු මහතා ජීවත්වූ වත්ත නාද කපුගෙවත්ත ලෙස හැඳින්වූ බවය.

කුඩා කපුගෙවත්ත

දේවාලයට අයත් ප්‍රධාන කපු මහතාට අමතරව සිටි ඊළඟ කපු මහතා (දෙවැනියා - කුඩා කපු මහතා) ජීවත් වූයේ යැයි සැළකෙන ඉඩම මේ නමින් හඳුන්වනු ලැබූ බව ජනවහරේ සඳහන් වේ.

අලිසන්දරගෙ වත්ත

උපුල්වන් දේවාලයට අයත් අලි ඇතුන් මෙහි ගැට ගසන ලද බවත්, ඔවුන් රැක බලා ගැනීමට සන්දරගෙ නමින් පුද්ගලයකු මෙහි සිටි නිසා එය **අලිසන්දරගෙ වත්ත** නමින් හැඳින්වූ බව ජනවහරේ සඳහන් වේ.

දෙයියන්ගේ වත්ත

ඇසළ පෙරහැර පටන් ගන්නා විට ඒ කාලයෙහි යාචක දානයක් දීම සිරිතකි. ඒ සඳහා ගෙන යන අඩුක්කු පැහිඳුම් මේ ගමේ **දෙයියන්ගෙ වත්ත** යන ඉඩමට රැස්කර දෙවුන්දරට ගෙන යාම ළඟක් වනතුරුම පැවතුණු බව අසන්නට ලැබී තිබේ.

කෝවිලවත්ත

පෙරහැර කාලයට කෝවිල් ආදිය සැරසීමට වුවමනා කෝටු ගොක්අතු ආදී සැරසිලි උපකරණ එක්රැස් කොට ගෙන යන ලද්දේ **කෝවිලවත්තේ** සිටය. මෙයින් පෙනෙන්නේ මේ වත්ත කෝවිල් සඳහා වෙන් කර තිබුනු බවයි. මෙහි කෝවිලක් තිබුනු බවද සමහරු කියති.

පෞරාණික අගයකින් යුත් කුඹුරු රාශියක් මේ ගමේ දක්නට ලැබේ.මේ ඉන් කිහිපයකි.

- නයිදුරයගෙ කුඹුර
- රදාගෙ කුඹුර
- ගල්කැටියෙ කුඹුර
- වැරැල්ල මුරේ කුඹුර
- වලව්වේ කුඹුර
- වරකාව කුඹුර
- ඈහපාන කුඹුර
- පල්ලෙපත් ඔළුව කුඹුර
- උඩදෙණිය කුඹුර
- පෙත්තරේ කුඹුර

කපුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසම තුළ බිබුල නැමැති ස්වාභාවික පිහිටි ඉතා වටිනා දිය බුබුලක් වෙයි. ගොවිතැන් සඳහා ජලය ලබා ගන්නේ මෙම දිය බුබුලෙනි. අතීතයේදී ඉතා විශාල ලෙසින් පැවති මෙම දිය බුබුලට ගල් දමා අලින් ලවා පාගවා වතුර පාරේ සැර අඩුකර ඇත. මෙම බිබුල ඇසුරෙන් පෙත්තරේ නමින් ස්ථානයක් තිබූ බව පැරන්නෝ පවසති.

ගාලෙවත්ත

දෙවිනුවර දේවාලයේ අලි ඇතුන් ගාල් කර ඇත්තේ කපුගම උතුර ග්‍රාම නිලධාරී වසමට අයත් ගාලෙවත්ත නම් ඉඩමේය.

තලල්ල

මෙම ගමේ නම සෑදී ඇති ආකාරය පිළිබඳව මත දෙකක් පවතී. ඒ එක් මතයකට අනුව ඇත අතීතයේ මෙහි තල අල්ලක් ප්‍රමාණයක් වගා කර ඇති අතර එනිසා තල + අල්ල > තලල්ල වූබවය. ගමට නම සෑදී ඇති අතර ආකාරය පිළිබඳ අනෙක් මතය වන්නේ ඇල්ලකන්ද

වැවේ සිට මෙම ගම හරහා ගලා බැස ගිය ඇල දිගේ තල් ගෙඩියක් ගසාගෙන විත් මෙම ප්‍රදේශයේ පැලවී ඇත. ඒ නිසා තල් ගෙඩියක් ඇල දිගේ පාවී ඇවිත් පැලවූ නිසා තල් + ඇල්ල > තලල්ල වූ බවය.

ඇත අතීතයේදී විශාල ගම් ප්‍රදේශයක් වශයෙන් පැවති මෙම ප්‍රදේශය අද තලල්ල, තලල්ල මධ්‍යම, තලල්ල උතුර. තලල්ල දකුණ, තලල්ල නැගෙනහිර යනුවෙන් කොටස් 05 කට බෙදා ඇත.

වසරක් පාසා තලල්ල උතුර කොට්ඨාසයේ නියං කාළයේදී අං ඇදීමේ චාරිත්‍රය පවත්වන අතර ගම්මඩුවක්ද පවත්වනු ලැබේ. මෙයට අමතරව වැහි පිරිතක් කියනු ලැබේ. නියං කාලයට වෙලේ කමතක පිරිත් මන්ඩපයක් සාදා රෑ එළිවෙන තුරු පිරිත් කියා පසුදා උදේ කිරිදානයක් පිළියෙල කර ගම්වාසීන්ට දෙනු ලැබේ. මෙය කිරීමෙන් පසුව වැස්ස ලැබෙන බවට ගැමියන් තුළ දැඩි විශ්වාසයක් පවතී. එම නිසා එයට වැහි පිරිත යන නම ව්‍යවහාර කරති.

ගන්දර

ගන්දර ගමේ නාමය සෑදී ඇති ආකාරය පිළිබඳව මත දෙකක් පවතී. ප්‍රදේශවාසී වැඩිහිටියන් පවසන එක් මතයකට අනුව දාපුළුසෙන් (දප්පුල) රජ සමයේ ගමට පිවිසීමට දවාරයක් (දොරටුවක්) තිබී ඇත. එකළ එය ගම් දොර ගම ලෙස ව්‍යවහර වූ අතර පසුව ගම් + දොර > ගන්දර නමින් ව්‍යවහර වූ බව ජනප්‍රවාදයෙහි සඳහන් වෙයි.

අනෙක් මතය වන්නේ ගම්මාන කිහිපයකට පිවිසීමට තිබූ ප්‍රධාන දොර ගම් + දොර තිබුනේ මෙම ගමේය. එහි විකාශනයක් ලෙස ගම් + දොර පසුව ගම් දොර ඝ ගන්දර යනුවෙන් ව්‍යවහාරයට පත් වී ඇත. මෙම ගන්දොර තිබුනේ එකළ මුහුදු සීමාවට ආසන්නයේ බව වැඩිහිටියෝ පවසති.

වෙරළාසන්න ගම් ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ ප්‍රදාන ජීවනෝපාය වන්නේ ධීවර කර්මාන්තයයි. ධීවර කර්මාන්තය පාරම්පරිකව බොහෝ කාලයක සිට පැවතෙන අතර රජකාලයේ රජුට අවශ්‍ය මාළු සැපයීම සිදු කරන ලද ප්‍රදේශ වලින් එක් ප්‍රධාන ගමක් ලෙස සැලකේ. ගන්දර ධීවර නැංගුරම් පලට දිගු ඉතිහාසයක් පවතින අතර ගන්දර ධීවරයෝ ධීවර කටයුතු සඳහා බලඔරු සහ රුවල් ඔරුද භාවිතා කරති.

දැනට බලඔරු රුවල් ඔරු භාවිතා නොකරන අතර ඒ සඳහා කුඩා රුවල් ඔරු, යාන්ත්‍රික බෝට්ටු සහ බහුදින යාත්‍රා භාවිතා කරති. පැරණි ධිවර උපකරණ වශයෙන් ඇවුලුන් බිලි, පන්න හැඹිලිය, අතංගුව, මුදු ලාම්පුව හා කුඩා ඔරු දක්නට ලැබේ.

වසරක් පාසා ගන්දර **විජයරත්නාරාමය** මගින් දුරුතු පෙරහැරක් ඉතා උත්කර්ෂවත් අයුරින් පවත්වනු ලැබේ. එයට අමතරව මැත කාලීනව ගන්දර මධ්‍යම ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටුවා ඇති මහා භද්‍රකාලී දේව මෑණියන්ගේ පිළිමය නැවිමේ **දෙවියන් නැවීම** නැමැති යාතුකර්මය සිදු කරනු ලැබේ. ධිවර කටයුතු සඳහා පිටත්ව යෑමට පෙර සියලුම ධීවරයන් මෙම දේවාලයට පැමිණ පොල්ගස,පඬුරු දමා ආශිර්වාද ලබා ගැනීම පුරුද්දක් කරගෙන ඇත.

වාර්ෂිකව මෙම දේවරූපය පිටතට වඩමවා සුදු හඳුන් හා එළ කිරි වලින් දෝවනය කොට සියළුම ගම්වාසීන්ගේ උපකාර සහ සහයෝගය ඇතිව දේව දානය සකස් කර ගම්වාසීන්ට බෙදා දෙති. වාර්ෂිකව සෑම මාර්තු මාසයකම මෙම **දෙවියන් නැවීම** යාතු කර්මය සිදු කරනු ලැබේ.ධීවර කටයුතු සඳහා පිටත්ව යාමට පෙර සියලුම ධීවරයන් මෙම දේවාලයට පැමිණ පොල්ගසා, පඬුරු දමා දේවාශිර්වාද ලබා ගැනීම පුරුද්දක් කරගෙන ඇත.

වාර්ෂිකව මෙම දේවරූපය පිටතට වඩමවා සුදු හඳුන් හා එළකිරි වලින් දෝවණය කොට සියලුම ගම්වාසීන්ගේ උපකාර සහ සහයෝගය ඇතිව දේවදානය සකස් කර ගම්වාසීන්ට බෙදා දෙති. වාර්ෂිකව සෑම මාර්තු මාසයකම මෙම **දෙවියන් නැවීම** යාතු කර්මය සිදුකරනු ලැබේ.

ගන්දර වෙරළ පාරෙහි මහ වලව්ව, වැල්ලෙ වලව්ව, මුහන්දිරම් වලව්ව යනුවෙන් වලව් කිහිපයක් ඇති අතර මහ වලව්ව ඉන් ප්‍රධාන වේ. මහ වලව්ව පාමුල දෙපසින් විවෘත පඩිපෙළ සහිත ගොඩනැගිල්ලක් දක්නට ලැබේ. එය අතීතයේ නඩු ඇසූ ස්ථානය යැයි පැවසේ.

ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියනු ලබන වාර්ෂික **කිරිපිඬු** දානයක් ගන්දර දකුණ වසමෙහි සිදු කරනු ලැබේ.සෑම වසරකම මැයි මාසයේ සිදුකෙරෙන මෙම **කිරිපිඬු දානය** සකසනු ලබන්නේ ගම් වැසියන්ගේ ආධාර උපකාර ඇතිවය. ඉර පායන්නට පෙර අළුයමේදී සකස් කර ගන්නා මෙම **කිරි පිඬු** දානය පන්සලට රැගෙන යති. මෙම දානය සැකසීමේදී සඳුන් දර භාවිතා කරනු ලබන අතර මුබවාඩම් බැඳ එම දාන කටයුතු සිදු කරනු ලබන බව දැනුදු එම කටයුතු වල යෙදෙන ප්‍රදේශයේ වැඩිහිටියෝ පවසති.

දෙල්ගල්ල

ජනවහරේ සඳහන් වන ආකාරයට දෙල්ගල්ල ගමේ නාමය සෑදී ඇති ආකාර කිහිපයක් දැක්වේ. ඉන් එක් කියමනක් අනුව අතීතයේ දෙල් ගස් විශාල ප්‍රමාණයක් ගාලක් මෙන් පිහිටා තිබී ඇත. සෑම නිවසකම පාහේ දෙල් ගස් එකක් හෝ දෙකක් පිහිටා තිබීමෙන් දෙල් ගාල ව්‍යවහරයේ පහසුවට දෙල්ගොල්ල > දෙල්ගල්ල නමින් පසුව සැකසී ඇත.

බැදි දෙල් (ගම් දෙල්) ගස් වැටක් වශයෙන් ගම් සීමාවේ පිහිටා තිබූ නිසා දෙල්ගොල්ල > දෙල්ගල්ල ලෙස ව්‍යවහරයට පත්වූ බව තවත් මතයකි.

මෙයට වඩා භාත්පසින්ම වෙනස් වූ අදහසක් ද පවතී. මුල් ආරම්භයේ යම් කණ්ඩායම් දෙකක් මේ ගමේ පදිංචි වී ඇති නිසා දෙගොල්ල පසු කාළයකදී දෙල්ගල්ල වූ බවත් මෙම දෙගොල්ල පසු කාලයකදී සංඛ්‍යාත්මකව වැඩිවී ගමෙහි පදිංචි වීමත් වර්තමානයේද සියලුම දෙනා ඥාතීන් වීමත් මෙම මතයෙහි සත්‍යයක් ඇතැයි පැවසේ.ගම නිර්මාණය වීමට දෙගොල්ලක් මුල්වූ නිසා දෙගොල්ල > දෙල්ගල්ල වී ඇත.

ගමේ ප්‍රධාන ජීවනෝපාය කෘෂි කර්මාන්තය වන අතර ගොයම් කපා පාගා ලබා ගත් පළමු වී පාවර වලින් පෙර දින පිරිත් කියා පසුදින දේව දානය හා කිරි දානයක් දීම සිදු කෙරේ. වැසි නොමැති කාලයට වැහි පිරිතක් කීම, තොවිලය, ගිනි පෑගීම වැනි යාතුකර්ම පවත්වා දෙවියන්ගෙන් ආශිර්වාද ලබා ගැනීම සිදු කරයි.

නාඔටුන්න

රුහුණේ නාග සමය හා සම්බන්ධ දීර්ඝ ඉතිහාසයක් ඇති ගමක් ලෙස සඳහන් වේ. නාඔටුන්න යන නම නිර්මාණය වීම පිළිබඳව විවිධ කතා පුවත් ජන වහරේ සඳහන්ව ඇතත් ඒ පුරාකථා වලින් එය තහවුරු කිරීමට අනුබලයක් ලැබෙන්නේ නැත.

දෙවිනුවර රාජධානිය පිහිට වූ **දාපුළුසෙන්** (සාමි දප්පුල) රජතුමා දිය නෑම සඳහා නාඔටුන්න කැකිරිවත්ත ජලාශයට පැමිණෙන සිරිතක්ව පැවතිනි. දිනක් ජල ස්නානයට පැමිණි රජතුමා ඔටුන්න ගලවා තබා ස්නානය කොට නැවත රජ මාළිගය කරා ගොස් ඇත්තේ ඔටුන්න අමතකවීමෙනි. පසුව සෙන්පතියෙක් යවා ඔටුන්න ගලවා තැබූ ස්ථානයෙහි සොයා බලා ඇත. එහෙත් ඔටුන්න තිබූ තැන දක්නට නොවීය. සෙන්පතියා ගොස් **'නෑ ඔටුන්න'** යැයි රජතුමාට පවසා ඇත. ඒ අනුව **'නෑ ඔටුන්න'** යන්න **නාඔටුන්න** වී යැයි ජනවහරේ පවතී.

මෙම නාඔටුන්න ගම පැරණි කාළයේ හඳුන්වා ඇත්තේ **නාඋරුන්න, නාඔරුන්න** හා **නාවඳුන්න** යන නාමයන්ගෙන් බව පැහැදිලි වේ. **නා උරුන්නේ වැල්ල, නාවුරුන්නේ පංසල** (ලංකා විහාරය) යන ස්ථාන නාමයන් මීට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැක.

ලංකා විහාරය යැයි අද හැඳින්වෙන විහාරස්ථානයේ පැරණි නාමය **නාගවඩ්ඩන** විහාරය යැයි සඳහන් වේ. **මහාවංශයෙහි** සඳහන් වන අන්දමට **IV වන දප්පුල** (ක්‍රි.ව. 827 -843) රජතුමා නාගවඩ්ඩන විහාරයට බොහෝ වූ භෝග ග්‍රාම දානය සිදු කර ඇත. මේ පිළිබඳව ආචාර්ය **කඹුරුපිටියේ වනරතන** හිමියන් සිය **මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය** පෙතෙහි මෙසේ සඳහන් කර ඇත. "මෙයින් නාඔටුන්නේ බිමින් ආ **බුද්** නම් තැනැත්තා ලියූ ගීයක් සිගිරි කැටපත් පවුරේ ගී අතර ඇත. එම නිසා **බුද්** නැමැත්තා රුහුනේ නාවඩුන්නේ දැයි සෙවිය යුත්තකි.

දෙවිනුවර **VII වන විජයබාහු** ලිපියෙහි **නාවඩුන්න** යනුවෙන් සඳහන් නාමය මේ **නාවඩුන්නට** විය යුතුය[99] සමහර පැරණි පිං පත්‍රවල **නාවඩුන්නේ** නාමය **නාවදුන්න** යයි සඳහන්ව ඇත. මේ ගම කුඹුරක පිහිටුවා තිබෙන ගල් කණුවක නාග රූපයක්ද කොටා ඇත. ගමේ නමින් පැරණි නාග සමය හා සම්බන්ධතාවයක් පෙනෙන බැවින් **වඩුන්නාගල නාගයෝ** යයි ඉතිහාසයෙහි සඳහන්ව ඇත්තේ **නාවඩුන්න** නම වැසි අයදැයි සොයා බැලිය යුත්තකි"[100]

රබෙල් අස්න නම් පද්‍ය ග්‍රන්ථයෙහි මෙසේ සඳහන්ව ඇත.

"නාග දින්නේ අරා පිරිවර මහෝදර නාරද

කැළණි පුර

නා ඔටුන්නේ සුලෝදර නා සහ සටන්

මිණි පල ඟයට පෙර

ඒ පටුන්නේ පිහිටි තෙල් බෝවිටි වෙහෙර

කළ මැතිඳු පර පුර

ශ්‍රී පසන්නේ රබෙල් මෙ මැතිඳු උපුල්

පුන්සඳ විලස ලකඹර"

තෙල්බෝවිටි වෙහෙර ලෙස හඳුන්වන්නේ වර්තමාන ලංකා රජමහ වෙහෙර යැයි සඳහන් වේ.[101]

ග්‍රාම මණ්ඩපාරාමය **දාපුළුසෙන්** (සාමි දප්පුල) රජ දවස ගම්මඩු පැවැත්වූ ස්ථානය අදටද **ගම් මඩුව පන්සල** නමින් ප්‍රසිද්ධව ඇත. තවද **බණමඩුව කොරටුව** නමින් ඉඩමක්ද ඇත. එයද ජනප්‍රවාදයේ සඳහන් වන්නේ රජ දවස බණමඩු පැවැත්වූ ස්ථානය යනුවෙනි. එයද පිහිටා ඇත්තේ කැකිරිවත්ත පොකුණ ආසන්නයේය.

මෙගම පුධාන ජීවනෝපායන් වන්නේ වී ගොවිතැන, ධීවර කර්මාන්තය හා රන් කර්මාන්තයයි.

පාතෙගම

පැරණි අතීතයකට නැකම් කිව නොහැකි මෙගම එක් දහස් අටසිය ගණන් වල හඳුන්වා ඇත්තේ වල්පිට යන නමින් බව ප්‍රදේශයේ පැරැන්නෝ පවසති. එකළ මෙම ප්‍රදේශය වනාන්තර වලින් ගහණ ප්‍රදේශයක් වී ඇත. ආරම්භයේ පවුල් 5 - 6 ක් පමණ පදිංචි වී හේන් ගොවිතැන් කටයුතු වල යෙදී ඇති බව පැවසේ. අද ඉඩම් වලට ව්‍යවහාර වන නම් වලින් ඒ බව තහවුරු වෙන බව ප්‍රදේශයේ වැඩිහිටියෝ පවසති. කපුවටුන හේන,දුණුමඩල හේන, වෙහෙරගොඩ හේන හා හේන වත්ත ඉන් කිහිපයකි.

වැව කේන්ද්‍ර කරගත් කෘෂි ආර්ථික රටාවක් තිබූ අතර ඒ පිළිබඳව යම් යම් සාධක අද දක්වාම පවතී. ගම තුළ වැව් තුනක් එකළ තිබූ බව සඳහන්ය. අදත් වෑ දෙනිය, ඉහළ දෙනිය වැව හා හේන යන නම් වලින් ඒ බව තහවුරු වේ.

මෙම ගම අද වන විට පාතෙගම උතුර සහ පාතෙගම නැගෙනහිර යනුවෙන් ග්‍රාම නිළධාරී වසම් දෙකකට බෙදී ඇත.

---

[99] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි - 156 පිටුව 1994

[100] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි - 156 පිටුව 1994

[101] සිරි සුමනාරතනාභිනන්දන උපහාර ග්‍රන්ථය - 30 පිටුව

පාතෙගම නැගෙනහිර කොට්ඨාසයේ 15 වන සියවසේ ආරණ්‍ය සේනාසනයක් පැවති අතර කාළගුණ හේතුවෙන් දුර්භීක්ෂයක් හමුවේ දානය නොලැබීමෙන් භික්ෂූන් වහන්සේලා ප්‍රදේශය හැර ගොස් ඇත. වෙහෙරගොඩ වත්ත, වෙහෙරගොඩ හේන යන ග්‍රාම නාම එකළ විහාරස්ථානයක් පැවති බවට නිදසුන් ලෙස දක්වයි. අතීතයේ වගාවන් කළ ඉඩම් වල නම් අදත් භාවිතා කෙරේ. මහහේන, හේනෙ වත්ත, මහ කොරටුව, බෝගහ හේන, අලහේන්පිට්ටනිය, හේනෙ ගෙදර, දිවියන් ගහ කොරටුව, දුණු මඩල හේන ඉන් කිහිපයකි.

මෙම ගමේ මුල් පදිංචිකරුවන් වී ඇත්තේ උඩරට ප්‍රදේශයෙන් පැමිණි හෙට්ටිආරච්චි යන වාසගම දැරූ සහෝදරයන් දෙදෙනෙකු බව පැරැන්නෝ පවසති.ඉන් එක් අයෙක් **වල්පිටට** පැමිණ පදිංචි වී ඇත. අදත් එම පාරම්පරික පවුල් රාශියක් ගමේ සිටින බව පැවසේ. අනෙක් සහෝදරයා **පාතෙගම දකුණට** ගොස් පදිංචි වී ඇති අතර අදත් ඔහුගෙන් පැවැතෙන්නෝ එගම වෙසෙති.

ගමේ බොහෝ ඉඩම් නම් කර ඇත්තේ ඉඩමේ පැවති විශාල ගසක නම අනුවය. ඡූල්ගහ වත්ත, සපුගහවත්ත, කහට ගහ දෙණිය, බෝගහ හේන නිදසුන් වේ.

ගමේ විහාරස්ථානය මුල් වී ප්‍රදේශයේ මංමාවත් ජනතාව ශ්‍රමදානයෙන් මුල් කාළයේ සකස් කරගෙන ඇති අතර 1930 පමණ ආරම්භ වූ විදුහල කේන්ද්‍ර කරගෙන ගමේ සංවර්ධනය ආරම්භ වී ඇත.

අපරැක්ක

ජනප්‍රවාදගත කරුණු අනුව දුටුගැමුණු යුගයට සබඳතාවයක් දක්වන **අපරැක්ක** ගම එම නාමය ව්‍යවහර වීමට පෙර හඳුන්වා ඇත්තේ **කිතුලාවල** නමින් බව පැරණි තොරතුරු වල සඳහන් වේ. **අපරැක්ක** වර්තමානයේ උඩ අපරැක්ක, උඩ අපරැක්ක නැගෙනහිර, පල්ලෙ අපරැක්ක, අපරැක්ක උතුර යනුවෙන් ග්‍රාම නිලධාරී වසම් 04 කට බෙදා ඇත.

ජනශ්‍රැතියේ සඳහන් වන අන්දමට **දුටුගැමුණු** කුමාරයා පලාගොස් වෙස් වලාගෙන මෙම ගමට පැමිණ ඇත. ඇතැම් කතා පුවතකට අනුව ඔහු මෙගමට පැමිණ ඇත්තේ **එළාර** රජ හා පළමුවෙනි වර සටන් කොට පැරදීමෙන් පසුවය. කෙසේ හෝ මෙම ගමට පැමිණි **දුටුගැමුණු** කුමාරයාට අධික බඩගින්න නිවා ගැනීමට නිවසක සිටි අම්මා කෙනෙකු සුන් සහල් කිරිබත් පිඟානක් පිරිනමා ඇත.

අධික බඩගින්න නිසා කුමාරයා එය අත පිච්චි පිච්චි තැනින් තැනින් අනුබව කරද්දී මහලු අම්මා ‘පුතේ, උඹේ කෑමත් **දුටුගැමුණු** කුමාරයා යුද්ධ කරනවා වගේ’ යැයි පවසා ඇත. ‘ඇයි අම්මේ එහෙම කියන්නේ’ යැයි කුමාරයා ඇසූ විට ‘කලබලේ ඔහොම කරහම කන්න බැහැනේ. කොනින් කොන පටන් ගන්න. ඉස්සර වෙලා බත් ටික පිඩු කරන්න. ඊට පස්සේ නිවෙන්න අරින්න.දැන් කන්න’ යැයි උපදෙස් දී ඇත.

එම උපදෙස් අනුව යුද්ධයෙන් ජයගත් **දුටුගැමුණු** කුමාරයා, තමන්ට රක්ෂාවරණය සැපයූ අම්මාට **‘අපරැකි අම්මා’** යන නමින් මෙම ගම්වරය ලබා දී ඇතැයි පැවසේ.

එහෙත් මෙම ජනශ්‍රැතිය ගැන වෙනස් මතයක් දරණ ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමියන් ගැමුණු කුමරු පියාට අකීකරුව පැනගොස් සිටියේ කොත්මලයේ සිට මාතර ප්‍රදේශයේ යැයි කීමට හේතු සාධක නොමැති කථාවක් බව පවසයි.[102]

මීට වඩා වෙනස් ජනප්‍රවාදයක්ද ඇත. **VI වැනි බුවනෙකබාහු** රජ දවස (ක්‍රි.ව. 1464 - 1471) විසූ වීදාගම හාමුදුරුවන්ගේ මුණුපුරෙක් වූ හාමුදුරු නමක් මෙගම වැඩ සිට ඇත. **VI වැනි බුවනෙකබාහු** නමින් රජ වූයේ **සපුමල්** කුමාරයාය. **සපුමල් කුමාරයාට** රාජ්‍යය ලබා ගැනීමට **වීදාගම** මාහිමියන් උදව් කර ඇත. ඒ නිසාම **වීදාගම** මාහිමියන්ගේ මුණුබුරෙකු වූ **අනුරුද්ධ** සාමීන්ට **අපරැක්ක** ගම පූජා කර ඇත. ඒ බව ඓතිහාසික වටිනාකමකින් යුත් ලිපියක පිටපතකින් හෙළි වී ඇත. එම ලිපියේ ".....කෝට්ටේ රාජ්‍යය කළ **VI බුවනෙකබාහු** රජතුමා විසින් **වීදාගම** ස්වාමීන්

---

[102] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමි - 161 පිටුව -1994

මුණුබුරු **අනුරුද්ධ** සාමීන්ට "අප රක්ෂා කළ හෙයින් අපරක්ක යයි" නම් තබා පිදූ ගම **අපරක්ක** වී යැයි සඳහන් වේ.[103]

මෙගම භික්ෂූනමකට තුළ පරිත්‍යාගයක් බව ඔප්පු කළ හැකි පරම්පරා කීපයක්ද අද දක්වාම මෙහි ඇත්තේය. වළදවනගේ, බුගත්දෙන ගේ, කිරිදෙන ගේ, ඇබිත්තගේ, වට්ටෝරු දෙනගේ, බණ කියවන ගේ එම පරම්පරා නාමයෝ වෙති. **අපරක්කේ** තිබූ පැරණි විහාරය මීට නුදුරෙහි **කෝට්ටෙවත්තේ** සිටි **දේර්පම්** පෘතුගීසී සෙනවියා විනාශ කළ හෙයින් භික්ෂූන් වහන්සේලා පලාගොස් මොරවක් කොරළයේ **කොළවෙනි ගම** කැලයක සැඟවී සිටි බවක්ද එම ලිපියේ සඳහන් වේ.

මේ පූජා පත්‍රය අනුව තංගල්ලේ සිට මාතර කිතුලේවෙල දක්වා ඇති විශාල ප්‍රදේශයක් පිදූ බව කියා ඇත.

උඩ අපරක්ක සේපාලිකාරාමයට අයත් ඓතිහාසික **පිංවත්ත** නම් ඉඩමක්ද වෙයි. චාරිත්‍රානුකූලව වසරක් පාසා මෙහි අං ඇදීම, පොර පොල් ගැසීම සහිත දේව තොවිලය සහ දේව දානය ද පවත්වනු ලැබේ. වර්ෂාව නොමැති විට වැස්ස ලබා දෙන ලෙස **පිං වත්ත** භූමියේ පූජාවක් සිදු කරන අතර දේව පෙරහැරක්ද පවත්වයි.

උඩ අපරක්ක නැගෙනහිර වසමට කැන්ද ගහ කොළණිය, නා කුට්ටිය කොළණිය හා ගල්දෙණිය යනුවෙන් ජනපද 03 ක් අයත්ය.

අපරක්ක උතුර වසමට **මහමෙව්නා අසපුව** නම් වූ භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ඇතුලත් වේ.

බැද්දෙගම්මැද්ද

බැද්දෙන් (කැළයෙන්) වට වූ මැද පිහිටි ගම **බැද්දෙගම්මැද්ද** නමින් ව්‍යවහරයට පත්වූ බව මෙගම ඉතිහාසය පිරික්සා බලන විට හෙළිදරව්ව වේ. ප්‍රදේශයේ වැඩිහිටියන් ප්‍රකාශ කරන අන්දමට 1815 දී පමණ **බබා** නැමැති පුද්ගලයෙකු එගොඩවත්ත නාගොඩ වැව යන ස්ථානයේ (පෙර වැවක් පැවති) ගසක් උඩ අට්ටාලයක් (මැස්සක්) බැඳගෙන පදිංචි වීමෙන් ගම නිර්මාණය වී ඇත. බොහෝවිට මෙම පුද්ගලයා ගසක් උඩ අට්ටාලයක් බැඳ පදිංචි වීමට හේතු කිහිපයක් බලපාන්නට ඇත. අතීතයේ මෙම ප්‍රදේශය බැද්දෙන් වට වීම නිසා වන සතුන් බහුල වීමෙන් උන්ගෙන් ආරක්ෂා වීමය. අනෙක් කාරණය වී ඇත්තේ ඔහු මෙම ප්‍රදේශයේ හේන් වගාවේ නියැලීමය.

මෙයට වඩා වෙනස් අදහසක්ද මෙම ගමේ ආරම්භය පිළිබඳව පුරා කතාවක් වෙයි. එනම් හේවායන් හතර දෙනෙකු ගමට පැමිණ ගමේ ජල පෝෂිත ස්ථාන හතරක වගා කටයුතු කරගෙන පදිංචි වූ බව පැවසේ.

- ළිඳ ගාව දෙණිය
- කොකාවල
- කඩවැදුදූව ගෙවත්ත
- කංකානම් ගෙදර

යනු ඒ ස්ථාන හතරය.

දැනට ගමේ පවතින වාසලම් වලට මෙම හේවායන්ගේ නමට ආවේනික හේවා බැද්දගේ, බැද්දෙ කංකානම්ගේ, හේවා කොකාවලගේ වශයෙන් භාවිතා වෙයි. වත්මන් ගමේ සංයුතිය ඒ අනුව සිදුවී ඇත.

.මේ පිහිටි ඓතිහාසික ස්ථානයක් වන්නේ **එගොඩවත්ත** බෝධියයි. **අපරක්කේ පිංවත්තේ** පවත්වන පොල්පිටිය අවසානයේ එගොඩවත්ත බෝධියට පෙරහැරකින් පැමිණ බාරය ඔප්පු කරයි.එම අවස්ථාවට **බැද්දෙගම්මැද්ද** ගම්වාසීන් අලුපුහුල් සමඟ එළවලු බත් සහිත දානයක් පිරිනමයි. මෙම දානය වසර 100 ක පමණ කාළයක සිට සිදුකරගෙන එනු ලබයි.

---

[103] මාතර පුරා විද්‍යාත්මක ඉතිහාසය - ආචාර්ය කඹුරුපිටියේ වනරතන නාහිමි - 161 පිටුව -1994

ආගරවල

පල්ලේ අපරැක්ක ගම්මානයට අයත්ව තිබූ කොටසක් 1981 න් පසු ආගරවල නමින් වෙන්කර ඇත. ගජනායක පරම්පරාව සතු ඉඩම් රාශියක් තිබූ අතර ඇත අතීතයේ මෙම ඉඩම් වල මැණික් ගැරීම් කටයුතු සිදු කර ඇත. ඒ නිසාම ආකරවල > ආගරවල නමින් ගමේ නාමය සුබොච්චාරණයේ පහසුව තකා භාවිතා වී ඇත.

මාතර දිස්ත්‍රික්කයේ ඇති විශාලතම වැව වන ඇල්ලකන්ද වැවේ අතු ඇලකින් ආගරවල ගම පෝෂණය වේ. ශ්‍රී සුධර්මාරාම විහාරස්ථානයට අමතරව මෑත කාලයේ ශ්‍රී විදර්ශි යෝගාශ්‍රමයක්ද ආරම්භ වී ඇත.

කඩවැද්දුව

සිංහල රාජධානි සමයෙහි **කඩවත්** ආරක්ෂක මුරපොළවල් දක්නට ලැබුනි. පළාත් සීමාවෙහි පිහිටි මුරගෙය නොහොත් මුරපොළ **කඩවත** විය. **කඩවත** යනු රජයේ ආරක්ෂාව සඳහා පිහිටුවන ලද මුරපොළය.

1772දී ගොඩනගන ලද පෘතිග්‍රීසින්ගේ මාතර බලකොටුව මූලස්ථානය කරගෙන ඒ ආශ්‍රිත ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා කොටුවෙන් බැහැර ප්‍රදේශය තුළ කඩවත පිහිටුවන ලදි. වැල්ලමඩම, කඩෙන්දුව, හුංගම්ගොඩ හා මඩිහ මාතර කොටුව මුල්කර ගත් ආරක්ෂිත කලාපයේ ප්‍රධාන කඩවත් සතර වේ.[104]

ඒ අනුසාරයෙන් දෙවිනුවර නගරයට පිවිසීමට තිබූ එක් කඩවතක් (දොරටුවක්) වූයේ කඩෙද්දුවයි. මෙම ප්‍රදේශය මඳක් දුව වල් සහිත වීම නිසා,

කඩවත් > දුව > කඩෙවත් > දුව > කඩවැද්දුව යනුවෙන් ව්‍යවහරයට පැමිණ ඇත.

කඩෙදේදුව අද කඩවැද්දුව නැගෙනහිර හා කඩවැද්දුව බටහිර යනුවෙන් කොට්ඨාශ 02 කට වෙන් කර ඇත.

කඩවැද්දුව බටහිර ශ්‍රී ජයවර්ධනාරාමයට අමතරව ඉතා හාස්කම් සහිත තුන්බෝධි විහාරය පුදබිම් අතර වේ.

වල්බුළුගහහේන

දෙවිනුවර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ උතුරු සීමාවේ පිහිටි **වල්බුළුගහහේන** ගම්මානය එම සීමාවේ ඉමේ පිහිටි ගම්මානයයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උතුරු සීමාවට වෙන්නට කටුසර හෝග වගාව මෙන්ම හේන් වගාව බහුලව පැවති අතීත තොරතුරු වලින් හෙළි වෙයි. මෙම සීමාවේ බොහෝ ගම්වල නාමයන් **හේන** යනුවෙන් අගට හෝ මුලට සම්බන්ධ වේ.

වල්බුළුගහහේන මෙම ගම්මානයේ ප්‍රධාන ගම්වලින් එකකි. ඈත අතීතයේ විශාල වල් බුළු ගහක් තිබීම නිසා එම ගහේ නාමයෙන් වල්බුළුගහහේන යනුවෙන් මෙගම නාමය ව්‍යවහරයට පත් වී ඇත.

වල්බුළුගහහේන ගමට අයත් අනෙක් ගම්ද හේන යනුවෙන් සඳහන් වන ගම්මානයන් වීමද සුවිශේෂී කාරණයකි. බතල හේන් ගොඩ, පුහුල් හේන් සහ කැකුණගහ හේන ඉන් කිහිපයකි. මෙම ගමට අයත් විශේෂ අතුරු ගමක් වන්නේ තඹගල ය.

තඹගල ඈත අතීතයේ හඳුන්වන ලද්දේ තඹගල් ලැල්ල නමිනි. තඹගල් ලෑල්ල දොල ආශ්‍රිත ප්‍රදේශය එනමින් පැරැන්නන් හඳුන්වන ලද අතර වර්තමානයේදී ජනතාව උච්චාරණයේ පහසුව තකා තඹගල යනුවෙන් හඳුන්වනු ලැබේ.

---

[104] මාතොට පුරාණය - ජයතිස්ස තෙත්කෝන් - 108 පිටුව - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ -2016

ස්වාභාවික වනාන්තරය මැදින් ඉතා මනස්කාන්තව ගල් තලාවක් මතින් ගලා යන දොල ඉතා තඹ පාටට අතීතයේ දක්නට ලැබුනේ ඉතාමත් තඹපාටටය. එම තඹගල අද ද ලා කහ පැහැයෙන් යුක්ත බව ප්‍රදේශවාසීහු පවසති. මෙම ගල්තලාව යට රජ කෙනෙකුගේ රාජාභරණ තැන්පත් කර ඇතිබවට විශ්වාසයක් පවතින බව ගැමියෝ ප්‍රකාශ කරති.

ගමේ එකම පූජනීය සිද්ධස්ථානය වන තඹගල අරණ්‍ය සේනාසනය රක්ෂිත භූමිය තුළ පිහිටා ඇත.

කිරළවැල්ල

දේව ප්‍රතිමාව තැනුණු කිහිරිකඳ ප්‍රථම වරට පාවූ මුදු වෙරළ මෙයයි. එහෙයින් මේ සමුද්‍ර තීරය ආසන්න වාලුකාතලය **කිහිරිවැල්ල** නමින් ව්‍යවහාරයට පැමිණ අද **කිරළවැල්ල** නමින් භාවිතා වේ.

හිරිමුල්ල

දෙවිනුවර ඇසළ උත්සවය නිමාවීමෙන් පසු මහා දානය දීමේදී කිරි (හාල් කිරි) සම්පාදනයෙහි නියුක්ත වූවන් විසූ මෙම ප්‍රදේශය කිරිමුල හෝ කිරිකිළු නම් විය. කල්යාමෙන් මෙය කිරිමුල්ල නම් විය. එය දැනට **හිරිමුල්ල** යැයි භාවිතා වේ.

සුදුගල

සුදු පැහැති විශාලතම ගලකින් සමන්විතව පැවති ප්‍රදේශය **සුදුගල** නමින් ප්‍රකටය. මෙම ප්‍රදේශය මාතර - තංගල්ල මාගයේ 104 වැනි සැතපුම් කණුව අසල වේ. මෙම **සුදුගල** අද දක්නට නොලැබේ.

පුරාණ ගණදෙවි කෝවිල

දෙවුන්දරට අයත් මෙකී කෝවිල තිබුණේ **වැල්ලෙමඩමේ**ය. ඒ බව **තිසර** සන්දේශයෙහි මෙසේ දැක්වේ.

සිවුමැලි තගෙ සරණ පල්ලේ	තුඩම
පැහැසරි සිරිනි රිවි කිරණැල්ලේ	සැඩම
නොම සිට නෙරළුතුරු සෙවණැල්ලේ	වැඩම
කෙරෙමින් **ගණිඳු** දැක යව **වැල්ලේ**	**මඩම**[105]

මෙම **වැල්ලෙමඩම** ග්‍රාම නාමය සියවස් 08 කට වඩා හෝ පැරණි බව සිතිය හැක. **පරෙවි** සන්දේශයෙහි ද මෙහි වූ **ගණසුරු** කෝවිලක් ගැන සඳහන් වේ.

කමින් පියුම් රා මිණි සමුදුරු	බඩම
බොමින් දිය මියුරු වන නිල්මිණි	කඩම
යෙමින් ඇතුළ වැද මැඳ ගණිසුරු	ඉඩම
එමින් පිටත ලැග ගන් **වැල්ලේ**	**මඩම**[106]

[105] තිසර සන්දේශය - මහාචාර්ය ඒ.වී.සුරවීර සංස්කරණය -30 කවිය- සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ -1991

[106] පරෙවි සන්දේශය - වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය - 134 කවිය - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ -2012

තිසර හා **පරෙවි** සන්දේශවල සඳහන් වන අන්දමට **වැල්ලමඩම** මුල්කරගත් අම්බලමක් හා කෝවිලක් පිහිටා තිබුණි. ඉන්දියන් සාගරය මුල්කරගත් අම්බලම හා කෝවිල කේන්ද්‍ර කරගෙන මේ ප්‍රදේශය ජන ව්‍යවහරයේ භාවිතා වී ඇත්තේ **වැල්ලමඩම** ලෙසයි.

වැල්ලේමඩම බැතිමතුන්ගේ සිත් ගත් සුන්දර ස්ථානයක බව **තිසර** සන්දේශයෙහි පමණක් නොව **කෝකිළ** සන්දේශයෙහි **වැල්ලෙමඩම** ගැන සඳහන් වෙයි.

වැල්ලේ විසුල තර තරගින් ලෙවන්	මිණි
දිල්ලේ ගණිඳු පුදයට ලූ මෙන්	ගෙමිණි
තුල්ලේ සුරිඳු පමනෙමි පෙර මඟ	පැමිණි
වැල්ලේමඩම දැක යන් සිරිසර	ගිහිණි[107]

පරෙවි සන්දේශයෙන් හෙළි වන පුරාවෘත්තයක් අනුව **ගණිඳු** (ගණදෙවි) කෝවිල **රාම සුන්දර** නම් අධිපතියෙකුගේ පාලනය යටතේ පැවති බව පෙනේ. ඔහු එහි ප්‍රධාන පූජකයා ය.

පසිඳු රාම සුන්දර වෙසිඳුගේ	නමින
ගණිඳු වීමන අලුයම බෙරගන	ගොසින
පුබුදු දෙමළ කිවි මියුරන් සහ	තොසින
සිහිදු කොකානද වැන් කියූ ගී	කියන[108]

වැල්ලේමඩම පිළිබඳ දෙවොල් දෙවියන් හා සම්බන්ද ජනප්‍රවාදයක් වෙයි. මෙම ජනප්‍රවාදය අනුව දෙවොල් දෙවියන් වෙරළෙහි සීනිගම, ගිං තොට සහ උණවටුන යන තැන් වලට පැමිණ ගොඩ බැසීමට වරම් නොලැබ පසුව දෙවිනුවර **කීරවැල්ලට** ගොඩ බැස ඇත. දෙවියන් ආරූඩ වූ එම කිහිරි කඳ පසුපස ශාස්ත්‍රධර පිරිසක් පැමිණි බවද එම ජනප්‍රවාදයෙන් කියැවේ. කිහිරි කඳ ගොඩ ගසත්ම යාත්‍රාවට යා නොහැකි වූයෙන් ශාස්ත්‍රධර පිරිස වෙරළට ගොඩබැස එම කිහිරි දේව රූපය සුදුසු ස්ථානයක තැන්පත් කර ඇත. එම ශාස්ත්‍රධර පිරිස නවාතැන් ගත් ස්ථානය **වැල්ලෙමඩම** බව ජනප්‍රවාදයේ එයි.

වැල්ලේමඩම නමින් ව්‍යවහර වූයේ **ගණදෙවි කෝවිල** පිහිටි ප්‍රදේශයයි. මේ දේවාලය පිහිටි ස්ථානය මූදුබත් වී යැයි සැලකේ.

ශිව දේවාලය

කයිසවැල්ල මුහුදු වෙරළ අසල ප්‍රදීපාගාරය අසල **ශිව** දේවාලය තිබූ බව විශ්වාස කෙරේ. මූදු වෙරළේ සිට බඹ 20 ක් පමණ ගොඩින් **මහරඹේ කෝවිල වත්ත** නැමැති ඉඩමේ තිබී ගලින් නෙලන ලද වෘෂභ රූප දෙකක් සහ ලෝහමය දේව රූපයක් ද කලකට පෙර ලැබී ඇත. එහි වූ සෙල්මුවා වෘෂභ රූපයක් දෙවිනුවර රජමහා විහාර භූමියේ දක්නට ලැබේ. අනෙක් වෘෂභ රූපය සුධර්මෝදයාරාමයේ දී අදත් දැකිය හැක.

රස්සන්දෙණිය

රාක්ෂස දෙණිය, රස්සන් දෙණිය වූ බවට මතයක් වෙයි. **රාම රාවණා** යුද්ධය සිදු වූයේ දෙවිනුවර අවට යැයි පිළිගැනීමක් ඇත. ඒ යුද්ධයේදී රාක්ෂස හමුදාව හෙවත් රාවණගේ හමුදාව කඳවුරු බැඳ සිටියේ මෙගම යැයි වැඩිහිටියෝ පවසති. රාක්ෂයන් සිටි දෝණිය පසුව

---

107 කෝකිළ සන්දේශය - වී.ඩී.එස්.ගුණවර්ධන සංස්කරණය - 42 කවිය - - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

108 පරෙවි සන්දේශය - වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය - 145 කවිය - සී.ස. ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ -2012

රාක්ෂස දෙනිය > රස්සන්දෙණිය වූ බව පැවසේ. මාතර - දෙවිනුවර මාර්ගයේ වැල්ලමඩමේ පිහිටි අම්බලම අසලින් කිලෝමීටර් 02 ක් පමණ ගිය විට **රස්සන්දෙණිය** හමුවේ.

වඳුරුදෙනිය

වඳුරාදෙනිය ද **රාම - රාවණා** යුද්ධයට සම්බන්ද ගමක් බව ජනශ්‍රැතියෙහි සඳහන් වෙයි. **රාම - රාවණා** යුද්ධයේදී රාම කුමරුගේ වඳුරු හමුදාවේ නායකයා වූයේ **හනුමා** නම් වූ වඳුරාය. හනුමාගේ නායකත්වයෙන් වඳුරු හමුදාව කඳවුරු බැඳ සිටි ගම **වඳුරාදෙණිය** වූ බවයි ප්‍රදේශවාසීන් සඳහන් කරන්නේ. වඳුරා + ආ + දෙනිය > වඳුරු දෙනිය වූ බවයි පිළිගැනෙන්නේ. මෙගම දෙවිනුවර නුදුරු කපුගම ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇත.

08

I

දෙවිනුවර පාරම්පරික ධීවර කර්මාන්තය

දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දකුණු මායිම මුළුමනින්ම ඉන්දියන් සාගරයෙන් සමන්විත වීම මෙහි ධීවර කර්මාන්තය ව්‍යාප්තවීමට බලපෑ ප්‍රධාන සාධකයකි.මෙම සීමාවට අයත් වන්නේ **වැල්ලමඩමේ** සිට **ගන්දර තලල්ල** සීමාව දක්වා කිලෝ මීටර් 08 ක් පමණ දිගින් යුක්ත මුහුදු වෙරළ හා මත්ස්‍ය සම්පත බහුල නොගැඹුරු මුහුදු තීරුව යි. එම තත්වය ධීවර කර්මාන්තය වැඩි දියුණුවට බලපා ඇත.

පුරාණවැල්ල දෙවිනුවර ප්‍රදේශයේ ඇති එකම ධීවර වරායයි. මෙයට අමතරව නැංගුරම් පොලවල් (තොටුපල) 05ක් දක්නට ලැබේ.

- කිරලවැල්ල
- කයිසවැල්ල
- වාව්ව වැල්ල
- ගන්දර වැල්ල සහ
- නාඹරුන්න වැල්ල

ඒ නැංගුරම් (තොටුපල) පලවල් වේ. සිංහාසනපෙදෙස, දෙවිනුවර උතුර, දෙවිනුවර දකුණ (කයිසවැල්ල), දෙවිනුවර මධ්‍යම, දෙවිනුවර බටහිර, දෙවිනුවර නැගෙනහිර, නුගේගොඩ, දෙවිනුවර වාව්ව, දෙවිනුවර වෙලේගොඩ (පුරාණ වැල්ල), ප්‍රදීපාගාර පෙදෙස (කිරළවැල්ල), ගන්දර බටහිර, ගන්දර නැගෙනහිර, ගන්දර දකුණ, ගන්දරාවත්ත දකුණ, කපුගම බටහිර, ගන්දර මධ්‍යම (නාඹරුන්න වැල්ල), කපුගම නැගෙනහිර, දෙල්ගල්ල, කපුගම උතුර, කපුගම මධ්‍යම, තලල්ල දකුණ, තලල්ල මධ්‍යම, තලල්ල නැගෙනහිර, තලල්ල, තලල්ල උතුර, නාඹටුන්න, නාඹටුන්න මධ්‍යම හා නාඹටුන්න දකුණ ධීවර ගම්මාන වෙයි.

ධීවර කර්මාන්තය මහා සම්මත රජුගේ කාලයේ පටන් පැවතෙන්නක් බවට දෙවිනුවර ධිවර ජනතාව අදහති. එසේම සිංහල රජදරුවන්ට මාලු සැපයීම කරන ලද්දේ දෙවිනුවර ගන්දර සහ කෝට්ටගොඩ යන ප්‍රදේශවලින් බව ධිවර ජනතාව තරයේ විශ්වාස කරති. ආදී කාලයේ සිට දෙවිනුවර ධීවර ජනතාව විවිධ **පන්න ක්‍රම** භාවිතා කරමින් මෙම කර්මාන්තයෙහි නියැලී සිටියහ. ඒ **පන්න ක්‍රම** අතර,

- බල පන්නය
- කිතුල් පිනි පන්නය
- පොළව පන්නය සහ
- මාදැල් පන්නය වෙයි.

වර්තමානයේ මෙන් එදා ධීවර කර්මාන්තයෙහි දියුණුවක් නොතිබූ බැවින් ධීවර කාර්මිකයා රැකියාව කළේ ඉතාමත් දුෂ්කරතා මධ්‍යයේ ය. වැස්සට තෙමෙමින් කර්කෂ වූ අව්වට වේලෙමින්,

මුහුදු සුළං, වැහි කෝඩ, අකුණු වලට මුහුණ දෙමින් ජීවිතය හා මරණය අතර වරෙක දෝලනය වෙමින් ඔවුන් මෙම රැකියාව කළෝ සිය අඹු දරුවන් පෝෂණය කරවීමටය.

දෙවිනුවර, ගන්දර, තලල්ල හා කෝට්ටෙගොඩ ආදී මුහුදු බඩ ප්‍රදේශවල ජීවත්වූ ධීවරයින් විවිධ පන්න ක්‍රම භාවිතා කරමින් මාලු ඇල්ලීම සිදු කළත් ආදී කාලයේ සිට පැවතුනු සමහරක් පාරම්පරික පන්න ක්‍රම වැඩිහිටි ධීවරයන්ගේ අභාවයත් සමඟ භාවිතයෙන් ගිලිහී ගොස් ඇත. වර්තමානයෙහි ජීවත්වන තරුණ ධීවර ප්‍රජාව බහුදින යාත්‍රා උපයෝගී කරගෙන නවීන ආම්පන්න යොදා ගනිමින් ධීවර කර්මාන්තයෙහි නියැලී සිටිති.

රුවල් ඔරු යුගය

අතීතයේ දෙවිනුවර ධීවරයා මාලු අල්ලීම සඳහා **රුවල් ඔරු** ක්‍රමය භාවිතා කර ඇත. සාමාන්‍යයෙන් රියන් 21 ක් දිගින් යුතු රුවල් ඔරු තනා ඇත්තේ මිදෙල්ල, කොහොඹ හෝ දොඹ ආදී දැව වර්ගයකිනි. ඔරුව නිර්මාණය කිරීමෙන් පසුව එහි සමබරථාවය රැක ගැනීම සඳහා ඔරුවට වඩා ප්‍රමාණයෙන් කුඩා **කොල්ලෑව** නමින් හැඳින්වෙන අංගයක් **ඔරුවට** සම්බන්ද කරයි. සාමාන්‍යයෙන් **කොල්ලෑව** සඳහාද එබඳු ලී වර්ගයක් යොදා ගනී.

කොල්ලෑව සහ **ඔරුව** සම්බන්ධ කිරීම සඳහා තරමක් වක්වූ ගසකින් කපා ගන්නා ලද ලී දෙකක් සාදා ගැනේ. බොහෝ දුරට ඒ සඳහා උපයෝගී කර ගනු ලබන්නේ කොහොඹ හෝ කොට්ටම්බ ආදී ගස් වර්ගයන්ය. ඒ වක් අත්ත හැඳින්වෙන්නේ **වියල** යන නමිනි. රුවල් ඔරු රාත්‍රී කාලයේ මෙන්ම දහවල් කාළයේදී **පෙන්න** කිරීමට මුහුදු යාම සඳහා උපයෝගී කර ගැනේ. **රුවල් ඔරුවේ** රුවල සැදීම සඳහා ගනු ලබන්නේ අමුරෙදිය.

මුහුදු යාමට ප්‍රථම ධීවරයන් විසින් වෙරළේ ගොඩ තිබෙන ඔරුව මුහුදට ගත යුතුය. ඒ සඳහා ධීවරයින් **ඔරුවේ වියල්** දෙකට, ඔරුවේ කෙළවරට නැමී පිට තබා ඔරුව මුහුද දෙසට තල්ලු කරනු ලැබේ. එසේ තල්ලු කිරීම සඳහා ධීවරයන් ගැම්ම ගැනීම සඳහා ඇතැම් පළාතක අම්බාවක් ගයනු ලැබේ. කණ්ඩායම් නායකයා **වාරුව** ගයන අතර පිරිස **අම්බාව** ගයයි.

නායකයා	**පිරිස**
වාරුව	**අම්බාව**
ඔන්න එකයි	
ඔන්න දෙකයි	
ඔන්න තුනයි	
හොහ්.....හෝ.....	ගියෝ
හොහ්.....හෝ.....	ගියෝ
හොහ්.....හෝ.....	ගියෝ
හොහ්.....හෝ.....	ගියෝ
හෝහ්.....හෝහ්.....	ගියෝ
හෝහ්.....හෝහ්.....	ගියෝ
හෝහ්.....හෝහ්.....	ගියෝ
හෝහ්.....හෝහ්.....	ගියෝ
හෝහ්.....හෝහ්.....	ගියෝ

හෝහ්.....හෝහ්..... ගියෝ

හෝහ්.....හෝහ්..... ගියෝ

රළ බිඳෙන ඉම පියමං වන තුරු **හබල්** ගාමින් **ඔරුව** දියත් කරනු ලැබේ. පසුව සුළං හමන දිසාව අනුව, **රුවල** මගින් **ඔරුව දියඹට** යාත්‍රා කරනු ලැබේ.

රුවල මඟින් **ඔරුවේ** ගමන් මාර්ගය වෙනස් කිරීම සඳහා ඔරුවේ දෙකෙළවර (**අවර** සහ **ඇනිය**) ලෑලි දෙකක් සවිකර ඇත.ඒවා හැඳින්වෙන්නේ **පලුලෑලි** නමිනි. මෙම **පලු ලෑලි** දෙක ලණු වලින් රුවලට සම්බන්ධ වී ඇත. **පලුලෑලි** දෙකෙන් එකක් ඉහළට එසවීමෙන් සවි කරන ලද **රුවල** මාර්ගයෙන් **ඔරුව දියඹටද** නැතිනම් ගොඩබිම දෙසටද යාමට හෝ ඒමට සැලැස්විය හැකිය.

බලඔරු

බලයන් ඇල්ලීම සඳහා යොදා ගන්නා ඔරුව **බලඔරු** නමින් හැඳින්වේ. සාමාන්‍යයෙන් බලඔරුවක වැඩ කිරීම අනික් **ඔරුවල** වැඩ කිරීමට වඩා ඉහළ තත්වයක් පවතින බව පිළිගැනීමක් වෙයි. සාමාන්‍යයෙන් **බලඔරුවක** දිග මීටර් 21 ක් පමණ වේ. මෙහි රැකියාවට යාමට හය දෙනෙකුවත් අවශ්‍යය.

බලඔරු සඳහා **ඇම්** මුහුදේදී අල්ලා ගැනේ. ඒ සඳහා වියලුනු පොල්කොළ මිටියක් ගෙන පත්තු කර **ඔරුවේ** සිට මුහුදු ජලය දෙසට අල්ලනු ලැබේ. පොල්කොළ මිටියේ ආලෝකය මුහුදට වැටීම නිසා **දැල්ලන්** ඔරුව දෙසට පීනාගෙන එයි. ඉන්පසුව අතංගුව දමා **දැල්ලන්** ඇල්ලීම කරති. ඒවා ඇම් වශයෙන් යොදා ගැනේ. ඊට අමතරව **ඉඟුරන්** නැමැති කුඩා මාළු වර්ගයද **ඇම්** වශයෙන් යොදා ගැනේ.

එසේ **ඇම්** වශයෙන් අල්ලා ගන්නා ලද මාළුන් නොමැරනසේ තබා ගැනීමට බටපොතු වලින් වියන ලද භාජනයකට දමනු ලැබේ. එය හැඳින්වෙන්නේ **පැහැ** යනුවෙනි. **පැහැ** තුළ සාමාන්‍ය මට්ටමින් වතුර තිබෙන අතර ඔරුවේ කෙළවරක **පැහැ** බැඳ ඇත.

සාමාන්‍යයෙන් මාළුන් ගැවසෙන ඉසව් ගැන ධිවරයින් අත්දැකීමෙන් දනිති. දහවල් කාලයේදී නම් ඒ සඳහා **කැට ළිහිණියා** උදව් වේ. **කැට ළිහිණියා** බහුලව ගැවසෙන්නේ මාළුන් සිටින ඉසව්වේය.

බලයන් සිටින ඉසව් දුටුවිට එක් අයෙකු විසින් **පැහැ** තුළ සිටින ඇමට ඇල්ලූ කුඩා මාළුන් බලයන් සිටින ස්ථානයට දමයි. කුඩා මාළුන් කෑමට බලයන් එක් රොක් වෙයි. තවත් දෙදෙනෙකු විසින් **දියපිති** දෙකකින් මුහුදු වතුර බලයන් සිටින ස්ථානයට විසිරෙන්නට දමයි. ඔරුවේ සිටින අනික් තිදෙනාගෙන් එක් අයෙකු ඔරුවේ මැදටත් අනික් දෙදෙනා ඔරුවේ දෙකෙළවරට ගොස් සිටගෙන, උණ පිතිවල අමුණන ලද බිලීකටු ආධාරයෙන් මාළු බෑම කරයි. මාළුන් දුරින් සිටින විට දිග පිත්තකින්ද ළඟින් සිටින විට කොට පිත්තකින්ද බෑම සිදු කරයි. මෙම ක්‍රියාවන් ඉතා කඩිසරව කළ යුතුය.

දිය පිති

උණ ගසක කොටසක් අඩි 05 ක් හෝ 06 ක් පමණ ගෙන දෙකට පලා ඇතුලේ තිබෙන ගැට ඉවත් කර අතට අල්ලා ගැනීමට පුලුවන් අයුරින් සාදා ගනු ලබයි.

රාත්‍රී කාලයේදී මුහුදු යනවිට ලාම්පුවක් හෝ ලැන්තෑරුමක් ගෙන යයි. එය හැඳින්වෙන්නේ **මුහුදු ලාම්පුව** යන නමිනි.

කිතුල් පිනි පන්නය

කිතුල් ගස්වල පිනි වලින් මෙය සාදා ගනු ලබයි. කිතුල් පිත්තේ කොළ ඉවත් කර දවසක් දෙකක් වේලෙන්නට හැර මසුන් මැරීම සඳහා පිති සකස් කර ගනී. කුඩා කිතුල් පිති වලින් **බෝල්ලන්** වැනි කුඩා මාළුන්ද, පරාටි වැනි මාළුන්ද ඇල්ලීම කරයි. පිත්තේ කෙළවර සාදා ගන්නා ලද ගනකම තංගුසක් (නූලක්) බැඳ එම තංගුසේ කෙළවර බිලී කටුවක් එල්ලා බැඳ ඇම ලෙස

මාළුන්ගේ කුඩා කුඩා කැබැල්ලක් බිලිකටුවේ අමුනා ගෙන වතුරට දැමීමෙන් මාළු අල්ලා ගැනීම කරනු ලැබේ.

පොලව පන්නය

මෙම පන්න ක්‍රමයෙන් මාළුන් ඇල්ලීමට යන ධීවරයින් සාදා ගත් බිලී කටු අමුණා මුහුදට බස්සවයි. එය බඹ 35" 25" 15 අතර පොලව දක්වා බස්සවති. අමුණන ලද බිලි කටුවලට **ගල් මාළුන්, පරාටි** වැනි මාළුන් අල්ලා ගැනීම කෙරේ.

මා දැල් පන්න ක්‍රමය

මෙම **මාදැල් පන්න** ක්‍රමයේදී **ඔරුවේ** දැල් පටවාගෙන මුහුදට ඔරුව දියත් කරයි. දැළ කෙළවරේ ඇති **මන්ද** (කොන) ගොඩ සිටින අයට අල්ලා ගැනීම සඳහා දෙයි. මෙම ඔරුවේ හය දෙනෙක් (06) පමණ යයි.

මා දැලේ යට තැනින් තැන සිමෙන්ති වලින් සාදන ලද ගල් අල්ලා ඇත. දැලේ උඩ කොටසේ **තාපි** බැඳ ඇත. ඔරුව පදින්නා මුහුදේ රවුමට ඔරුව පදවන අතර අනෙක් අය දැල වතුරට දමයි. සිමෙන්ති ගල් වල බර නිසා දැලේ යට කොටස මුහුදු පතුලට ගමන් කරයි. උඩ කොටසේ **තාපි (ඉපිලි)** බැඳ තිබෙන බැවින් උඩ කොටස පාවෙමින් තිබේ. ගොඩ සිටින දැලේ කෙළවර බැඳ ඇති (යොත) **මන්දෙහි** අදිනු ලැබේ. එවිට මුහුදේ මාළුන් දැල නිසා පිටතට යාමට නොහැකි වීමෙන් දැළ තුළ හිරවේ. **මන්ද** ඇදීමෙන් **ඔරුව** සමඟ **මඩියේ** හිරවී ඇති මාළුන් ගොඩට ගෙනෙනු ලැබේ.

මුහුදු යාමේ කාළ සීමාව අවුරුද්දේ කොටස් දෙකකට (02) බෙදා ඇත. එය **වාරකන්** කාලය සහ **හරාය** කාලය ලෙස හඳුන්වනු ලැබේ. අවුරුද්දේ මැයි සිට ඔක්තෝබර් දක්වා **වාරකන්** කාලයද නොවැම්බර් සිට අප්‍රේල් දක්වා **හරාය** කාලයද වශයෙන් වෙන් වී ඇත.

වාරකං කාලය තුළ මුහුද ඉතා ප්‍රචණ්ඩය. රළ ඉතා විශාලය. තදින් සුළඟ හමයි. මෙම **වාරකං** කාලය තුළ පැරණි ධීවරයන් මුහුදු යාමෙන් වැළකී සිටිති. නමුත් අද වන විට බහුදින යාත්‍රා කිරීම නිසා වාරකං කාලය තුළද ධීවර රැකියාව කරති. **වාරකං** කාලය තුළදී දෙවිනුවර ප්‍රදේශයේ ධීවරයින් මුහුද දරුණු නැති, සුළං කෝඩ අඩු **මඩකලපුව, ත්‍රිකුණාමලය** ආදී ප්‍රදේශ වලට යාමට පුරුදුව සිටියහ.

ධීවරයන් තමන්ගේ ඔරු මුහුදින් දියත් කර රැකියාව සඳහා මඩකලපුව, ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශ බලා පිටත්ව යාමේදී ධීවරයන් හම්බන්තොට, යාල, පින්න කුඩා ආදී තොටුපලවල් වල නතර වී ගිමන් හරිති. ඒ ගමනේදී ඔවුන්ගේ ගමනේ අත්දැකීම් ජන කවියට ද ඇතුලත් වී ඇත.

දෙවුන්දරින් කල්ලිදුවට[109]

පලමුව බුදුන් වැඳ අවසර ලබාගෙන
දෙවනුව දහම් සඟ යන ත්‍රිවිධ සරණින
තෙවනුව දෙවියන්ට පින් දී වර රැගෙන
බලමුව ගමන් ගැන පසු දින උදැසන

මසින් අප්‍රේල් විසිනව වෙනිද උදේ
ගොසින් ඔරු ළඟට කටයුතු කර නිබඳේ
ගොසින් කතරගම දෙවිදුට පඬුරු බැඳේ

[109] ඇම්.ඇම්.මැන්දිස් සිල්වා - මිදිගහ වත්ත -කෝට්ටගොඩ

යන්න පිටත් වුණි දුක් දී සිතට හදේ

ගොසින් ගොඩවාය තොටමුණ අල්ලන්ට
තදින් රළවේග විය එහි බැරි යන්ට
නමින් සොඳ ජාවොා මස් මරණා තැනට
සුළං වේගයෙන් ගියෙ හම්බන්තොටට

එදා අපි සැවොම ඉද එතැන එක්වෙලා
ගියා යන්ට ගන්දර ඔරු අපි දමලා
ආවා ගිනි වැදී මාමා ඇතුව බලා
කියා එව්වාය දැන් වේගය කියලා

වට පිට බල බලා ඉන්න කල මෙදිනේ
දොළහට විතර ආවයි බස් රියෙන් සැණේ
හනිකට ඔරු වරායට බාගෙන ගොසිණේ
විගහට රුවල ඇද ගමනට පිටත් වුණේ

ගියා යන්න අපි ඔරු තුන තනි වෙමින
කියා ගන්න බැරි වුණි දෙවිඳුට එදින
එදා වැහි සුළං වේගෙට අසුවෙමිණ
සොයා ගන්න බැරි වුණි අපිට තොටමුණ

බෙදලා පෙර ජාතියේ දන් නුදුන් නිසා
ගෙවලා විදිජානට වුනි අපට දුක් රැසා
කරලා ගොඩ ඉන්න බැරි අලි වලසු නිසා
පෙරළා අයිනෙ ඇන්කර දැමුවයි නොලසා

ඉඳලා සයුර මැද එළිවෙන තුරුව බලා
වැසිලා කුස ගින්න කවුරුත් සුසුම් ලලා
ඇදලා රුවල් ගියෙ ගන්දර ඔරු එකලා
බැඳලා දෙවියන්ට පඬුරුත් රුවල් කළා

රට රටවල අය ගොස් මස් මරන්නට
වට පිට වට කරන මාදැල් ඇද සොඳට
දුටු දුටු අයගේ සිත් පිනවන වරායට
අද සිට හෙට යමුව පොතුවිල පමාකොට

මාස් සුළඟ අසුවුණි එදිනම උදයේ
දාස් ගණන් හේරුත් ගැසුවයි තරයේ
ලාසි ගැසී ගන්දර ඔරු යන්ට ගියේ
කල්ලි දූව අල්ලන කොට අඳුරු වුණේ

මඩකලපුව, ත්‍රිකුණාමලය ආදී දුර බැහැර ප්‍රදේශ වලට යන ධීවරයින් නතර වීම සඳහා මඩු සාදා ගනිති. ඒවා හැඳින්වෙන්නේ වාඩි නමිනි. ඔවුන් කෑම උයාගෙන කන්නේත්, නිදා ගැනීම සිදු කරන්නේත් මෙම වාඩි වල ඉඳගෙනය. අතීතයේදී ඈත ප්‍රදේශ වල සිට මාස 06 ක් පමණ ධීවර රැකියාව කළ මොවුන් නැවතත් මාස 06 කට පසුව ගම් රට බලා පැමිණෙති. ඒ කාළය වන විට දකුණු පළාතේ **හරාය** කාලය උදාවී ඇත. මඩකලපුව සහ ත්‍රිකුණාමලය ප්‍රදේශ වලට **වාරකං** කාලය ආරම්භ වී ඇත.

බිලි කටු සෑදීම

ඈත අතීතයේදී ධීවර කාර්මිකයන් බිලිකටු වෙළඳ පලෙන් මිළදී ගැනීමට වඩා **පන්න** වලට (මාළු ඇල්ලීමට) සුදුසු බිලිකටු ඔවුන් විසින්ම සාදා ගෙන ඇත. දැල්ලන්ගෙන් ලබා ගන්නා **දැලිපොතු** දෙකට පලා අවශ්‍ය බිලි කටුවල හැඩය පොත්තේ සූරා සදා ගනු ලබයි. මෙය **දැලි පොතු** දෙකේම එක සමාන විය යුතුය. බිලි කටු අච්චු සෑදූ විට එම දැලි පොතු දෙක එක සමානව තබා තද කර බැඳ තබයි.

ඉන්පසුව දැලි පොත්තේ සාදා ගන්නා කුඩා සිදුරකින් උණු කර ගත් ඊයම් දියර වත් කරයි. ඉන් පැය ගණනකට පසු බඳින ලද නූල ඉවත් කර දැලි පොතු දෙක වෙන් කළ පසු බිලී කොකු ලබා ගත හැක.

දැනට මෙම බිලිකටු සෑදීම සහ **මාදැල් පන්න ක්‍රම** අභාවයට ගොස් ඇත. තාක්ෂණය දියුණු වීම නිසා බහුදින යාත්‍රා නවීන ක්‍රම සහ උපකරණ භාවිතා කර ගනිමින් මාළු ඇල්ලීම සිදු කර ගනු ලැබේ.[110]

මාදැල් සැහැල්ල

හේල හෙලෙයියෝ
හේල හෙලෙයියෝ
හෙලෙයියෝ වලි
හේල හෙලෙයි වලි

පාන්දරින් නැගිටලා
බත් හැලියට ලංවෙලා

[110] ලින්ටන් විජේසේකර - විජානී, කිරිපාරුව, දෙවිනුවර

යොතේ තැඹිලි ගා ගෙනේ
ඔරුව දියත් කර ගෙනේ

හේලෙයියා වලි
හේලෙයියෝ
හෙලෙයියෝ වලි
හෙලෙයියෝ

රතු හැට්ටා කාරියෝ
උස් කෝඩාකාරියෝ
හේල හෙලෙයියෝ
හේල හෙලෙයියෝ

හෙලෙයියෝ වලි
හෙලෙයියෝ
හෙලෙයියෝ වලි
හෙලෙයියෝ

හොයි හොයි හෝයියා
හොයි හොයි හෝයියා
හේලයියා වලි හේලයියෝ
හේලයියා වලි හේලයියෝ

හොයිය මලේ හෝයියා
හොයි ඇදපන් හෝයියා
ගොඩ ගන්නට හෝයියා
හෝයියා හෝයියා
හෝ හෝ හෝයියා

ජලි ජාලි ජලි ජාලි ජාලේ
අඩි ජල වලෙයි ඒවාලෙයි එලෝ
අඩි යෙලවලෙයි යෙවාලෙයි යේලෝ

හයිකර දැල්කර
ඒලම්මා ඒලවලේ එලවයියා ඒලවලේ
ඒලවාල වල ඒලවාල වල
ඒලයියා එලාඩෝ ඒලවයා ඒලාඩෝ

ඩක්කුව තල්ලුව
හයිකර දැල්කර
අඩ් ඒලවලෙයි ඒවාලෙයි යේලෝ

ජල ජාලි ජලි ජාල ජාලෝ
හෝයියා හෝයියා ජල ජාලි හෝයියා
හොයියා හෝයියා හොයියා හෝයියා[111]

111 ඇම්.ඇම්.අප්පු සිංඤෝ - නිල්වැල්ල - දික්වැල්ල